ශ්‍රී ලංකා රේගුව

# වාර්ෂික

# කාර්ය සාධන

# වාර්තාව

# 2013

සැකසුම

**ප්‍රතිපත්ති, සැළසුම් හා පර්යේෂණ අංශය**

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
## පටුන


| | |
|---|---|
| ප්‍රධාන නිලධාරීන් | 4 |
| සමස්ථ කාර්ය සාධනය 2013 | 7 |
| වයාපෘති 1 | |
| *නීති බලාත්මක කිරීමේ පර්ෂදය* | *22* |
| නිවාරණ අංශය | 23 |
| සමාජ ආරක්ෂණ අංශය | 27 |
| පශ්චාත් නිශ්කාශන හා විගණන අංශය | 39 |
| මධ්‍යම විමර්ශන අංශය | 45 |
| නීති කටයුතු අංශය | 50 |
| මධ්‍යම බුද්ධි තොරතුරු අංශය | 52 |
| *ආදායම් හා සේවා පර්ෂදය* | *56* |
| ප්‍රකාශන අංශය | 57 |
| කර්මාන්ත හා සේවා අංශය | 63 |
| භාණ්ඩ පරීක්ෂණ අංශය | 68 |
| මගී සේවා - කොළඹ අංශය | 73 |
| අපනයන අංශය | 75 |
| මගී සේවා - කටුනායක අංශය | 79 |
| ආදායම් හා සේවා - කටුනායක | 83 |
| *සහාය සේවා පර්ෂදය* | *86* |
| ප්‍රතිපත්ති, සැළසුම් හා පර්යේෂණ අංශය | 88 |
| සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ අංශය | 95 |
| මධ්‍යම මිල පිරික්සුම් අංශය | 96 |
| විශේෂ සේවා අංශය | 97 |
| සැපයුම් හා සේවා අංශය | 100 |
| *මානව සම්පත් පර්ෂදය* | *102* |
| මානව සම්පත් කළමනාකරණ අංශය | 104 |
| මානව සම්පත් සංවර්ධන අංශය | 108 |
| සේවක සේවා අංශය | 112 |
| *ප්‍රාදේශීය පර්ෂදය* | *114* |
| ආදායම් හා සේවා ප්‍රාදේශීය | 115 |
| *රේගු අධ්‍යක්ෂ ජනරාල් යටතේ ඇති අංශ* | *117* |
| පද්ධති, ක්‍රියාපටිපාටි, අනුකූලතා විගණන අංශය | 119 |
| මූල්‍ය අංශය | 123 |
| විශේෂ කාර්ය හා සුපරීක්ෂණ අංශය | 129 |
| *වයාපෘති II* | |
| නිෂ්පාදන බදු (විශේෂ විධි විධාන) අංශය | 131 |

# ශ්‍රී ලංකා රේගුව
# 2013
# ප්‍රධාන නිලධාරීන්

**ජගත් පී. විජේවීර මහතා**
රේගු අධ්‍යක්ෂ ජනරාල්
**ඒ සේනානායක මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (මානව සම්පත්)
**එස්. රාජේන්ද්‍රන් මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (සහාය සේවා)
**කේ.එල්.ජී.ටී. පෙරේරා මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රාදේශීය)
**එම්. පුවිහරන් මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (ආදායම් හා සේවා)
**එන්.කේ. ශිවකුමාර් මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (නීති බලාත්මක කිරීම)
**කේ.ඒ.ඩී.ආර් ක්‍රිස්ටි මහතා**
රේගුඅධ්‍යක්ෂ (නිවාරණ)
**එම්. පාස්කරන් මහතා**
රේගු අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ)
**පී.එච්. ලියනගේ මහතා**
රේගු අධ්‍යක්ෂ (පශ්චාත් නිශ්කාශන විගණන)
**කේ.ඒ. ධර්මසේන මහතා**
රේගු අධ්‍යක්ෂ (මධ්‍යම විමර්ශන)
**ජී.ඒ.එල්. ගාමිණී මහතා**
රේගු අධ්‍යක්ෂ (නීති කටයුතු)
**යූ. ලියනගේ මහතා**
රේගු අධ්‍යක්ෂ (මධ්‍යම බුද්ධි තොරතුරු)
**කේ. ප්‍රේමනාත් මහතා**
රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන)
**ටී.ඩබ්.ඒ. සේනානායක මහතා**
රේගු අධ්‍යක්ෂ (කර්මාන්ත හා සේවා)
**ඩී.ඒ.අයි. දරණගම මහතා**
රේගු අධ්‍යක්ෂ (භාණ්ඩ පරීක්ෂණ)
**එස්. ශිවකුමාර් මහතා**
රේගු අධ්‍යක්ෂ (මගී සේවා -කොළඹ)
**ඩී. සිරිබද්ධන මහතා**
රේගු අධ්‍යක්ෂ (මගී සේවා -කටුනායක)
**බී.ඒ.කේ.ඩබ්. මහේන්ද්‍ර මහතා**
රේගු අධ්‍යක්ෂ (ආදායම් හා සේවා)
**ආර්.පී.ඩී.ටී. සෙනෙවිරත්න මහතා**
රේගු අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති, සැළසුම් හා පර්යේෂණ)
**එස්. නෙත්කුනනාදන් මහතා**
රේගු අධ්‍යක්ෂ (සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ)
**එම්.යූ.එස්. පෙරේරා මහතා**
රේගු අධ්‍යක්ෂ (මධ්‍යම මිල පිරික්සුම්)
**ඒ. කුලේන්ද්‍රන් මහතා**
රේගු අධ්‍යක්ෂ (විශේෂ සේවා)
**එස්. ගුණවර්ධන මහතා**

රේගු අධ්‍යක්ෂ (සැපයුම් හා සේවා අංශය)

**ඩී.එච්.එස්. පුල්ලෙපෙරුම මිය**

රේගු අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ)

**ඩී.එල්.යූ. පීරිස් මිය**

රේගු අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)

**එම්.එස්. රම්‍යකාන්ති මෙය**

රේගු අධ්‍යක්ෂ (සේවක සේවා)

**කේ.ඩී. නිකලස් මයා**

රේගු අධ්‍යක්ෂ (විශේෂ කාර්ය හා සුපරීක්ෂණ)

**පී.ටී.ජී. ගුණතිලක මයා**

ප්‍රධාන ගණකාධිකාරී

**ජගත් ඩයස් මහතා**

රේගු අධ්‍යක්ෂ (ආදායම් හා සේවා - ප්‍රාදේශීය)

**කේ.කේ. බාලචන්ද්‍ර මහතා**

රේගු අධ්‍යක්ෂ (කර්මාන්ත හා සේවා - ප්‍රාදේශීය)


**දන්තනාරායන මහතා**

රේගු අධ්‍යක්ෂ (මගී සේවා - ප්‍රාදේශීය)

# සමස්ථ කාර්ය සාධනය
# 2013

ආදායම් එකතුව - **2013**


**ජාතික බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස***




* *තාවකාලික දත්ත*

## ආදායම රැස් කිරීම – 2013: බදු සංයුතිය

| කාණ්ඩය | (රු.මිලි.) | මුලු ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| එකතු කළ අගය මත බද්ද - ආනයන | 96,591 | 20 |
| රේගු ආනයන බද්ද | 74,766 | 15 |
| ආනයන සෙස් බද්ද | 33,011 | 7 |
| වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද | 64739.29 | 13 |
| නිෂ්පාදන බද්ද | **143,606** | 30 |
| විශේෂ භාණ්ඩ බද්ද | 46,705 | 10 |
| ජාතිය ගොඩ නැගීමේ බද්ද | 22,443 | 5 |
| අනෙකුත් | 4.47 | 0 |
| එකතුව | 481,866 | |



## ශ්‍රී ලංකා රේගුව - ආදායම් එකතුව - 2013

| විස්තරය | | සංශෝධිත ඉලක්කය 2013 | ප්‍රගතිය දෙසැම්බර් දක්වා. | | | සංසංදනය 2012 සහ 2013 දෙසැම්බර් දක්වා | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| අදායම් කේතය | | | ඉලක්කය | සත්‍ය | අපගමනය | 2012 | 2013 | අපගමනය | % |
| 1001.01.00 | රේගු ආනයන බද්ද | 82,591 | 82,591 | 74,766 | (7,825) | 73,489 | 74,766 | 1,277 | *2* |
| 1001.02.00 | රේගු ආනයන බද්ද | 20 | 20 | 22 | 2 | 21 | 22 | 1 | *4* |
| 1001.04.00 | වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද | 61,004 | 61,004 | 61,516 | 512 | 70,111 | 61,516 | (8,595) | *(12)* |
| 1001.05.01 | ආනයන සෙස් බදු | 37,362 | 37,362 | 33,011 | (4,351) | 29,604 | 33,011 | 3,407 | *12* |
| 1001.06.00 | මෝටර් වාහන සහන බද්ද | - | - | - | - | - | - | - | - |
| 1001.07.00 | ප්‍රාදේශීය යටිතල සංවර්ධන බද්ද (ආර්අයිඩීඑල්) | - | - | 1.346 | 1 | 7 | 1 | (5) | *(80)* |
| 1001.05.02 | අපනයන සෙස් බද්ද | 3,120 | 3,120 | 3,087 | (33) | 3,136 | 3,087 | (49) | *(2)* |
| 1001.08.00 | විශේෂ භාණ්ඩ බද්ද | 50,106 | 50,106 | 46,705 | (3,401) | 33,666 | 46,705 | 13,039 | *39* |
| | **මුළු රේගු බදු ආදායම** | **234,203** | **234,203** | **219,108** | **(15,095)** | **210,033** | **219,108** | **9,075** | *4* |
| 1002.05.01 | නිෂ්පාදන බද්ද - සිගරට් | 58,222 | 58,222 | 58,534 | 312 | 53,529 | 58,534 | 5,006 | *9* |
| 1002.05.02 | නිෂ්පාදන බද්ද - මත්පැන් | - | - | 0.08 | 0 | 39 | 0 | (39) | - |
| 1002.05.03 | **නිෂ්පාදන බද්ද - පෙට්‍රෝලියම්** | **35,849** | **35,849** | **27,131** | **(8,719)** | **28,466** | 27,131 | **(1,336)** | *(5)* |
| | ***නිෂ්පාදන බද්ද - පෙට්‍රෝලියම් ( ආනයන)*** | *32,753* | *32,753* | *27,131* | ***(5,623)*** | *27,837* | 27,131 | **(707)** | *(3)* |
| | ***නිෂ්පාදන බද්ද - පෙට්‍රෝලියම් ( දේශීය)*** | *3,096* | *3,096* | | ***(3,096)*** | *629* | - | **(629)** | - |
| 1002.05.04 | නිෂ්පාදන බද්ද - මෝටර් රථවාහන | 71,906 | 71,906 | 55,517 | (16,389) | 46,496 | 55,517 | 9,021 | *19* |
| 1002.05.09 | ***නිෂ්පාදන බද්ද - නෙකුත්*** | **5,347** | **5,347** | **2,424** | **(2,924)** | **3,336** | 2,424 | **(912)** | *(27)* |
| | නිෂ්පාදන බද්ද - අනෙකුත් - ආනයන | *1,477* | *1,477* | *1,144* | ***(333)*** | 2,533 | 1,144 | **(1,389)** | *(55)* |
| | *නිෂ්පාදන බද්ද - අනෙකුත් - දේශීය* | *3,870* | *3,870* | *1,279* | ***(2,591)*** | 803 | 1,279 | **477** | - |
| | **මුළු නිෂ්පාදන බද්ද ආදායම** | **171,324** | **171,325** | **143,606** | **(27,719)** | **131,866** | **143,606** | **11,740** | *9* |
| 1002.01.04 | එකතු කළ අගය මත බද්ද - ආනයන | 123,888 | 123,888 | 96,591 | (27,297) | 99,469 | 96,591 | (2,878) | *(3)* |
| 1003.10.00 | **සමාජ වගකීම් බද්ද (එස්ආර්එල්)** | **-** | **-** | **0** | **0** | **1** | 0 | **(1)** | *(82)* |
| | *සමාජ වගකීම් බද්ද - ආනයන* | - | | *0* | ***0*** | 1 | 0 | **(1)** | *(82)* |
| | *සමාජ වගකීම් බද්ද - දේශීය* | - | - | - | - | - | - | - | - |
| 1002.12.03 | ජාතිය ගොඩනැගීමේ බද්ද | *19,721* | *19,721* | *22,443* | ***2,722*** | 15,667 | 22,443 | **6,776** | *0* |
| | **මුළු අනෙකුත් බදු ආදායම** | **143,609** | **143,609** | **119,035** | **(24,574)** | **115,138** | **119,035** | **3,897** | *3* |
| | **මුළු බදු ආදායම** | **549,136** | **549,136** | **481,748** | **(67,388)** | **457,037** | **481,748** | **24,712** | *5* |
| 2003.02.17 | ඇහලුම් අලෙවිය | 95 | 95 | 91.5 | (3) | 105 | 92 | (13) | *(13)* |
| 2003.02.99 | | | | | | | - | - | - |
| 2003.99.00 | විවිධ | 859 | 859 | 2,142 | 1,283 | 5,042 | 2,142 | | - |
| 2003.03.00 | | | | | | | | | |
| | **මුළු බද්ද නොවන ආදායම** | **954** | **954** | **2,234** | **(3)** | **5,147** | 2,234 | **(13)** | *(0)* |
| | **මුළු ආදායම ( බදු සහ බදු නොවන)** | **550,090** | **550,090** | **483,982** | **(67,391)** | **462,184** | **483,982** | **24,698** | *5* |
| | ශුද්ධ තැන්පත් | | | 1,231 | 1,231 | 1,774 | 1,231 | (543) | - |
| | **තැන්පත් සමඟ මුළු ආදායම** | **550,090** | **550,090** | **485,213** | **(66,161)** | **463,958** | **485,213** | **21,255** | *5* |
| | | ලෙජරය ණය | | | | 4,767 | 16,709 | | |
| | | ගිණුම් ගත කලමුත් මුදල් නොලද | | | | (42) | (12) | | |
| | | **ඒකතු වූ මුදල් ප්‍රමාණය** | | | | **459,233** | **468,492** | | |

*අනුමාන දත්ත


* දත්ත ලබාගැනීම – ගිණුම් අංශය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

## ඉහළ බදු ආදායම් උපදවන භාණ්ඩ වර්ග (HS ඡේද අනුව)

| Rank | HS ඡේද | විස්තරය | මුළු ආදායම |
|---|---|---|---|
| 1 | 87 | වාහන | 88,909,340,890 |
| 2 | 27 | ඛණිජ තෙල් හා ඉන්ධන | 76,774,999,341 |
| 3 | 25 | සිමෙන්ති හා ක්ලින්කර් | 19,567,106,125 |
| 4 | 84 | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 17,937,661,754 |
| 5 | 15 | පාම් තෙල්, පාම් ස්ටියරින් සහ මාගරීන් | 16,745,388,060 |
| 6 | 39 | ප්ලාස්ටික් වර්ග හා ඒවායින් සැකසූ නිෂ්පාදන | 14,229,738,324 |
| 7 | 17 | සීනි සහ රසකැවිලි | 12,509,377,567 |
| 8 | 4 | පශු නිෂ්පාදන | 11,346,042,635 |
| 9 | 85 | විද්‍යුත් යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 11,189,856,035 |
| 10 | 7 | කෑමට ගන්නා එළවළු හා අල | 11,159,580,840 |
| 11 | 10 | ධාන්‍ය | 10,061,862,006 |
| 12 | 48 | කඩදාසි සහ කඩදාසි බෝඩ් | 8,381,274,991 |
| 13 | 72 | යකඩ හා වානේ | 8,182,058,190 |
| 14 | 22 | පාන වර්ග | 7,789,696,291 |
| 15 | 69 | පිඟන්මැටි නිෂ්පාදන | 7,077,415,002 |
| 16 | 73 | යකඩ සහ වානේ වලින් නිමකල භාණ්ඩ | 6,960,450,154 |
| 17 | 40 | රබර් සහ ඒවායින් නිමකල භාණ්ඩ | 6,873,678,991 |
| 18 | 38 | විවිධ රසායනික නිෂ්පාදන | 4,813,522,887 |
| 19 | 33 | සුගන්ධ තෙල් හා රෙසිනොයිඩ් වර්ග | 3,739,644,250 |
| 20 | 8 | කෑමට ගන්නා පළතුරු හා ඇට වර්ග | 3,321,985,551 |
| 21 | 62 | නොගෙතූ හෝ ක්‍රෝෂේ නොගෙතූ ඇඟලුම් හා රෙදිපිළි උපාංග | 3,318,596,630 |
| 22 | 19 | පිළියෙළ කල ධාන්‍ය පිටි | 3,266,662,100 |
| 23 | 9 | කෝපි, තේ, මේඩ් හා කුළුබඩු වර්ග | 3,231,436,590 |
| 24 | 32 | සම් පදම් කිරීමට සහ සායම් පෙවීමට ගන්නා සාරක | 2,673,713,485 |
| 25 | 94 | ගෘහ භාණ්ඩ | 2,409,327,799 |
| 26 | 29 | කාබනික රසායන ද්‍රව්‍ය | 2,305,323,184 |
| 27 | 70 | වීදුරු හා වීදුරු භාණ්ඩ | 2,299,963,739 |
| 28 | 76 | ඇලුමිනියම්  හා ඒවායින් සෑදූ භාණ්ඩ | 2,247,774,118 |
| 29 | 23 | ආහාර නිෂ්පාදනයේදී ඉවත දමන ලද හා අවශේෂයන් | 2,162,432,546 |
| 30 | 16 | මස් වලින්, මාළු වලින් හා කවචයින්ගෙන් කරනු ලබන පිළියෙළ කිරීම. | 2,161,237,419 |
| 31 | 55 | කෘතිම මූලික කෙඳි වර්ග | 2,130,794,106 |
| 32 | 3 | මත්ස්‍යයන් හා කවචයන් | 2,090,322,399 |
| 33 | 83 | ලෝහ වලින් නිමවූ විවිධ භාණ්ඩ | 2,057,942,609 |
| 34 | 21 | කෑමට යෝග්‍ය සංයෝජන | 1,995,885,338 |
| 35 | 52 | කපු | 1,886,616,662 |
| 36 | 20 | එළවළු, පළතුරු, බීජ වලින් කල පිළියෙල කිරීම් | 1,698,387,293 |
| 37 | 96 | විවිධ නිෂ්පාදන ද්‍රව්‍ය | 1,628,393,356 |
| 38 | 28 | අකාබනික රසායන ද්‍රව්‍ය | 1,577,559,760 |
| 39 | 34 | සබන්, කාබනික පෘෂ්ඨ කාරක වර්ග | 1,554,077,021 |
| 40 | 31 | පොහොර | 1,546,648,679 |
| 41 | 74 | තඹ හා එයින් සෑදූ භාණ්ඩ | 1,536,341,131 |
| 42 | 44 | දැව හා දැවයෙන් නිමකල භාණ්ඩ | 1,479,636,534 |
| 43 | 68 | ගලින්, බදාමෙන්, සිමෙන්තිවලින් නිමවූ ද්‍රව්‍ය | 1,357,840,376 |
| 44 | 90 | ඡායාරූපකරණ හා සිනමාකරනයේදී ගන්නා කාරක ද්‍රව්‍ය | 1,253,509,939 |
| 45 | 64 | පාවහන් | 1,227,603,542 |
| 46 | 82 | ආයුධ හැඳි ගෑරුප්පු  ආදිය | 1,143,768,011 |
| 47 | 61 | ගෙතූ හෝ ක්‍රෝෂේ නොගෙතූ ඇඟලුම් හා රෙදි පිළි උපාංග | 1,048,008,283 |
| 48 | 11 | විදුම් කර්මාන්ත නිෂ්පාදන | 913,371,753 |
| 49 | 60 | ගෙතූ හෝ ක්‍රෝෂේ නොගෙතූ රෙදි | 827,109,788 |
| 50 | 14 | උන, කපු ලින්ටර්ස්, | 823,838,762 |

## සැලකිය යුතු ආදායම් උපයන භාණ්ඩ අවරෝහණ පිළිවෙලට 2013

| විස්තරය | මුළු ආදායම | මුළු ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|
| මෝටර් වාහන | 88,909,340,890 | 19 |
| ඛනිජ තෙල් හා ඉන්ධන | 76,774,999,341 | 17 |
| සිමෙන්ති හා සිමෙන්ති ක්ලින්කර් | 19,567,106,125 | 4 |
| යන්ත්‍රෝපකරණ | 17,937,661,754 | 4 |
| පාම් ඔයිල් , Palm Stearin සහ මාගරින් | 16,745,388,060 | 3 |
| ප්ලාස්ටික් හා ආශ්‍රිත භාණ්ඩ | 14,229,738,324 | 3 |
| සීනි සහ රස කැවිලි | 12,509,377,567 | 2 |
| කිරි නිෂ්පාදන | 11,346,042,635 | 2 |
| විදුලි යන්ත්‍රෝපකරණ | 11,189,856,035 | 2 |
| ආහාරයට ගන්නා එළවළු හා අල | 11,159,580,840 | 2 |
| අනෙකුත් | 165,362,291,913 | 37 |




# බදු ආදායම් සංසන්දනය - 2012 සහ 2013

(රු. මිලියන )

| කාණ්ඩය | 2012 | 2013 | වෙනස |
|---|---|---|---|
| ආනයන බද්ද | 73,488.80 | 74,765.96 | 1,277.16 |
| අපනයන බද්ද | 20.863 | 21.658164 | 0.795164 |
| වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද | 70,110.73 | 61,516.09 | -8,594.63 |
| සෙස් බද්ද - ආනයන | 29,603.82 | 33,010.93 | 3,407.11 |
| මෝටර් වාහන **Concessionary** බද්ද | 0 | 0 | 0 |
| ප්‍රාදේශීය යටිතල සංවර්ධන බද්ද **(RIDL)** | 6.80 | 1.35 | -5.456 |
| ආනයන සෙස් බදු | 3,136.46 | 3,087.14 | -49.32 |
| විශේෂ භාණ්ඩ බද්ද | 33,665.84 | 46,704.89 | 13,039.05 |
| මුළු රේගු ආදායම | 210033.303 | 219108.0189 | 9074.715932 |
| නිෂ්පාදන බදු - සිගරට් | 53,528.69 | 58,534.24 | 5,005.55 |
| නිෂ්පාදන බදු - මත්පැන් | 39.0804 | 0.0752 | -39.0052 |
| නිෂ්පාදන බදු - පෙට්‍රෝලියම් | 28,466.07 | 27,130.55 | -1,335.52 |
| නිෂ්පාදන බදු - පෙට්‍රෝලියම් (ආනයන) | 27,837.50 | 27,130.55 | -706.95 |
| නිෂ්පාදන බදු - පෙට්‍රෝලියම් (දේශීය) | 628.58 | 0.00 | -628.58 |
| | | | |
| නිෂ්පාදන බදු - මෝටර් වාහන | 46,495.74 | 55,517.12 | 9,021.39 |
| නිෂ්පාදන බදු - වෙනත් | 3,336.09 | 2,423.83 | -912.26 |
| නිෂ්පාදන බදු- වෙනත් ආනයන | 2,533.48 | 1,144.39 | -1,389.09 |
| නිෂ්පාදන බදු - වෙනත් - දේශීය | 802.61 | 1,279.44 | 476.83 |
| මුළු නිෂ්පාදන බදු ආදායම | 131,865.67 | 143,605.82 | 11,740.15 |
| එකතු කල අගය මත බද්ද (වැට්) ආනයන | 99,469.33 | 96,590.88 | -2,878.45 |
| සමාජ වගකීම් බද්ද ( එස්ආර්එල්) | 1.29 | 0.23 | -1.06 |
| සමාජ වගකීම් බද්ද ( එස්ආර්එල්) - ආනයන | 1.29 | 0.23 | -1.06 |
| සමාජ වගකීම් බද්ද ( එස්ආර්එල්) - දේශීය | 0.00 | 0.00 | 0.00 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 15,667.26 | 22,443.44 | 6,776.17 |
| මුළු වෙනත් ආදායම් බද්ද | 115,137.89 | 119,034.54 | 3,896.66 |
| මුළු ආදායම් බද්ද | 457,036.86 | 481,748.38 | 24,711.52 |
| ඇහලුම් විකිණීම | 104.69 | 91.51 | -13.17 |
| | | 0.00 | 0.00 |
| විවිධ | 5,042.17 | 2,142.35 | |
| | | | |
| මුළු බදු නොවන ආදායම | 5,146.86 | 2,233.87 | -13.17 |
| මුළු ආදායම ( බදු හා බදු නොවන) | 462183.7168 | 483982.247 | 24698.34687 |
| ශුද්ධ තැන්පත් | 1,774.00 | 1,230.52 | -543.49 |
| තැන්පතු ද සමග සමස්ථ ආදායම | **463957.7168** | **485212.762** | **21255.045** |


# බදු ආදායම් සංසන්දනය - 2012 සහ 2013




## වාර්ෂික හා මාසික බදු ආදායම් සංසන්දනය - අවුරුදු සහ මාස

(රුපියල් මිලියන)


| මාස | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 24,709 | 17,582 | 20,973 | 33,334 | 36,759 | 39,161 |
| පෙබරවාරි | 25,198 | 16,886 | 27,635 | 29,384 | 32,071 | 31,490 |
| මාර්තු | 27,701 | 31,520 | 28,276 | 38,853 | 45,402 | 41,938 |
| අප්‍රේල් | 23,732 | 19,401 | 25,968 | 33,264 | 40,701 | 39,133 |
| මැයි | 25,433 | 18,666 | 26,127 | 36,451 | 43,343 | 38,875 |
| ජූනි | 22,370 | 21,856 | 26,949 | 36,743 | 46,809 | 36,363 |
| ජූලි | 24,279 | 23,788 | 35,494 | 37,725 | 32,940 | 46,159 |
| අගෝස්තු | 24,080 | 23,964 | 34,429 | 38,763 | 33,310 | 37,737 |
| සැප්තැම්බර් | 23,714 | 57,971 | 34,620 | 40,482 | 33,643 | 36,258 |
| ඔක්තෝබර් | 23,327 | 22,424 | 38,703 | 37,156 | 33,890 | 42,603 |
| නොවැම්බර් | 30,923 | 26,380 | 40,527 | 40,537 | 33,073 | 41,169 |
| දෙසැම්බර් | 39,772 | 38,545 | 41,201 | 57,650 | 31,916 | 65,227 |
| එකතුව | **315,236** | **318,982** | **380,903** | **460,343** | **443,858** | **498,126** |




## මෝටර් වාහන ආනයනය
## (ආනයනික ඒකක)

| | ඒකක | | |
|---|---|---|---|
| | **2011** | **2012** | **2013** |
| ජනවාරි | 34,883 | 50,311 | 31,973 |
| පෙබරවාරි | 34,985 | 38,477 | 19,372 |
| මාර්තු | 37,126 | 53,228 | 22,667 |
| අප්‍රේල් | 41,712 | 33,767 | 47,239 |
| මැයි | 47,794 | 31,080 | 34,541 |
| ජුනි | 44,178 | 19,862 | 28,484 |
| ජුලි | 54,851 | 17,519 | 32,489 |
| අගෝස්තු | 45,842 | 19,800 | 31,879 |
| සැප්තැම්බර් | 52,843 | 33,313 | 28,674 |
| ඔක්තෝබර් | 49,480 | 43,758 | 29,577 |
| නොවැම්බර් | 35,192 | 25,505 | 22,174 |
| දෙසැම්බර් | 47,022 | 26,668 | 31,974 |
| එකතුව | 525,908 | 393,288 | 363,056 |



## CIF මිළ


| | CIF (රුපි.) | | |
|---|---|---|---|
| | 2011 | 2012 | 2013 |
| ජනවාරි | 14,523,722,878 | 21,256,336,140 | 13,918,084,078 |
| පෙබරවාරි | 12,373,845,242 | 16,954,170,840 | 16,954,170,840 |
| මාර්තු | 16,554,923,978 | 24,426,409,258 | 24,426,409,258 |
| අප්‍රේල් | 14,428,851,903 | 16,083,149,987 | 16,083,149,987 |
| මැයි | 16,615,696,882 | 15,659,343,418 | 15,659,343,418 |
| ජූනි | 15,565,149,707 | 10,556,027,168 | 10,556,027,168 |
| ජූලි | 18,429,774,777 | 10,720,764,216 | 10,720,764,216 |
| අගෝස්තු | 17,907,567,940 | 10,329,151,341 | 10,329,151,341 |
| සැප්තැම්බර් | 19,059,350,081 | 8,438,231,519 | 8,438,231,519 |
| ඔක්තෝබර් | 18,640,067,761 | 7,275,261,435 | 7,275,261,435 |
| නොවැම්බර් | 15,474,611,733 | 8,406,879,450 | 8,406,879,450 |
| දෙසැම්බර් | 16,909,220,753 | 7,179,033,205 | 7,179,033,205 |
| එකතුව | 196,482,783,635 | 157,284,757,977 | 149,946,507,928 |



මෝටර් රථ වාහන ආනයන තොරතුරු

**බදු ආදායම**


| | ආදායම (රු.) | | |
|---|---|---|---|
| | **2011** | **2012** | **2013** |
| ජනවාරි | 9,725,110,365 | 11,109,844,511 | 6,110,180,354 |
| පෙබරවාරි | 8,069,640,783 | 8,233,046,108 | 3,900,074,807 |
| මාර්තු | 10,464,242,348 | 13,911,906,605 | 5,777,845,610 |
| අප්‍රේල් | 8,868,923,698 | 11,783,621,944 | 6,648,146,874 |
| මැයි | 11,783,367,142 | 12,364,583,772 | 6,821,280,690 |
| ජූනි | 10,444,041,904 | 5,354,183,367 | 6,984,718,534 |
| ජූලි | 11,506,136,845 | 5,455,760,513 | 9,299,717,685 |
| අගෝස්තු | 11,578,660,244 | 5,918,646,790 | 9,301,914,023 |
| සැප්තැම්බර් | 12,229,833,942 | 5,413,904,828 | 7,463,853,161 |
| ඔක්තෝබර් | 11,398,540,101 | 4,922,883,651 | 8,433,628,709 |
| නොවැම්බර් | 10,424,804,707 | 4,996,455,008 | 7,028,786,552 |
| දෙසැම්බර් | 11,923,432,615 | 5,008,196,732 | 6,514,730,458 |
| එකතුව | **128,416,734,694** | **94,473,033,829** | **84,284,879,470** |



මෝටර් රථ වාහන ආනයන තොරතුරු

**වාහන සඳහා අතහැර දැමූ රේගු බදු වටිනාකම**

| මාස | CIF මිළ | රේගු බදු ආදායම |
|---|---|---|
| ජනවාරි | 507,362,381 | 127,473,589 |
| පෙබරවාරි | 991,789,485 | 253,103,878 |
| මාර්තු | 1,929,609,076 | 553,357,122 |
| අප්‍රේල් | 2,330,898,248 | 686,453,871 |
| මැයි | 2,635,223,342 | 794,043,230 |
| ජූනි | 3,540,353,743 | 1,002,225,223 |
| ජූලි | 4,368,038,163 | 1,223,655,314 |
| අගෝස්තු | 4,353,321,184 | 1,207,758,653 |
| සැප්තැම්බර් | 3,037,955,431 | 871,273,235 |
| ඔක්තෝබර් | 2,505,415,842 | 733,615,917 |
| නොවැම්බර් | 3,329,255,371 | 920,967,851 |
| දෙසැම්බර් | 1,983,618,624 | 485,394,324 |




### විශේෂ ව්‍යාපෘති සඳහා අතහැර දැමූ තීරුබදු

| ව්‍යාපෘති | වටිනාකම | අතහැර දැමූ බදු (රු) |
|---|---|---|
| කොළඹ කටුනායක සීඝ්‍රගාමී අධිවේගී මාර්ග | 510,494,519 | 59,837,212 |
| අනෙකුත් මාර්ග සංවර්ධන ව්‍යාපෘති | 3,744,061,743 | 8,671,006,188 |
| වරාය සංවර්ධන ව්‍යාපෘතිය - හම්බන්තොට | 4,576,384,534 | 557,913,794 |
| මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘතිය | 447,581,701 | 40,412,262 |
| නෙළුම් කුළුණ ව්‍යාපෘතිය | 1,015,914,956 | 151,472,902 |
| උමාඔය විවිධ සේවා සංවර්ධන ව්‍යාපෘතිය | 8,965,080,664 | 272,235,015 |
| එකතුව | **14,683,133,584** | **9,194,963,579** |

### වරණීය වෙළඳ ගිවිසුම් යටතේ ආනයන - **2013** වර්ෂය

| වෙළඳ ගිවිසුම | රේගු සටහන්කර | ශුද්ධ බර ( කි.ග්.) | ඒකක | මිළ (රු.) | මුළු බර ප්‍රමාණය (රු) |
|---|---|---|---|---|---|
| **APTA** | 347 | 7,243,988 | 6,269,828 | 1,582,842,300 | 520,981,813 |
| **GSTP** | 45 | 2,200,069 | 2,882 | 1,816,889,457 | 3,577,441,007 |
| **ISFTA** | 9,962 | 1,399,411,935 | 1,365,241,211 | 50,682,034,352 | 23,355,248,652 |
| **PSFTA** | 1,390 | 999,606,873 | 1,010,136,758 | 15,472,880,496 | 4,383,418,620 |
| **SAFTA** | 173 | 1,100,485 | 1,230,655 | 202,015,041 | 114,833,205 |
| **SAPTA** | 37 | 253,293 | 253,327 | 51,315,210 | 17,651,074 |
| **SAPTALDC** | 15 | 114,579 | 114,579 | 36,742,673 | 14,346,160 |
| **TOTAL** | **11,969** | **2,409,931,221** | **2,383,249,239** | **69,844,719,529** | **31,983,920,531** |



# නීති බලාත්මක කිරීමේ පර්ෂදය

# නිවාරණ අංශය

**හැඳින්වීම**

රේගු දෙපාර්තමේන්තුවේ නීති බලාත්මක කිරීමේ ප්‍රධාන අංශය වන්නේ නිවාරණ අංශයයි. තවද නිවාරණ අංශය මගින් රේගුවේ සමස්ත ක්‍රියාකාරී ස්ථානවල සුපරීක්ෂාව භාරව කටයුතු කරන අතර, කොළඹ වරාය හා අනෙකුත් වරායන්, ජාත්‍යන්තර ගුවන් තොටුපල, නිදහස් වෙළඳ කලාප, ආපනයන ප්‍රවර්ධන කලාප, භාණ්ඩ පරීක්ෂණ අංගන, දේශීය අභ්‍යන්තර නිශ්කාෂණ ආයතන, වෙරළ හා මුහුදු කලාප හා ජල මාර්ග ඒ අතරින් විශේෂ වේ.

නිවාරණ අංශය ශාඛා කීපයකින් සමන්විත වන අතර ඒවා නම්, පාලන ශාඛාව, "පී" ශාඛාව, මෙහෙයුම් ශාඛාව, විමර්ශන ශාඛාව, මෙගා පෝට් ශාඛාව, විකුණුම් ශාඛාව, සමුද්‍ර ශාඛාව සහ අනෙකුත් උපාය මාර්ගික ස්ථානවල පිහිටි උප රේගු කාර්යාල වේ.

**ප්‍රධාන කාර්යයන්.**

1. නීති විරෝධී ලෙස රටට භාණ්ඩ ගෙන ඒම, මත්ද්‍රව්‍ය වැරදි හා වංචා නිවාරණය කිරීම (වැළැක්වීම.)
2. රේගු වැරදි සම්බන්ධ තොරතුරු ලබා ගැනීම, ඒ සම්බන්ධ ක්‍රියා මාර්ග ගැනීම.
3. රේගු වැරදි හසුකර ගැනීම, රේගු බදු නොගෙවූ භාණ්ඩ අත් අඩංගුවට ගැනීම, රේගු විමර්ශන හා පරීක්ෂණ පැවැත්වීම, පැමිණිලි මෙහෙය වීම.
4. රජයට ලැබීමට නියමිත ආදායම් ලැබෙන බවට සහතික වීම.
5. සමාජ ආර්ථික, සංස්කෘතික හා පාරිසරික අවශ්‍යතාවයන් සුරක්ෂිත කිරීම හා එම ක්ෂේත්‍රයේ නීති හා රෙගුලාසි බලාත්මක කිරිම.
6. කොළඹ ඇතුළු අනෙකුත් වරායන්, බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපළ හා මත්තල මහින්ද රාජපක්ෂ අන්තර් ජාතික ගුවන්තොටුපළ ආවේක්ෂණ කටයුතු.
7. මුහුදු යාත්‍රා සංචලනය පාලනය කිරීම හා වෙරළ ආරක්ෂිත මෙහෙයුම් කටයුතු.
8. ශ්‍රී ලංකා රේගුව මගින් රාජසන්තක කරනු ලැබූ භාණ්ඩ විධිමත් ලෙස බැහැර කිරීම.

## 1. නීති විරෝධී ලෙස රටට ගෙන එන භාණ්ඩ, වාණිජ වැරදි හා මත්ද්‍රව්‍ය වැරදි වැළැක්වීම;

කොටුව ප්‍රධාන නිවාරණ කාර්යාලය පිහිටි ස්ථානය වෙනස් වූ අතර ප්‍රධාන ශාඛා 3ක් කොළඹ වරායෙන් ඇතුළත හා පිටත ස්ථාන වෙත මාරු කරන ලදී. වර්තමානයේ පාලන ශාඛාව සහ රේගු අධ්‍යක්ෂ(නිවාරණ) ගේ කාර්යාලය රේගු ප්‍රධාන මූලස්ථානයේ පිහිටා තිබේ. මීට අමතරව රේගු උප නිවාරණ කාර්යාල ප්‍රධාන මුහුදුබඩ නගරවල පිහිටා ඇත. ඒවා නම්, ත්‍රිකුණාමලය, ගාල්ල, කොග්ගල, මීගමුව හා සින්නපාඩු වේ.

රට තුළට හා ඉන් පිටත සිදුවන නීති විරෝධී භාණ්ඩ ප්‍රවාහනය, වෙළඳ වංචා හා මත්ද්‍රව්‍ය වැරදි වැළැක්වීම සඳහා මෙම කාර්යාලවලට අනුයුක්ත කරන ලද නිවාරණ නිලධාරීන් ක්‍රියාකාරීව හා කාර්යක්ෂමව පියවර ගෙන ඇත. මීට අමතරව, නිදහස් වෙළඳ කලාප තුළ පිහිටි නිවාරණ කාර්යාල මගින් සිදුකරනු ලැබූ මෙහෙයුම් මගින් රේගු බදු ඇතුළු භාණ්ඩ මෙම කලාපවලින් බැහැරව යෑම වැළැක්වීමට කටයුතු කර ඇත. රටේ සාමය ස්ථාපිත කිරීමෙන් පසු යාපනයේ සහ මන්නාරමේ රේගු නිවාරණ උප කාර්යාල නැවත ආරම්භ කිරීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත. එසේ වුවත්, මුහුදේ යාත්‍රා කිරීමට සුදුසු මුර යාත්‍රා හා පුහුණු නිලධාරීන්ගේ අඩුපාඩු නිසා සමුද්‍ර නීති බලාත්මක කිරීම නැවත ආරම්භ කිරීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී ඇත.

හම්බන්තොට වරායේ හා මහින්ද රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපලේ රේගු නිවාරණ කටයුතු ද මේ වන විට ක්‍රියාත්මකව පවතී.

**2.** අත්අඩංගුවට ගැනීම්, තහනම් කිරීම්, විමර්ශනය හා නඩු මෙහෙයුම්.

රේගු නිවාරණ අංශය විසින් ප්‍රධාන වශයෙන් පහත සඳහන් පරිදි රේගු නීති උල්ලංඝනය කිරීම් හොරබඩු ජාවාරම්, වෙළඳ වංචා, මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් තොරතුරු ලබාගනී:

a) නිවාරණ නිලධාරීන්ගේ පුද්ගලික ඔත්තුකරුවන් මඟින්.
b) මහජනතාවගෙන් ලබා ගන්නා ඔත්තු මඟින්.

මීට අමතරව, නැව් බඩු ලේඛනය හා ආනයන ලේඛන උපයෝගී කර ගෙන නිවාරණ නිලධාරීන් විසින් රේගු වංචා රැසක් අනාවරණය කර ගැනීමට සමත්ව ඇත. එසැනින් පරිගණක ගත කළ තොරතුරු ඇසුරෙන් වංචා සහගත ආනයනකරුවන් හසු කර ගැනීමේ ප්‍රවණතාව නැව් බඩු ලේඛන, සටහන්කර ඇසුරෙන් කරන හසුකර ගැනීම්වලට වඩා ඉහළ මට්ටමක පවතී.

සොයාගත් තොරතුරු ආශ්‍රයෙන් කළ වැටලීම් මඟින් හොරබඩු ලෙස හෝ රේගුවට ප්‍රකාශ නොකර ආනයන කළ රේගු තීරු ගාස්තු නොගෙවූ භාණ්ඩ විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගැනීමට, රේගු නිවාරණ අංශය සමත් විය. අදාළ විර්ශන කටයුතු හා රේගු නීති සම්බන්ධ කටයුතු නිවාරණ නිලධාරීන් විසින්ම සිදුකරන ලදී.

රේගු නීති බලාත්මක කිරීමේ අංශයන්හි අඩුපාඩුවක්ව පවතින මානව සම්පතෙහි කාර්ය සාධනය ඉහළ නැංවීමට හැකිවන පරිදි විධිමත් අවදානම් කළමනාකරණ වැඩසටහනක් දියුණු කිරීම සඳහා තාක්ෂණ සහාය ලබාගැනීමට ඉල්ලීම් කළද, එය තවමත් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. නීති බලාත්මක කිරීමේ රාජකාරි සඳහා විශේෂ අවධානය යොමු කරමින් නිවාරණ නිලධාරීන් සඳහා දැනුම වර්ධනය කිරීමේ පුහුණු සැසි පැවැත්වීමේ අවශ්‍යතාවය පවතී.

**3.** නියමිත පරිදි රාජ්‍ය ආදායම එකතු කරන බවට වගබලා ගැනීම.

ආනයන හා අපනයන මඟින් ලැබෙන රාජ්‍ය ආදායම එකතු කිරීම රේගුවේ ප්‍රධාන කාර්ය භාරයයි. රේගු දෙපාර්තමේන්තුව මඟින් අව්‍යාජ වෙළඳුන් වෙනුවෙන් පහසුකම් සැලසීම සඳහා හඳුන්වා දෙනු ලැබූ විශාල වශයෙන් ප්‍රතිඵල ගෙන දෙන්නා වූ පහසුකම් සැලසීමේ ක්‍රියාමාර්ග රාජ්‍ය ආදායම වංචා කිරීමට නැඹුරුවක් ඇති අයට රේගු දැලෙන් රිංගා යාමට සුළු ඉඩක් ලබාගෙන ඇත. බහුතරයක් වෙළඳුන් ස්වෙච්ඡාවෙන්ම නීතියට අනුකූලව කටයුතු කරන අතර, සුලුතරයක් වැරදි කිරීමට නැඹුරුවක් ඇත. සුළුතරයක් වෙළඳුන් ආනයනික භාණ්ඩ සඳහා වැරදි අර්ථකථන, මිල අඩුවෙන් සඳහන් කිරීම, හා භාණ්ඩ රේගුවට ඉදිරිපත් නොකර සිටීම වැනි රේගු වැරදි ඒ අතර වේ.

2013 වසර තුළ දී නිවාරණ අංශය මඟින් මෙහෙයවනු ලැබූ රේගු පරීක්ෂණ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | |
|---|---|
| ලියාපදිංචි වූ පරීක්ෂණ සංඛ්‍යාව | 3,050 |
| සම්පූර්ණ කළ පරීක්ෂණ සංඛ්‍යාව | 2,473 |
| වැරදි තහවුරු කර අභිමි කිරීම්/ දඩ නියම කළ පරීක්ෂණ සංඛ්‍යාව | 378 |
| දඩ හා අභිමි කිරීම් මඟින් අය කළ මුලු මුදල<br>රු. මිලියන | 251.48 |
| අමතර සහටන්කර ( A/E) මඟින් අයකළ මුදල<br>රු. මිලියන | 31.61 |
| දේශීය විකිණීම් මඟින් අයකරගත් මුලු මුදල<br>රු. මිලියන | 745.84 |
| අතිකාල හා වෙනත් අයකර ගැනීම්<br>රු. මිලියන | 91.93 |
| සම්පූර්ණ අයකරගත් මුදල<br>රු. මිලියන | 1,120.67 |

**4.** සමාජ ආර්ථික, සංස්කෘතික, පරිසර විද්‍යාත්මක හා පාරිසරික වැදගත්කමක් ඇති දෑ සංරක්ෂණය සහ අදාළ නීති, රෙගුලාසි බලාත්මක කිරීම

රටේ පවතින සමාජ ආර්ථික, සංස්කෘතික, පරිසර විද්‍යාත්මක හා පාරිසරික වශයෙන් වැදගත් කමක් දක්වන දෑ සංරක්ෂණය කිරීමට නිවාරණ අංශයට එහි මෙහෙයුම් අනුව හැකි වී ඇත.

රේගු ආඥා පනතේ එන රෙගුලාසිවලට අමතරව, නිවාරණ අංශයේ නිලධාරීන් විසින් වෙනත් නීති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සහතික කරනු ලබයි.
උදා-

1. අවි සහ පතරොම් පනත
2. වන සත්ත්ව සහ ශාක පිළිබඳ පනත
3. ආනයන සහ අපනයන පාලක පනත
4. විද්‍යුත් උපකරණ හා ඖෂධ පනත
5. විදුලි සංදේශ සහ නියාමන කොමිෂන් පනත
6. ආහාර හා ඖෂධ පනත
7. විනිමය පාලන පනත
8. බුද්ධිමය දේපළ පනත

**5. කොළඹ වරාය අනෙකුත් වරායන්, නිදහස් වෙළෙඳ කලාප සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සුපිරික්සුම**

කොළඹ වරායේ සුපරීක්ෂාව නිවාරණ අංශයට අයත් කොටුව නිවාරණ කාර්යාලය හා කොච්චිකඩේ නිවාරණ කාර්යාලය මගින් සිදු කරන අතර, කොටුව ප්‍රදේශයේ හා කොච්චිකඩේ ප්‍රදේශයේ සුපරීක්ෂාව පිළිවෙලින් ඉහත කාර්යාල වෙත පැවරී ඇත. දිනපතා පැය 24 පුරාම මෙම කාර්යාල විවෘතව පවතින අතර, ඒ ඒ කාර්යාල සඳහා වෙන වෙනම ගොඩබිම රාජකාරි භාර නිලධාරියෙක් (**LDO**) හැම මොහොතකම රාජකාරියේ නියුතු වෙයි. මෙම නිලධාරීන් තමන්ට අදාළ ගේට්ටු නිල පිරික්සුමට භාජනය කරන අතර, එමගින් එම අදාළ ස්ථානවල නියමිත නිලධාරීන් සේවයේ යෙදී සිටින බවට තහවුරු කර ගනී.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සහ කටුනායක නිදහස් වෙළඳ කලාපයේ කටයුතු අධීක්ෂණය කරනු ලබන්නේ නයිකන්දේ පිහිටි උප නිවාරණ කාර්යාලයෙනි. එලෙසම බියගම පිහිටි උප නිවාරණ කාර්යාලය මගින් බියගම නිදහස් වෙළඳ කලාපයේ කටයුතු අධීක්ෂණය කෙරේ.

කෙසේ වුවත්, පල්ලෙකැලේ, හොරණ, මීරිගම යනාදී අපනයන සැකසුම් කලාප නිවාරණ අංශයේ සුපරීක්ෂණය යටතේ නොපවතී. එනිසා එම කලාප ආශ්‍රිතව උප නිවාරණ කාර්යාල පිහිටුවීම හෝ එම කලාපවලට උප නිවාරණ කාර්යාලවලින් නිලධාරීන් පත් කිරීම රේගු කටයුතු සිදු කිරීමට මහත් වූ අවශ්‍යතාවයකි.

**6. නාවික යාත්‍රා මෙහෙයුම් පාලනය සහ දේශ සීමා මෙහෙයුම්**

හම්බන්තොට වරාය ද ඇතුලුව ප්‍රධාන වරායන් හතරෙහි නාවික යාත්‍රා මෙහෙයුම් පාලනය නිවාරණ අංශය සතු වගකීමකි. කොටුව නිවාරණ කාර්යාලය මගින් කොළඹ වරායේ එම රාජකාරි සිදු කරන අතර, ගාල්ල, ත්‍රිකුණාමලය හා හම්බන්තොට වරායන්වල දී අදාළ ස්ථානවල උප නිවාරණ කාර්යාල මගින් එම රාජකාරි සිදු කරනු ලැබේ.

කොටුව නිවාරණ කාර්යාලය මගින් දවසේපැය 24 පුරා වරාය රාජකාරි භාර නිලධාරීවරයෙකු (HDO) නාවික යාත්‍රා මෙහෙයුම් රාජකාරි සඳහා යොදවනු ලබයි. ඔහු වරායට සේන්දු වන නැව්වලට ගොඩවන අතර, එහිදී අදාළ නැව අවසන් වරට සේන්දු වූ වරායෙන් නිකුත් කෙරුණු නික්ම යාමේ අවසර පත්‍රය තිබේදැයි විමසිලිමත් වෙයි. අදාළ නැවේ සියලු නාවුකයින්ට අදාළ ප්‍රකාශ පත්‍රය ද ඔහු පරීක්ෂා කරයි. (IMO Crew declarations) නැව් බඩු ලේඛනය රේගුවට

ප්‍රකාශ කර භාරදීම කොළඹ වරායට සේන්දු වන සෑම නැවකට දේශීය නියෝජිතගේ (අදාළ නැවේ කපිතාන්ගේ නියෝජිත වශයෙන්) වගකීමකි.

දේශීය නියෝජිත විසින් අදාළ සියලු රාජකාරිමය අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ පසු සෑම නැවක් සඳහාම පිටත්වීමේ අවසරය "Outward Clearance" වරාය රාජකාරි භාර නිලධාරියා විසින් නිකුත කරනු ලබයි.

දැනට නැවේ දේශීය නියෝජිත විසින් අපනයන නැව් බඩු ලේඛනය export cargo නිවාරණ කාර්යාලයට භාර නොදෙන බැවින් පිටත්වීමේ අවසරය ලබා දෙන නිලධාරියාට අදාළ නික්ම යන නැවේ ඇති අපනයන භාණ්ඩ දත්ත පිළිබඳ වැටහීමක් නැත.

## 7. ශ්‍රී ලංකා රේගුව මගින් රාජසන්තක කරන ලද භාණ්ඩ (බැහැර කිරීම) අලෙවි කිරීම

මුලු දෙපාර්තමේන්තුවට අයත් විවිධ අංශ හා ශාඛා මගින් තහනම් කරනලද හා රාජසන්තක කරන ලද භාණ්ඩ විකිණීමේ බලය මධ්‍යම විකුණුම් අංශය වෙත පවරා ඇත. රාජසන්තක කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකිණීම සම්බන්ධ ප්‍රතිපාදන රේගු ආඥා පනත මගින් සලසා ඇත. රජයේ මුදල් රෙගුලාසි යටතේ ස්ථාපිත කර ඇති ටෙන්ඩර් මගින් විකිණීමේ පටිපාටිය එම වෙන්දේසිවලදී අනුගමනය කරනු ලැබේ.

# සමාජ ආරක්ෂණ අංශය

හැඳින්වීම

සමාජ ආරක්ෂණය තහවුරු කිරීම සඳහා මෙතෙක් රේගුවේ විවිධ අංශ යටතේ ක්‍රියාත්මක වූ ශාඛා කීපයක් සම්බන්ධ කරමින් සමාජ ආරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා වෙනමම අංශයක් ස්ථාපිත කරන ලදී. රේගු නීතිය හා අනෙකුත් සම්බන්ධිත නීති දැඩිවම බලාත්මක කිරීම පිණිස මෙලෙස ඒකාබද්ධ කිරීමට හඳුනාගත් ශාඛා මත්ද්‍රව්‍ය නිවාරණ අංශය, පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශය ලෙස නම් කළ හැකිය.

ප්‍රධාන කාර්ය භාරයන්

රේගු කාර්යාල තුළ දී වෙළඳ ප්‍රවර්ධනය සඳහා පවතින නීති බලාත්මක කිරීම තුළින් නියමිත බදු ආදායම එකතු කිරීම සහතික කරන අතරම නීති විරෝධී ලෙස මෙරටට ඇතුලුවන හෝ පිටව යන මත් ද්‍රව්‍ය අවමානසික තත්ත්ව කෙරෙහි බලපාන ද්‍රව්‍ය වැළැක්වීම තහනම් කිරීම පාරිසරික ජෛව විවිධත්ව සංස්කෘතික ජාතික උරුමයන් හා පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීම මෙම අංශයේ කාර්ය භාරය වේ.

## මත් ද්‍රව්‍ය නිවාරණ අංශය

සමාජ ආර්ථික, සෞඛ්‍ය හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කරන අතරම, ආනයන අපනයන, තැපැල් තෑගි පාර්සල් කුරියර් සේවය මගින් හා මගීන්ගේ ගමන් බඩු ආදිය මගින් සිදු විය හැකි මත් ද්‍රව්‍ය හා අවමානසික තත්ත්ව කෙරෙහි බලපාන ද්‍රව්‍ය නීති විරෝධී සංසරණය රේගු හා අනෙකුත් සම්බන්ධිත නීති බලාත්මක කිරීම තුළින් වැළැක්වීම පිණිස මත් ද්‍රව්‍ය නිවාරණ අංශය ස්ථාපිත කරන ලදී.

ප්‍රධාන කාර්ය භාරයන්

1 ගුවන් තොටුපළේ පැය 24 පුරා සුපරීක්ෂාව.
2 ගුවන් බඩු මුහුදු බඩු, තැපැල් හා කුරියර් අංශවල සසම්භාවී සුපරීක්ෂාව
3 ගුවන් හා මුහුදු මගින් සිදු වන වාණිජමය ආනයන හා අපනයන හරහා සිදුවිය හැකි මත් ද්‍රව්‍ය හා අවමානසික තත්ත්ව කෙරෙහි බලපාන ද්‍රව්‍ය නීති විරෝධී සංසරණ හඳුනා ගැනීම හා වැළැක්වීම.
4 විශ්වාසනීය ඔත්තු විමර්ශනය කිරීම
5 පුහුණු හා දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම
6 precursor රසායන ද්‍රව්‍ය ආනයනය transshipments අපනයනය අධීක්ෂණය කිරීම
7 පොලිස් මත් ද්‍රව්‍ය කාර්යාංශය සමග සාමූහික මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම.

**2013** වසර තුළ මත් ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම්

| විස්තරය | ප්‍රමාණය (ග්‍රෑම්) | වටිනාකම (රු.) |
|---|---|---|
| හෙරොයින් | 2528.00 | 17,072,000.00 |
| Methamphetamine | 1970.00 | 25.61 මිලියන |
| කාත් පැළෑටි Khat Plant | 50000.00 | 78,000.00 |

## රේගුවේ වෙනත් අංශ මගින් කර ඇති අත්අඩංගුවට ගැනීම්

| විස්තරය | ප්‍රමාණය (ග්‍රෑ) | වටිනාකම (රු) |
|---|---|---|
| හෙරොයින් | 30100.00 | 240,800,000.00 |
| ගංජා | 10056.00 | 1,500,000.00 |

## මත්ද්‍රව්‍ය නොවන වෙනත් අත්අඩංගුවට ගැනීම්

| මාසය | විස්තරය | වටිනාකම (රු) |
|---|---|---|
| ජනවාරි | ඇණු බීජ -20 | 2000/- |
| | විකුණු දුම්කොළ (Gukta Brand) | 14000/- |
| | ගබ්සා පෙති - කාඩ් 94 | 9400/- |
| පෙබරවාරි | සිගරට් - කාටුන් 375 | 1,125,000/- |
| | විකන දුම්කොළ -කිලෝ ග්‍රෑම් 13 | 13000/- |
| | Clanazepam 2mg Tablets -2610 Card | 522,000/- |
| මාර්තු | Deprovera එන්නත -4990 Vials | 1497,000/- |
| | Mifeprin පෙති -344 කාඩ් | 34400/- |
| | සිගරට් - කාටුන්119 | 357,000/- |
| | Rivtril පෙති - කාඩ් 650 | 195000/- |
| | Pang Parag - 5.5 Kg | 550,000/- |
| | මුහුණ ආලේපන - 130 Cips | 13,000/- |
| අප්‍රේල් | Misoprost - පෙති 400 | 40,000/- |
| | කරදමුංගු - කිලෝ ග්‍රෑම් 110.3 | 110,300/- |
| | සිගරට් - කාටුන් 10 | 30,000/- |
| | ලොකු ඇණු බීජ - කිලෝ ග්‍රෑම් 195 | |
| | Rivotril පෙති - කාඩ් 2998 | 899,400/- |
| | Depo Provera -1116 Vials | 334800/- |
| | Tramadol Hydrochloride - 3500 Capsules | 1,050,000/- |
| මැයි | බටහිර ඖෂධ එන්නත් 1135 | 340500/- |
| | Mifeprin - කාඩ් 200 | 20000/- |
| | Rivotril Tablets- කාඩ් 450 | 135000/- |
| | Pan parag -10kg | 100000/- |
| | Misoprostol-850 cards | 85000/- |
| ජූනි | Misoprostol- 90cards | 9000/- |
| | ශල්‍යාගාර පිහි - 1000 | 100000/- |
| ජූලි | සිගරට් - කාටුන් 60 | 120000/- |
| | Rovotril Tablets -600 Ctns | 300000/- |
| | සුන්නත් කිරීමේ උපකරණ-1000 | 50000/- |
| | Misoprost Tablets -1000 nos | 350000/- |
| අගෝස්තු | සුවඳ විලවුන් | 47000/- |
| | විවිධ බටහිර ඖෂධ | 112082/- |
| සැප්තැම්බර් | Tramadol Hydrochloride -500 cards | 100000/- |
| | සිගරට් - කාටුන් 401 | 2120000/- |
| ඔක්තෝබර් | Tramadol Hydrochloride -467 cards | 800600/- |
| | Misaprostol -125 cards | 31280/-/- |
| නොවැම්බර් | Misaprostol -88 cards | 8800/- |
| | Rovotril Tablets -720 cards | 72000/- |
| දෙසැම්බර් | විවිධ බටහිර ඖෂධ | 57750/- |
| | ව්‍යාජ ඩොලර් හා ප්‍රැන්ක් නෝට්ටු | 416500/- |
| | Tramaadol Hydrochloride -1000 tablets | 13600/- |
| | Misoprostol -136 tablets | 13600/- |
| | Cigarette 100 | 300000/- |

අත්අඩංගුවට ගැනීම් කීපයක විස්තර ලුහුඩින්

**දිනය :2013.01.01**





සැකකටයුතු හැසිරීම හේතුවෙන් බණ්ඩාරනායක ගුවන් තොටුපලේ පැමිණීමේ පර්යන්තයේ ප්‍රකාශ කිරීමට කිසිවක්නොමැති (Green channel) තීරුවේදී පිරිමි මගියෙකු පරීක්ෂා කිරීම සඳහා නවතා ගන්නා ලදී. ඔහුගේ 'එම්කෝරා' (Emcora) වර්ගයේ ගමන් මල්ලේ ප්ලාස්ටික් ලයිනරය කළු පාට ටේප් පටියකින් වෙලා ඇති බව,මත්ද්‍රව්‍ය නිවාරණ අංශයේ නිලධාරීන් මූලික පරීක්ෂණයේදී නිරීක්ෂණය කරන ලදී. වැඩිදුර පරීක්ෂාවේදී ග්රෑම් 1970 බරැති මෙතම්පිටමයින් (Methamphetamine) බවට සැක කළ හැකි සුදු පැහැති ද්‍රව්‍යයන් ප්ලාස්ටික් ලයිනරය තුළ සඟවා තිබී සොයා ගැණින.

**මූලික විමර්ශනයේදී අදාළ මගියා ඉරානයේ සිට පැමිණ ඇති බව හෙළිවිය.**

**දිනය: 2013.02.24**





ලැබුණ ඔත්තුවක් හේතුවෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ පැමිණීමේ පර්යන්තයේ 'ප්‍රකාශ කිරීමට භාණ්ඩ ඇති' (Red channel) තීරුවේදී මගීන් දෙදෙනෙකු පරීක්ෂා කිරීම සඳහා නවත්වා ගන්නා ලදී. හෙරොයින් බවට සැකකළ හැකි දුඹුරු පාට ද්‍රව්‍ය ග්රෑම් 1018ක් අඩංගු පැකට් කීපයක්, ඔවුන්ගේ ගමන් මළු තුළ වූ ඇඟලුම් අතරේ සඟවා තිබී මත්ද්‍රව්‍ය නිවාරණ අංශයේ නිලධාරීන් විසින් සොයා ගන්නා ලදී.

කාන්තා මගියා ශ්‍රී ලංකිකයෙකු බවත් පිරිමි මගියා ඉන්දියානුවෙකු බවත් මොවුන් දෙදෙනා ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර නිතර ගමන් කර ඇති බවත් මූලික විමර්ශනයේදී අනාවරණය විය.

සාරාංශය

- 2013 වසරේ ලියාපදිංචි කළ නඩු සංඛ්‍යාව - 68
- සම්පූර්ණයෙන් අවසන් කළ නඩු සංඛ්‍යාව - 55
- වරද තහවුරු කොට රාජසන්තක කිරීම් හා දඩ පබැනවූ නඩු සංඛ්‍යාව - 42
- රාජසන්තක කිරීම් හා දඩ මහන් එකතු කළ මුදල - 225,855/-
- රාජසන්තක කරන ලද භාණ්ඩවල වටිනාකම - 34,862,832/-
- 2013 වසරේ අවසන් නොකළ නඩු සංඛ්‍යාව - 13

# ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂණ අංශය

වෙළඳාම සඳහා පහසුකම් සලසමින්, නියමිත බදු ආදායම සුරක්ෂිත කරන අතරේ නීති විරෝධී වන සත්ව වෙළඳාම වැළැක්වීමට පියවර ගනිමින් - පාරිසරික, ජෛව විවිධත්ව හා ජාතික උරුමයන් ආරක්ෂා කිරීම පිණිස මෙම අංශය ස්ථාපිත කරන ලදී.

**ප්‍රධාන කාර්ය භාරයන්:**

1. දේශසීමා අතරේ ජෛව විවිධත්ව ගණයට අයත් භාණ්ඩ සංචලනයේදී අදාල ජාතික හා ජාත්‍යන්තර නීති බලාත්මක කිරීම.
2. සියළුම ජෛව විවිධත්ව සම්බන්ධකම් ඇති ආනයන හා අපනයනවල විස්තර වර්ගීකරණ හා මිල සෝදිසි කිරීම.
3. වනසත්ව හා වෘක්ෂලතා සම්බන්ධ ආනයන හා අපනයන් පාලනය සඳහා වන බලපත්‍ර අවශ්‍යතාවයන් සෝදිසි කිරීම හා එවැනි ආනයන හා අපනයනවල අවිධිමත් භාවය නිසා රේගු ක්‍රියාදාමයන්ට වන බලපෑම සොයා බැලීම.
4. ජීව විද්‍යාත්මක සමතුලිතතාවයට හානි නොවන ආකාරය, අප රටේ සංවර්ධන ව්‍යාපෘති සඳහා වන සත්ව හා වෘක්ෂලතා ආනයන හා අපනයන දිරිමත් කිරීම.

**ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂණ අංශයේ නිලධාරීන් විසින් 2013 වසරේදී අත් අඩංගුවට ගත් භාණ්ඩ.**

| | දිනය | නිශ්පාදන | |
|---|---|---|---|
| 1 | 2013.01 | මොණර පිහාටු | BCNP |
| 2 | 2013.01 | මොණර පිහාටු | BCNP |
| 3 | 2013.01 | පෞරාණික බඳුන | BCNP |
| 4 | 2013.01 | මුහුදු කැකිරි | BCNP |
| 5 | 2013.01 | මුහුදු කැකිරි | BCNP |
| 6 | 2013.02 | සජීවී මිරිදිය කකුළුවන් | BCNP |
| 7 | 2013.02 | මුහුදු සිප්පි කටු | BCNP |
| 8 | 2013.03 | පෞරාණික කාසි | BCNP |
| 9 | 2013.02 | මුව අං, මුහුදු හිරිගල් | BCNP |
| 10 | 2013.03 | පෞරාණික කාසි | BCNP |
| 11 | 2013.04 | මිරිදිය මත්ස්‍යයින් | BCNP |
| 12 | 2013.03 | මුහුදු සිප්පි කටු, මුහුදු හිරිගල් | BCNP |
| 13 | 2013.03 | මුහුදු හිරිගල් | BCNP |
| 15 | 2013.04 | කොතල හිඹුටු (*Salacia reticulata*) | BCNP |
| 16 | 2013.05 | පෞරාණික කාසි | BCNP |
| 17 | 2013.05 | ආරක්ෂිත මුහුදු සිප්පි කටු | BCNP |
| 18 | 2013.06 | සජීවී පොකිරිස්සන් | BCNP |
| 19 | 2013.06 | පෞරාණික කාසි, පෞරාණික හණ කිල්ලෝට | BCNP |
| 20 | 2013.04 | මුහුදු සිප්පි කටු | BCNP |
| 21 | 2013.07 | මුහුදු කැකිරි | BCNP |
| 22 | 2013.07 | මහෝගනී දැව | BCNP |
| 23 | 2013.07 | කළුවර ලීබඩු, ඇත් දළ පුතිමා | BCNP |
| 24 | 2013.07 | ආරක්ෂිත සිප්පි කටු | BCNP |
| 25 | 2013.07 | ආරක්ෂිත සිප්පි කටු | BCNP |
| 26 | 2013.07 | ඇත් දළ වළලු, ගෙල පලඳනා | BCNP |
| 27 | 2013.07 | වල්ලා පට්ටා | BCNP |
| 28 | 2013.07 | මුව හම් | BCNP |
| 29 | 2013.10 | සුදු හඳුන් තෙල් | BCNP |
| 30 | 2013.09 | සජීවී කුරුල්ලන් | Baggage |
| 31 | 2013.10 | වල්ලා පට්ට | BCNP |
| 32 | 2013.10 | වල්ලා පට්ට | BCNP |
| 33 | 2013.10 | සුදු හඳුන් තෙල් | BCNP |
| 34 | 2013.10 | සුදු හඳුන් තෙල්, කෝටු | BCNP |
| 35 | 2013.10 | සුදු හඳුන් තෙල් | BCNP |
| 36 | 2013.10 | සුදු හඳුන් තෙල් | BCNP |
| 37 | 2013.10 | වල්ලා පට්ට | BCNP |

**කොතලහිඹුටු තොගයක් නීති විරෝධී ලෙස අපනයනය කිරීමට දැරූ උත්සාහයක් සාර්ථකව ව්‍යර්ථ කෙරේ.** ***(Salacia reticulata)***





දියවැඩියාව සඳහා සම්ප්‍රදායික ආර්යුවේද ප්‍රතිකාරවලදී යොදා ගන්නා දේශීය ශාක විශේෂයක් නීතිවිරෝධී ලෙස අපනයනය කිරීමට දැරූ උත්සාහයක් ශ්‍රී ලංකා රේගුව විසින් 2013 අප්‍රේල් 12 දින සාර්ථකව වළක්වන ලදී. මෙසේ නීතිවිරෝධීව අපනයනයට උත්සාහ දැරූ කොතලහිඹුටු (*Salacia reticulata)* ශ්‍රී ලංකාවේ වියළි කළාපයේ වනාන්තරවල වැවෙන දේශීය ශාක විශේෂයකි. කොතලහිඹුටු කිලෝ ග්‍රෑරැම් 323 ක මලු 12ක බහා කුරියර් සේවාවක් හරහා නීති විරෝධී ලෙස අපනයනය කිරීමට ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයකු මෙසේ උත්සාහ දරා ඇත. මෙම භාණ්ඩ තොගය ජපානයට අපනයනය කිරීමට නියමිතව තිබී ඇත.

කොතලහිඹුටු (*Salacia reticulata*) යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වනු ලබන ඖෂධීය වටිනාකමකින් යුත් කොතලහිඹුටු ශාකය දියවැඩියා හා විවිධ තුවාල සඳහා ප්‍රතිකාර කිරීමට දේශීය වෙදකමේදී සියවස් ගණනාවක සිට භාවිත කරයි. විශාල ඉල්ලුමක් ඇති කරමින් දියවැඩියාව හා විවිධ තුවාල සඳහා බෙහෙත් නිපදවීමේ අරමුණ ඇතිව කොතලහිඹුටුවල ක්‍රියාකාරී ජානමය සංයෝග වෙන් කිරීමට විද්‍යාඥයින් විසින් උත්සාහ දරා ඇත. ශ්‍රී ලංකාවේ වියළි හා සමශීතෝෂ්ණ වනාන්තර තුළදී ප්‍රධාන වශයෙන් කොතලහිඹුටු ශාකය හමුවේ.

කෙසේ වෙතත්, ඉතා සෙමින් වැඩෙන ශාකයක් වන කොතලහිඹුටු, අස්වැන්න ලබාගැනීමට තරම් මේරීමට වසර 40-50 දක්වා කාලයක් ගත වේ. අසීමිතව කොතලහිඹුටු එකතු කිරීම නිසා දැනටමත් එහි වනගහනය ක්ෂය වී ඇති අතර ශ්‍රී ලංකාවේ වඳවී යාමේ තර්ජනයට ලක්වූ පැළෑටියක් ලෙස තර්ජනයට හසුවූ වනසත්ව හා වෘක්ෂලතා රතු ලැයිස්තුව යටතේ වර්ග කිරීමට නියමිතය.

ඓතිහාසික වටිනාකමකින් යුත් භාණ්ඩ තොගයක් නීති විරෝධී ලෙස රටින් පිට කිරීමට දැරූ උත්සාහයක් වළක්වන ලදී.





**පොළොන්නරු යුගයට සහ ලන්දේසි, පෘතුගීසි හා ඉංග්‍රීසි පාලන සමයන්ට අයත් ඓතිහාසික වටිනාකමකින් යුත් පැරණි කාසි තොගයක් තමන්ගේ ගමන් මලු තුළ සඟවා රටින් පිට කිරීමට තැත් කළ ශ්‍රී ලාංකික මගියෙකු 2013.03.22 දින බණ්ඩාරනායක ගුවන් තොටුපලේදී ශ්‍රී ලංකා රේගුව විසින් අත් අඩංගුවට ගන්නා ලදී.**

**පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක්/අවසර පතක් නොමැතිව පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුතු බවට එකී බලධරයා විසින් තීරණය කළා වූ භාණ්ඩ රටින් පිට කිරීම, පුරා විද්‍යා ආඥා පනතේ විධිවිධාන සමඟ කියවෙන රේගු ආඥා පනතේ කොන්දේසි ප්‍රකාර වරදක් බැවින් ඉහත සඳහන් භාණ්ඩ රාජසන්තක කරන ලදී.**

## අපනයන කිරීමට තැත් දැරූ නීති විරෝධී මුහුදු සිප්පි කටු රාජසන්තක කෙරේ.



2013 මාර්තු 27 දින විදේශ මගියකු විසින් නීතිවිරෝධී ලෙස රටින් පිට කිරීමට තැත්දැරූ මුහුදු සිප්පිකටු තොගයක් අත් අඩංගුවට ගැනීමට (apprehend) ශ්‍රී ලංකා රේගුවේ, ජෛව විවිධත්ව හා ජාතික උරුම ආරක්ෂණ අංශය සමත් විය. වඳවීමට තර්ජනයට ලක්වී ඇති වන වෘක්ෂලතා හා වනසත්ව විශේෂයන්ගේ ජාත්‍යාන්තර වෙළඳාම් පිළිබඳ පොදු ප්‍රඥප්තිය (CITES) යටතේ රැජින සංඛය හෙවත් රෝස සංඛය ආරක්ෂා කර ඇත.

බොහෝ රටවල සංඛ (හක් ගෙඩි) over-fished වන අතර අවසරයකින් තොරව විශාල ප්‍රමාණ රැගෙන යාම සහ අපනයනය නීතිවිරෝධී වේ. කෙසේ නමුත් ජාත්‍යාන්තර වෙළඳ පොලේ සංඛ මස් (conch meat) සහ සංඛ (shells) සඳහා විශාල ඉල්ලුමක් පවතී. සත්ව හා වෘක්ෂලතා පනත යටතේ සමහර මුහුදු සිප්පිකටු හා molluscs ගණයට අයත් සත්ත්වයින් ආරක්ෂා කර ඇත. මෙම පනත යටතේ අජීවී සිප්පි කටු පවා ආරක්ෂා කර ඇති මුහුදු වැල්ලෙන් අහුලා ගෙන යාම නීති විරෝධීය.

සමහර මුහුදු සිප්පි කටු විශේෂ සඳහා අපනයන වෙළඳ පොලේ විශාල ඉල්ලුමක් පවතින්නේ මංගල උත්සව වලදී පළඳින සාම්ප්‍රදායික වළලු නිපදවීමට ඒවා භාවිතා කරන බැවිනි.

**සීමාවලට යටත් කරන ලද දැව තොගයක් අපනයනයට දැරූ තැනක් වැළැක්වීම:**



නීති විරෝධී ලෙස අපනයනයට සූදානම් කර තිබූ මහෝගනී (*Swetinia macrophyla*) දැව තොගයක් ශ්‍රී ලංකා රේගුව විසින් 2013.07.05 දින අල්ලා (detected) ගන්නා ලදී. අදාළ බහාලුම මාලදිවයිනයට යැවීමට නියමිතව තිබුණි.

මහෝගනී අපනයනය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ (Department of Forests) වලංගු බලපත්‍රයක් අවශ්‍ය වේ. එම නිසා මෙය වන ආඥාපනත සමඟ කියවෙන රේගු ආඥාපනත උල්ලංඝනය කිරීමකි. ඉහත පනතේ වගන්ති උල්ලංඝනය කිරීමේ වරද (චූදිත) කළ සමාගමට රේගුව විසින් දණ්ඩනයක් පනවන ලදී.

**සීමාවලට යටත් කරන ලද ජලජ ජීවීන් නීතිවිරෝධීව පිටරටට යැවීමට දැරූ තැතක් අනාවරණය කරන ලදී.**




2013 අප්‍රේල් 4 වන දා සීමාවලට යටත් කරන ලද ජීවී මිරිදිය මත්ස්‍යයින් (මසුන්) මිරිදිය කකුළුවන් තොගයක් නීතිවිරෝධීව ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීමට තැත් කිරීමක් අනාවරණය කර ගැනීමට ජෛව විවිධත්ව, සංස්කෘතික ජාතික උරුම ආරක්ෂණ අංශයේ නිලධාරීන් සමත්විය.

සීමාවලට යටත් කරන ලද මිරිදිය මත්ස්‍ය විශේෂයක් වන Flower fin Barbs (*Rasborides veterifloris*) හෙවත් හල්මල් දණ්ඩියා සහ සීමාවලට යටත් කරන ලද මිරිදිය කකුළුවන් (*Macrobachism spp)* මෙම තොගයට අයත් විය. මෙම ජලජ ජීවීන් කටාර් රාජ්‍යයට අපනයනය කිරීමට සැලසුම් කර තිබුණි. ජලජ ජීවීන් රාජසන්තක කර සත්ව උද්‍යානයට භාර දුන් අතර චූදිත සමාගමට දඩ නියම විය. මෙය ධීවර හා ජලජ සම්පත් පනතේ කොන්දේසි සමඟ කියවෙන රේගු ආඥා පනත උල්ලංඝනය කිරීමකි.

සීමාවලට යටත් කරන ලද ගෘහ භාණ්ඩ කොටස් අත්අඩංගුවට ගැනීම.





පුද්ගලික පරිහරණ භාණ්ඩ ලෙස ප්‍රකාශ කළ නීති විරෝධී ලෙස රටින් පිටකිරීමට උත්සාහ දැරූ කළුවර ගෘහ භාණ්ඩ හා පෞරාණික කාසි අඩංගුව තිබූ සම්පූර්ණ බහාලුමක් 2013.07.05 දින අත් අඩංගුවට ගනු ලැබිණ. මෙම තොගය 2013.07.06 දින මලයාසියාවට නැව්ගත කිරීමට නියමිතව තිබුණි. දැව ගෘහ භාණ්ඩ 24, පෞරාණික කාසි 86 හා ඇත් දළ ප්‍රතිමාවක් ප්‍රකාශ නොකළ භාණ්ඩ ලෙස බහලුම් තුළ තිබී හමු විය. ප්‍රකාශ නොකළ දැව ගෘහ භාණ්ඩ 24න්, 19ක් කළුවර හෝ කළුවර සමඟ කළුමැදිරිය දැවයෙන් සමන්විත ගෘහ භාණ්ඩ විය.

2009 අංක 65 දරණ වන සංකරක්ෂණ පනත හා 1955 අංක 23 දරණ වන ආඥා (සංශෝධිත) පනත ප්‍රකාර නිකුත් කළ 2000.12.05 අංක 1161/6 දරණ අති විශේෂ ගැසට් නිවේදනය යටතේ කළුවර දැවයෙන් සමන්විත ගෘහ භාණ්ඩ අපනයනයට සීමා පනවා ඇත.

2009 අංක 22 දරණ පනතින් සංශෝධිත 1937 අංක 2 දරණ සත්ව හා වෘක්ෂලතා සංරක්ෂණ පනතේ අංක 40 දරණ වගන්තිය ප්‍රකාර වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ වලංගු අවසරපත්‍රයක් නොමැතිව ඇත්දළ අඩංගු භාණ්ඩ අපනයනය කළ නොහැකිය.

1988 අංක 24 දරණ පනතින් සංශෝධිත 1940 අංක 9 දරණ පුරා විද්‍යා පනතේ 36 වන වගන්තිය යටතේ පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ වලංගු අවසර පත්‍රයක් නොමැතිව පෞරාණික භාණ්ඩ අපනයනය කළ නොහැකිය.

**ගුවන් බඩු පර්යන්තයේදී සුදු සඳුන් (*Santalum album*) තෙල් අත්අඩංගුවට ගැනීම.**




කුරියර් සමාගමක් හරහා සිංගප්පූරුවට අපනයනය කිරීමට සූදානම් කර තිබූ සුදු සඳුන් තෙල් කිලෝ ග්‍රෑම් 50 අඩංගුව බරණි දෙකක් ගුවන් බඩු පර්යන්තයේදී 2013.10.07 දින අත් අඩංගුවට ගන්නා ලදී. මෙම භාණ්ඩ සුවඳ තෙල් සහ නියැදි(සාම්පල්) ලෙස ප්‍රකාශ කර තිබුණි.

2009 අංක 32 දරණ වන සහ වෘක්ෂලතා සංශෝධිත ආඥා පනත යටතේ සුදු සඳුන් (*Santalum album*) ආරක්ෂා කරන ලද ශාකයකි. එබැවින් සුදු සඳුන් අපනයනය කිරීම 2009 අංක 22 දරණ වන සහ වෘක්ෂලතා (සංශෝධිත) ආඥා පනත සහ 2009 අංක 65 දරණ වන සංරක්ෂණ (සංශෝධිත) ආඥා පනත උල්ලංඝනය කිරීමකි

බණ්ඩාරනායක ගුවන් තොටුපලේදී (**BIA)** වල්ලාපට්ටා අත්අඩංගුවට ගැනීම.



වල්ලාපට්ට (*Gyrinops walla*) දැව කැබලි කිලෝ ග්‍රෑම් 31 රටින් පිට කිරීමට උත්සාහ දැරූ කාම්බෝජියානු මගීන් දෙදෙනෙකු බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේදී 2013.10.07 දින අත් අඩංගුවට ගන්නා ලදී. සැකකරුවන් හට දඩුවම් පමුණුවා වල්ලාපට්ටා තොගය රාජසන්තකර කරන ලදී.

ආවේනික ශාකයක් වූ වල්ලාපට්ටා සාම්ප්‍රදායිකව ඖෂධීය අරමුණු (වෛද්‍ය ප්‍රතිකාර) වෙනුවෙන් යොදා ගනී. කෙසේ නමුත් එමගින් නිපදවන resinous ද්‍රව්‍ය37වෙනත් රටවලදී අධික මිලක් ගන්නේ එම resinous ද්‍රව්‍ය සුවඳ විළවුන් නිපදවීමට යොදා ගන්නා බැවිනි.

සාරාංශය

| | |
|---|---|
| **ජෛව විවිධත්වයට සම්බන්ධ නඩු** | 28 |
| **පෞරාණික භාණ්ඩ සම්බන්ධ නඩු** | 10 |
| **ජෛව විවිධත්වයට සම්බන්ධ නඩු (වෙනත් ශාඛා වල ලියිපදිංචි කරන ලද )** | 03 |
| **පෞරාණික භාණ්ඩ සම්බන්ධ නඩු (වෙනත් ශාඛා වල ලියිපදිංචි කරන ලද)** | 03 |

# පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය

දැනට රටේ බලපැවැත්වෙන රෙගුලාසි හා ප්‍රමිතිවලට අනුකූලව ආනයනික භාණ්ඩවල තත්ත්වය පාලනය හා අධීක්ෂණය කිරීමේ අදහසින් 2011 දී පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය ස්ථාපිත කරන ලදී. ආනයනික හා අපනයනික භාණ්ඩවල බුද්ධිමය දේපල අයිතීන් සම්බන්ධ නීති බලාත්මක කරන ශ්‍රී ලංකා රේගුවේ කේන්ද්‍රීය ස්ථානය ලෙස පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය ක්‍රියාත්මක වේ. ජාත්‍යන්තර සම්මේලනවලදී ගන්නා තීන්දු හා තීරණ මත නීති හා බලාත්මක කිරීම තුළින් වෙනත් සම්බන්ධිත ආයතනවල සහයෝගීතාවය හරහා පරිසරය ආරක්ෂා කිරීමට ද පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය දායක වේ.

ප්‍රධාන කාර්ය භාරයන්

1. බුද්ධිමය දේපළ පනත, ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යංශ පනත, සුවඳ විළවුන්, උපකරණ හා ඖෂධ පනත, පාරිභෝගික සේවා අධිකාරි පනත, නීති උල්ලංඝනය කිරීම් හා වංචා වළක්වා ගැනීම සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා ආරක්ෂක අමාත්‍යාංශය නියම කර ඇති රේගුවට සම්බන්ධ නීති, අණපනත්වල අවශ්‍යතාවයන් බලාත්මක කිරීම. ඉහත අධිකාරි බලයන්ගෙන් ආවරණය වන සියළුම ආනයන රේගුවෙන් නිදහස් කර ගැනීමට පෙර පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය (CPU) වෙත යොමු කිරිම අවශ්‍යතාවයකි.
2. මෙම අරමුණ උදෙසා ඉහත සඳහන් අධිකාරි ආයතන වෙනුවෙන් සකස් කරන ලද ඇපකර එක් එක් ආනයනකරු වෙනුවෙන් ලියාපදිංචි කිරීම සඳහා ලේඛණ පවත්වා ගෙන යෑම.
3. අදාළ අධිකාරී ආයතනවලින් පැනවූ රෙගුලාසි ක්‍රියාත්මක වන පරිදි රේගු පටිපාටි යාවත්කාලීන කිරිම.
4. අවශ්‍යතාවයන් පැන නැගුණ විට භාණ්ඩ පරීක්ෂණ අංගන සඳහා පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශයේ නිලධාරීන් අනුයුක්ත කිරීම.
5. මෙතෙක් හඳුනාගෙන ඇති රේගු නීතියට සම්බන්ධ වෙනත් අණ පනත්වල සඳහන් රෙගුලාසි සමාලෝචනය කිරීම
6. ඉහත ක්‍රියාකාරකම්වලට අදාළ වෙනත් අණ පනත් සමග කියැවෙන රේගු ආඥා පනත ප්‍රකාර නීති බලාත්මක කිරීම.

## 2013 දී මෙහෙයවූ නඩු

| මාසය | භාණ්ඩ විස්තරය | දඩ මුදල් |
|---|---|---|
| ජනවාරි | (දත් බෙහෙත්) දන්තාලේප/පිහන් ගඩොල්/විදුලි ජෝගු | රු. 580,000 |
| පෙබරවාරි | ගැල්වනයිස් කම්බි දඬු/බැටරි/මහන නූල් | රු. 145,000 |
| මාර්තු | පිහන් ගඩොල්/පුයර (Skin Powder)/ පිහන් භාණ්ඩ (Porcelain) | රු. 932,000 |
| අප්‍රේල් | පිහන් ගඩොල් | රු. 416,000 |
| මැයි | පිහන් භාණ්ඩ/ ගඩොල්/ලාම්පු | රු. 570,000 |
| ජුනි | ගඩොල්/බැටරි/පංකා/උණු වතුර බෝතල් | රු. 425,000 |
| ජුලි | විදුලි ජොග්ගු/පංකා/පිහන් ගඩොල් | රු.1,315,340 |
| අගෝස්තු | ගඩොල්/වානේ පයිප්ප/පංකා/මාගරින්/උණු වතුර බෝතල | රු. 5,778,371 |
| සැප්තැම්බර් | සීලිං පංකා/ජී අයි පයිප්ප/ගඩොල්/ස්වීච්/හිස් වැසුම් /මහන නූල් | රු. 2,387,925 |
| ඔක්තෝබර් | ගඩොල්/වානේ පයිප්ප/ටින්කල මාලු/සීලිං පංකා/පුයර | රු. 5,410,492 |
| නොවැම්බර් | ගඩොල්/පංකා/බැටරි/විදුලි කේතල/විදුලි ජෝගු | රු. 3,717,900 |
| දෙසැම්බර් | ගඩොල්/විදුලි ජෝග/ටින් කළ මාලු/කම්බි දඬු/උණු වතුර බෝතල්/උණු තැටි | රු. 2,942,740 |

## කාර්ය සාධන සාරාංශය 2013

| | |
|---|---|
| **ලියාපදිංචි නඩු සංඛ්‍යාව** | **297** |
| වරද තහවුරු කර දඩුවම් පැනවූ නඩු සංඛ්‍යාව | 204 |
| අවසන් කළ නඩු සංඛ්‍යාව | 246 |
| දඩ හා අහිමි කිරීම් මගින් එකතු කර ගත් මුදල | රු.30,999,180 |
| බුද්ධිමය දේපළ අයිතීන් සම්බන්ධ අධිකරණ නඩු | 4 |
| මෙහෙයවන ලද සම්පූර්ණ ශ්‍රී .ල.ප්‍ර.කා. (SLSI) සටහන්කර | 3852 |

# පශ්චාත් නිශ්කාෂණ හා විගණන අංශය

හැඳින්වීම

පශ්චාත් නිශ්කාශන විගණනය යනු යම්කිසි භාණ්ඩ තොගයක් රේගුවෙන් නිදහස් වූ පසුව සිදු කරන විගණනය පාදක කරගත් රේගු පාලනයකි. මෙවැනි විගණනයක අවශ්‍යතාව වන්නේ රේගු සටහන්කරවල නිරවද්‍ය බව හා නීත්‍යානුකූල භාවය සොයා බැලීමටත්, ව්‍යාපාරිකයන්ගේ වාණිජ දත්ත ව්‍යාපාර ක්‍රමවේද හා සටහන් වාර්තා නිරවද්‍යය ද යන්න අනාවරණය කර ගැනීමටත්ය. මෙවැනි විගණනයක් ව්‍යාපාරිකයාගේ පරිශ්‍රය තුළම කළ හැකි වන අතර, එක් එක් ගණුදෙනුවක් සඳහා කරනු ලබන විගණන "ගණුදෙනුව පදනම් කරගත්" යන නමින් හඳුන්වන අතර, යම්කිසි කාල පරාසයක සිදු කරන ආනයන හෝ අපනයන ආවරණය කරන විගණන "සමාගම පාදක කරගත්" නමින් හඳුන්වයි.

අවදානම් විශ්ලේෂණයෙන් හඳුනාගත් භාණ්ඩ හා ව්‍යාපාරිකයන් ඉලක්ක කරගෙන එකින් එක වෙන් වෙන් වශයෙන් ගත් නඩු පදනම් කරගෙන පශ්චාත් නිශ්කාෂණ විගණන ක්‍රියාත්මක කළ හැකි අතර, වාර්ෂික විගණන වැඩසටහන් යටතේ සැළසුම්ගත විධිමත් ක්‍රමයකින් ද එය ක්‍රියාත්මක කළ හැක. තෝරාගත් ආර්ථික ක්‍රියාකරුවන්ට විශේෂත්වයක් පිරි නැමීමේ ක්‍රමවේදයක් ලෙසට ද මෙම විගණන භාවිතා කළ හැක.

පශ්චාත් නිශ්කාෂණ හා විගණන අංශය (PCAB), ජගත් රේගු සංවිධානයේ (WCO), මිල පිරික්සුම් එකඟතා ගිවිසුම යටතේ පහසුකම් සැලසීම සඳහා මිල පිරික්සුම් අංශය යටතේ වසර 2000 දී මුලින්ම පිහිටුවන ලදී. ඒ සඳහා පශ්චාත් විගණන හා නෛහාර ලේඛන අංශය **(PAMU),** හා විගණන පිරික්සුම් අංශය **(ALID)** යන අංශ දෙක අන්තර්ග්‍රහණය කරන ලදී.

රේගු දෙපාර්තමේන්තුවේ නව ආයතනික ව්‍යුහය ක්‍රියාත්මක වීමත් සමග මිල පිරික්සුම් අංශයේ කොටසක් වශයෙන් ක්‍රියාත්මක වූ පශ්චාත් නිශ්කාෂණ හා විගණන ඒකකය නීති බලාත්මක කිරීම් පර්ෂදයේ නව අංශයක් ලෙස උත්ශ්‍රේණිගත කරන ලද අතර, පශ්චාත් නිශ්කාෂණ හා විගණන අංශය වශයෙන් නම් කරන ලදී.

රේගුවේ නිශ්කාෂණ ක්‍රියාවලියේ ඇති ප්‍රමාද දෝෂ හා සිදු කරන වංචා පාලනය කිරීම පිණිස හා ව්‍යාපාරික හවතුන්ට පහසුකම් සැලසීම යන කරුණු මුල් කරගෙන පවතින ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම් වස් අවදානම් කළමනාකරණ ඒකකයක් **(RMU)** පිහිටුවීමට තීරණය කරනලදී.

අවදානම් කළමනාකරණයේ ගුණාංග ක්‍රියාත්මක කිරීම හා රේගු නිශ්කාෂණ ක්‍රියාවලියේ පහසුකම් සලසන ලද ක්‍රියාදාමය හඳුන්වා දීම මගින් ව්‍යාපාරික ප්‍රජාවගේ තත්ත්වය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා **PCAB** සහ **RMU** ඒකක දෙක සහාය සේවා පර්ෂදය යටතේ ක්‍රියාත්මක වන එක අංශයකට ගෙන ඒමට තීරණය කරන ලදී. එමගින් **PCAB**, **RMU** යන ශාඛා දෙක 2013 සැප්තැම්බර් මස 26 දින සිට "අනුගත වීමේ හා පහසුකම් සැලසීමේ අංශය" යටතේ ක්‍රියාත්මක වේ. **(DOPL 883)**

මූලික අරමුණු

(අ) පසුගිය යම් කාලසීමාවක් තුළ රේගු සටහන්කරවල නීත්‍යානුකූල භාවය හා නිරවද්‍යතාව පරීක්ෂා කිරීම

(ආ) වැරදි රේගු සටහන්කර සංශෝධනය කිරීම සඳහා විගණන ලාභීන්ට නිර්දේශ ලබා දීම

(ඇ) විගණන ලාභීන් රේගු නීතිය හා රෙගුලාසිවලට අනුගතවීම වැඩි කිරීමට පෙළඹවීම

(ඈ) අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට යෙදවුම් ලබාදීම

**මූලික අරමුණු**

1. සියලු රේගු සටහන්කරවල වොරන්ට් පිටපත සැලසුමකට අනුව එකතු කිරීම, ගබඩා කිරීම හා ආරක්ෂා කිරීම
2. වොරන්ට් පිටපත හා සම්බන්ධ අනෙකුත් ලියකියවිලි පරීක්ෂා කිරීම හා ඒවායේ දත්ත විශ්ලේෂණය කිරීම
3. විගණනයට භාජනය වන්නන් තේරීම
4. විගණන පැවැත්වීම
5. සිදුවන වංචා සහ හිඟ බදු සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම
6. ඉදිරි වැඩි දියුණු කිරීම් සිදු කිරීම සඳහා විගණන ක්‍රියාවලිය විමර්ශනය කිරීම
7. 'Asycuda World' ක්‍රියාපිළිවෙල යටතේ ලබා දෙන e-නෞභාර ලේඛන පරීක්ෂා කිරීම
8. ආපසු දෙන මුදල් හැකි ඉක්මණින් ලබාදීම

පශ්චාත් නිශ්කාශන විගණනය යටතේ පරීක්ෂා කරන අයිතම

| බදු මූලය සම්බන්ධ අයිතම | බදු අනුපාත සම්බන්ධ අයිතම | බදු ප්‍රමාණය සම්බන්ධ අයිතම | අනෙකුත් |
|---|---|---|---|
| වටිනාකම<br>ප්‍රමාණය<br>මුදල් වර්ගය<br>විනිමය අනුපාත | වර්ගීකරණය<br>සාමාන්‍ය බදු අනුපාත<br>වරණීය බදු අනුපාත | නිදහස් කිරීම්<br>යුක්ති සාධන ප්‍රමාණය<br>බදු ගණනය කිරීමේ<br>නිරවද්‍යතාවය | සීමා කිරීම්<br>තහනම් කිරීම්<br>ආනයන බලපත්‍ර<br>IPR<br>CITES |


ඉහත දැක්වෙන අයිතම පශ්චාත් නිශ්කාශන විගණනයට පෙර නිශ්කාශන අවස්ථාවේ දී හෝ නිශ්කාෂණයට පෙර අවස්ථාවල දී රේගු පරීක්ෂාවට ලක් කළ හැක. පශ්චාත් නිශ්කාෂණ විගණනයේ ප්‍රවේශය සාමාන්‍ය රේගු පරීක්ෂාවට වඩා වෙනස් අතර, එය එහි යහගුණය වැඩි කිරීමටත් දුර්ගුණය අවම කර ගැනීමටත් සිදු කරනු ලබයි. පශ්චාත් නිශ්කාෂණ විගණනය මගින් විගණනයට භාජනය වන්නාගේ රේගු නිශ්කාෂණයේ ලියකියවිලි පරීක්ෂාවට ලක් කිරීමට නිලධාරීන්ට බලය පැවරෙන අතර, ඔහුගේ පරිශ්‍රයේ දී විගණනයට ලක්වන්නාගේ ගිණුම් පොත්, වාර්තා හා අදාළ පොත්පත් පරීක්ෂාවට ලක් කළ හැක.

# පශ්චාත් නිෂ්කාශන විගණන අංශය

## 2013 වර්ෂයේ කාර්ය සාධනය (2011 හා 2012 වසරවල් හා සසඳමින්)

| | 2011 | 2012 | 2013 |
|---|---|---|---|
| වසර තුළ ලියාපදිංචි කළ විගණන සංඛ්‍යාව | 44 | 47 | 93 |
| අවසන් කරන ලද විගණන සංඛ්‍යාව (කලින් වසරවල ලියාපදිංචි කළ සංඛ්‍යාව දඇතුළුව) | 69 | 24 | 42 |
| විගණන මගින් සොයාගත් වැරදි සහ නියම කල දඩ | 33 | 24 | 42 |
| අයකර ගන්නා ලද දඩ මුදල් ප්‍රමාණය | රු: 42,439,788 | රු: 165,713,513 | රු: 251,181,532 |
| රාජසන්තක කළ භාණ්ඩවල වටිනාකම | NIL | රු: 278,159,754 | NIL |
| අතිරේක ආදායම් ලෙස එකතු කරගත් ප්‍රමාණය | රු: 153,764,042 | රු: 41,223,576 | NIL |

## කාර්ය සාධන සංසන්දනය –2011, 2012 හා 2013



# ආපසු ගෙවීමේ අංශය


### ආපසු ගෙවීම් හිමිකම් තත්ත්වය

පසුගිය වර්ෂයන් සමග සංසන්දනය **(2010, 2011** හා **2012)**

| වසර | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|
| අයදුම්පත්/හිමිකම් ලියාපදිංචි කළ | 149 | 76 | 186 | 165 |
| සම්පූර්ණ කළ ආපසු ගෙවීම් | 17 | 51 | 98 | 92 |
| අයදුම්පත්/හිමිකම් නිශ්ප්‍රභා කරන ලද | 03 | 01 | 02 | 06 |

### ආපසු ගෙවීම් හිමිකම් තත්ත්වය

පසුගිය වර්ෂයන් සමග සංසන්දනය **(2010, 2011** හා **2012)**




# අවදානම් කළමනාකරණ ඒකකය

## ප්‍රධාන කාර්යයන්

1. ඉහළ අවදානම් භාණ්ඩ තෝරා ගැනීම.

- පළමුවතාවට ලියාපදිංචි කළ ආනයනකරුවන්ගේ විස්තර ලබා ගැනීම. (from 01st of May to November 20th and 21st of November to 9th of January)
- දැනට පවතින ඉහළ අවදානම් භාණ්ඩ පිළිබඳව පසු දත්ත ගවේෂණය කිරිම. (HRC)
- පැවති HRC නාමාවලිය ඉවත් කිරිම.
- නව HRC නාමාවලිය සැකසීම.
- අළුතින් එකතු කළ HRC ආනයනකරුවන් අධීක්ෂණය.

**2.** **දිගු කාමරයේ සීඝ්‍ර මාර්ග ප්‍රලේඛන වැඩසටහන**

- හඳුනාගත් අනුකූල ව්‍යාපාරිකයන් සඳහා දිගු කාමරයේ කොළ වැනල ප්‍රලේඛන පහසුකම.
- අනුකූලතා ව්‍යාපාරිකයන් ඔවුන්ගේ අභ්‍යන්තර ක්‍රමවේදයන් ගිණුම්කරණ ක්‍රමය සහ අනෙකුත් අනුකූලතා සංවේදී විෂයයන් හා විචල්‍යයන් තක්සේරු කිරීම සඳහා සියුම් ප්‍රශ්නමාලාවක් සැකසීම.
- යෝජිත වැඩසටහන ගැන ඉහත සඳහන් සමාගම්වල නිලධාරීන් දැනුවත් කිරීම.
- දිගු කාමරයේ රේගු සටහන්කර ක්‍රියාවලිය සඳහා Asycuda word system තුළට එම සමාගම්වල TiN අංක ඇතුලත් කිරීම.

**3.** **ආදායම් පර්යේෂණ**

- යෝජිත ආදායම් පර්යේෂණ වාර්තාවේ අන්තර්ගතයේ හා විෂය පථයේ ආකෘතිය සැකසීම.
- එක් එක් අංශවලින් එකතු කරනු ලබන අමතර අයකර ගැනීම් දඩමුදල් හා රාජ සන්තක කිරීම් යනාදිය සම්බන්ධයෙන් ආකෘති පත්‍රයක් සකස් කිරීම.
- වාර්තාවල සවිස්තර විශ්ලේෂණ සඳහා පරිගණක දත්ත ගබඩාවෙන් ආනයන දත්ත ලබාගැනීමට පරිගණක දත්ත ගබඩා විමසුමක් සකස් කිරීම.

**4.** **පරිගණකගත මිළ පිරික්සුම් සම්බන්ධ දත්ත ගබඩාවක් පිහිටුවීම.**

- භාණ්ඩවල විස්තරය/ ස්වභාවය අනුව ඒවායේ සංයෝජිත වර්ගීකරණය අයිතම පර්ෂදීකරණය භාවිත කිරීම.
- දැනට ක්‍රියාත්මකව පවතින ASYCUDA World මොඩියුලයට එදිරිව යෝජිත මිළ පිරික්සුම් සම්බන්ධ දත්ත ගබඩාවක් සඳහා සාවද්‍යතා වාර්තාවක් සකස් කිරීම.
- ඉන්දියානු නියෝජිත මණ්ඩලය විසින් ඉදිරිපත් කළ දත්ත උපයෝගී කර ගනිමින් දැනට පවතින පර්ෂදීකරණය භාවිතා කිරීම.

# මධ්‍යම විමර්ශන අංශය

හැඳින්වීම.

රේගු නීතිය හා අනෙකුත් අදාළ නීතීන් උල්ලංඝනය කිරීම, 2010-2015 දෙපාර්තමේන්තු ක්‍රම උපාය හා සම්බන්ධ අරමුණු අනුව අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල මගින් අල්ලා ගනු ලැබූ රේගු නීතිය හා අනෙකුත් සම්බන්ධ නීති උල්ලංඝනය කිරීම ගැන විමර්ශන පැවැත්වීම හා මධ්‍යම නඩු ලේඛනය පවත්වා ගෙන යාම මධ්‍යම විමර්ශන අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීම වේ.

එමනිසා, මූලික අරමුණ වන්නේ,

- සියළු රේගු විමර්ශන මධ්‍යගත කිරීම හා වෘත්තීමය ආකාරයට පැවැත්වීම,
- ඵලදායී හා කාර්යක්ෂම ආකාරයට මධ්‍යම නඩු ලේඛනය පවත්වා ගෙන යාම,
- මධ්‍යගත තැගි මුදල බෙදීම හා විනිවිද පෙනෙන ආකාරයට පැවැත්වීම.

ඵලදායී ලෙස දෙපාර්තමේන්තු මෙහෙවර සඳහා සහයෝගය දීම.

**ප්‍රධාන කාර්යයන්**

- අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල මගින් කෙරෙන නඩු විමර්ශනය(විශේෂ කාර්ය හා පරීක්ෂණ සහ නිවාරණ අධ්‍යක්ෂ මණ්ඩල හැර) අනාවරණය සහ විමර්ශනය රේගු නීතිය උල්ලංඝනය කිරීම සඳහා මධ්‍යම නඩුලේඛනය පවත්වා ගෙන
- රේගු නීති උල්ලංඝනයවීම් අල්ලා ගැනීම හා විමර්ශනය කිරීම.
- මධ්‍යම නඩු ලේඛනය පවත්වා ගෙන යාම.
- විශේෂ කාර්ය පරීක්ෂණ ඒකකය සහ නිවාරණ ඒකකය මගින් කරන විමර්ශන අභිමන්ත්‍රණය කිරීම.
- අවසන් වූ නඩු මධ්‍යම නඩු ලේඛනය තුළ යාවත් කාලීන කිරීම.
- සියළුම අවසන් වූ නඩුවල ත්‍යාග මුදල දෙපාර්තමේන්තුව තුළ බෙදා හැරීම.

## 1. සාමාන්‍ය වර්ධනීය තත්ත්වයන්

A. <u>CIB විමර්ශණ</u>

a. අධ්‍යක්ෂ මණ්ඩල මගින් සොයා ගත් නඩු සංඛ්‍යාව - 90

b. අවසන් වූ නඩු සංඛ්‍යාව - 67

I. අයකර ගත් දඩ මුදල - රු.325,000.00

II. තවදුරටත්/අඩු කරනු ලැබූ අභිමි කිරීම - රු.394,099,008.00

III. අතිරේක සටහන්කර මගින් අයකරවා ගත් මුදල - නැත

IV. විකුණුම් මගින් ලද මුදල - රු.21,216,796.00

B. <u>අනෙකුත් අංශවල විමර්ශණ</u>

a. එම කාලය තුළ අනෙකුත් ශාඛා මගින් විමර්ශණය සඳහා CIB වෙත එවන ලැබූ ලිපිගොණු සංඛ්‍යාව

C. <u>මධ්‍යම නඩු ලේඛනය පවත්වා ගෙන යාම (CCR)</u>


a. CCR වෙත ලේඛනගත කිරීමට ලැබුණු ලිපිගොනු සංඛ්‍යාව - 7,158

b. CCRහි යාවත් කාලීන වූ නඩු - 5,427


c. නිර්දේශ කර තැගි මුදල් ලැයිස්තු ගණන - 204

**2.** කාර්ය සාධන සංසන්දනය


| Year | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|
| CIB මගින් සොයා ගනු ලැබූ නඩු ගණන | 23 | 48 | 62 | 90 |
| CIB මගින් අවසන් කරනු ලැබූ නඩු ගණන | 5 | 21 | 64 | 67 |
| “NFA” ලෙස අවසන් වූ නඩු ගණන | 2 | 8 | 3 | 24 |
| දඩය | 9,315,692 | 66,388,000 | 32,880,000 | 325,000 |
| තවදුරටත් අඩු කරනු ලැබූ අභිමි කිරිම |  | 8,364,450 | 221,361,350 | 394,099,008 |
| විකුණුම් මගින් ලද ආදායම |  | 6,130,000 | 289,728,263 | 21,216,796 |
| එකතුව | **9,315,692** | **80,882,450** | **543,969,613** | **415,640,804** |
| CCR හි ලේඛන ගත කරනු සම්පූර්ණ නඩු ගණන | 6096 | 4210 | 5828 | 7158 |
| CCR යාවත් කාලීන කළ නඩු ගණන | 4490 | 2536 | 4434 | 5427 |
| නිර්දේශ කරනු ලැබූ තෑගි මුදල් ලැයිස්තු ගණන | 168 | 154 | 179 | 204 |




## මධ්‍යම නඩු ලියාපදිංචිය




## ලැබීම් ආදායම






**3.** **CIB කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනයෙහි කැපී පෙනෙන අවස්ථා**

A. <u>සුවිශේෂී නඩු</u>

a. CIB/INV/29/2004 – 2005 දී පැවරූ නඩුව මගින් අවුරුදු 10 ක් තිස්සේ නොගෙවූ රු. මිලියන 208 ක් වූ දඩ මුදලක් CIB කාර්ය මණ්ඩලය මගින් අය කර ගන්නා ලදී.

b. CIB/INV/027/2013/CCR/1724 –"D" අංශය මගින් (**D/INV/087/2013)** ඉදිරිපත් කරන ලද නීති විරෝධීව ගෙන්වූ වාහන 12 ක් වෙනුවෙන් කළ දඩ මුදල ලෙස රු. මිලියන 30 ක මුදල අයකර ගන්නා ලදී.

CIB/INV/14/2013 –CIB කාර්ය මණ්ඩලය අධ්‍යක්ෂ ජනරල්තුමා විසින් භාර දෙනු ලැබූ නීති විරෝධී ලෙස මෙරටට ගෙන්වූ මධ්‍යසාර ලීටර් 65,100 අභිමි කර, රු. මිලියන 33 ක දඩයකට ලක් කිරීමෙන් අවසන් කරන ලදී.

# නීති කටයුතු අංශය

## හැඳින්වීම

අධ්‍යක්ෂවරයෙකු යටතේ පාලනය වන මෙම අංශයට එක් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක්, රේගු අධිකාරිවරුන් දෙදෙනෙක්, එක් නියෝජ්‍ය රේගු අධිකාරිවරයකු සහ සහකාර රේගු අධිකාරිවරුන් දෙදෙනෙකු අයත්ය. අධිකරණ නඩු හා සම්බන්ධ පරිපාලනය හා අධීක්ෂණය සහ නීතිපති දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කිරීම මෙම අංශය මගින් කරගෙන යනු ලබයි.

**ප්‍රධාන කාර්යයන්**

01. අනෙකුත් අංශ සඳහා නීති උපදෙස් ලබාදීම.
02. දෙපාර්තමේන්තුව වෙනුවෙන් නීතිපති උපදෙස් ලබාගැනීම.
03. රේගු නීතිය නිරන්තරව නිරීක්ෂණය කිරීම.
04. අනෙකුත් රේගු පරිපාලනය සම්බන්ධ ගැටළුවලට සහාය වීම.

## ලියාපදිංචි කළ නඩු සංඛ්‍යාව

| | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික් අධිකරණ නඩු | - | - | - | - | - | - | - | 01 | 03 | |
| මහේස්ත්‍රාත් අධිකරණ නඩු | | | | | | | | | | 7 |
| මහාධිකරණ නඩු | - | 01 | - | - | - | - | - | 01 | 06 | 5 |
| අධිකරණ අභියාචනා අයදුම්පත් | 51 | 89 | 107 | 36 | 43 | 18 | 18 | 20 | 51 | 9 |
| ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත් | 08 | 11 | 06 | 16 | 14 | 10 | 15 | 08 | 09 | 16 |
| මහාධිකරණ අයදුම්පත් | - | - | 02 | 02 | - | - | - | - | - | |
| **එකතුව** | 59 | 101 | 115 | 54 | 57 | 28 | 33 | 30 | 69 | 37 |

## අවසන් වූ නඩු සංඛ්‍යාව

| | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික් අධිකරණ නඩු | - | - | - | - | - | - | - | - | - | |
| මහේස්ත්‍රාත් අධිකරණ නඩු | | | | | | | | | | |
| මහාධිකරණ නඩු | - | 01 | - | - | - | - | - | 01 | - | 1 |
| අධිකරණ අභියාචනා අයදුම්පත් | 03 | 07 | 06 | 102 | 18 | 03 | 28 | 21 | 6 | 4 |
| ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත් | 04 | 04 | - | 07 | 02 | 02 | 11 | 10 | 3 | 5 |
| මහාධිකරණ අයදුම්පත් | - | - | - | - | - | - | - | - | - | |
| **එකතුව** | 07 | 11 | 06 | 109 | 20 | 05 | 39 | 31 | 9 | 10 |

# මධ්‍යම බුද්ධි අංශය

## හැඳින්වීම.

මධ්‍යම බුද්ධි අංශයේ වගකීම වනුයේ නිවැරදි කාලානුරූපී හා ඵලදායී බුද්ධි තොරතුරු මෙහෙයුම් තත්ත්වයේ ඒකක වලට හා ඉහළ කළමනාකාරිත්වයට ලබාදීම මගින් දෙපාර්තමේන්තුවේ පරමාර්ථ සමාජ ආරක්ෂණය හා ආදායම් අභිමිකර ගැනීමකින් තොරව ළඟා කර ගැනීමය.

මෙහි පරමාර්ථයන්:

- ඉහළම තීරණ ගැනීමේ මට්ටම් වලට බුද්ධි තොරතුරු සැපයීම.
- භාණ්ඩ හා මගීන් නිෂ්කාශනය සහ නියාමනයට අදාළ ක්‍රියාවලීන්ට බුද්ධි තොරතුරු සැපයීම.
- දේශසීමා වලදී කෙරෙන භාණ්ඩ හුවමාරුවේදී ජාතික ආරක්ෂාව පිළිබඳව වගකීම.
- ජාතික හා ජාත්‍යන්තර බුද්ධි තොරතුරු එක්රැස් කිරීමේ හා බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.

**ප්‍රධාන කාර්යයන්**

1. තොරතුරු එක්රැස් කිරීම
2. පැය 24 පුරා ක්‍රියාත්මක මහජන තොරතුරු ලබාගැනීමේ ඒකකය *(PIRD).*
3. දත්ත පද්ධති පවත්වාගෙන යාම හා භාවිතයට ගැනීම
4. බුද්ධි තොරතුරු සකස් කිරීම හා විශ්ලේෂණය කිරීම
5. දේශීය වශයෙන් කාර්යාංශය අතරත් අභ්‍යන්තර වශයෙන් අනුමත නියම කරන ලද ආයතන සමගත් බුද්ධි තොරතුරු බෙදා හැරීම
6. ජාත්‍යන්තර රේගු තොරතුරු පද්ධති සම්බන්ධීකරණය කිරීම
7. ආසියා ශාන්තිකර කලාපයේ බුද්ධි තොරතුරු සම්බන්ධීකරණ කාර්යාලයේ කලාපීය ජාතික සම්බන්ධක ස්ථානය ලෙස ක්‍රියා කිරීම හා ජාත්‍යන්තර බලාත්මක කිරීමේ සම්බන්ධීකරණයේ මුඛ්‍ය ස්ථානය ලෙස කටයුතු කිරීම
8. ජාතික ආරක්ෂාව සම්බන්ධ කටයුතුවලදී සම්බන්ධීකරණ ඒකකය ලෙස කටයුතු කිරීම
9. කොළඹ වරායේ බහාලුම් ආරක්ෂක මුලපිරීම (Container Security Initiative) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
10. දෙපාර්තමේන්තුවේ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙකු ලෙස සහභාගි වීම
11. භාණ්ඩ තොග ලැයිස්තු සමාලෝචනය කරමින්, බුද්ධි තොරතුරු පාදක අධි අවදානම් භාණ්ඩ තොග අල්ලා ගැනීම හා විමර්ෂණ සිදු කිරීම
12. රේගු පරීක්ෂණ සිදුකිරීම හා වැරදිකරුවන්ට එරෙහිව නඩු පැවරීම
13. පෙර වැරදිකරුවන්ගේ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම (POD)
14. CEN දත්ත පද්ධතිය පවත්වාගෙන යාම
15. ලියාපදිංචියට පෙර භාණ්ඩ තොග ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර පරීක්ෂා කිරීම (2012 සිට)
16. CHA දත්ත පද්ධතිය පවත්වාගෙන යාමට හා CHA අයදුම්පත්‍ර පරීක්ෂා කිරීම සඳහා නිෂ්කාශන ඒජන්තවරුන්ගේ තොරතුරු ඒකරාශී කිරීම.

**2013** කාර්ය සාධනය

ලබාගත් හා බෙදාදුන් තොරතුරු - පසුගිය වර්ෂ සමඟ සැසඳීම

| විස්තරය | 2011 | 2012 | 2013 |
|---|---|---|---|
| **PIRD** හරහා ලබා ගත් තොරතුරු සංඛ්‍යාව | 60 | 60 | 45 |
| වෙනත් මූලාශ්‍ර මගින් (ෆැක්ස්, ලිපි, ප්‍රවෘත්ති) | 44 | 04 | 5 |
| එකතුව | 104 | 64 | 50 |
| අනෙකුත් අංශ සමග බෙදා හදා ගත් තොරතුරු සංඛ්‍යාව | | | |
| අවශ්‍ය පියවර ගැනීම සඳහා වෙනත් අංශ වෙත බෙදා හරින ලද තොරතුරු සංඛ්‍යාව | 27 | 26 | 23 |
| කළමනාකාරිත්වයට ඉදිරිපත් කරන ලද ක්‍රමෝපායික තක්සේරු සංඛ්‍යාව | - | - | - |

බෙදා හරින ලද බුද්ධි තොරතුරු

| | 2011 | 2012 | 2013 |
|---|---|---|---|
| **CIU** විපරම් | 06 | 11 | 17 |
| **RILO, WCO, CEN** විපරම් | 01 | 01 | නැත |

බෙදා හරින ලද මාසික “බුද්ධි තොරතුරු විශ්ලේෂණ වාර්තා

| | 2011 | 2012 | 2013 |
|---|---|---|---|
| **CIU** බුද්ධි විශ්ලේෂණ වාර්තාව | නැත | නැත | නැත |
| **RILO** මාසික එකතුව | 03 | නැත | නැත |
| විවිධ අංශ වෙත ඉදිරිපත් කරන ලද පෙර වැරදිකරුවන්ගේ තොරතුරු සංඛ්‍යාව | 1730 | 2091 | 397 |

බුද්ධි තොරතුරු කාර්යාංශය විසින් සම්බන්ධිකරණය කරන ලද ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සිදු කරන ලද භාණ්ඩ සොයා ගැනීම්

| | 2011 | 2012 | 2013 |
|---|---|---|---|
| ජාතික ආරක්ෂක අවශ්‍යතාවයන් වෙනුවෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සිදු කරන ලද සොයාගැනීම් සංඛ්‍යාව (රේගු බුද්ධි තොරතුරු කාර්යාංශය විසින් සම්බන්ධිකරණය කරන ලද විමර්ෂණ) | 407 | 392 | 74 |
| නාවික හමුදා සොයාගැනීම් හරහා හමු වූ, සිද්ධි සංඛ්‍යාව | Nil | Nil | Nil |

## CHA සහ VAT ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව (2012.04.26 සිට)

| | 2013 |
|---|---|
| රේගු නිවාස නියෝජිත බලපත්‍ර අළුත් කිරීම් | 3500 |
| ශ්‍රී.ලං.ව.අ. වාප්පු බලපත්‍ර (**A** සාමාර්ථය) (ආසන්න වශයෙන්) | 2000 |
| **VAT** ලියාපදිංචි කිරීම, ආනයනකරුවන්ගේ ලේඛන පරීක්ෂාව | 1442 |

## දේශීය සහ විදේශීය විමර්ෂණ හා බුද්ධි තොරතුරු නියෝජිතායතන සමග සම්බන්ධීකරණය

| නියෝජිතායතනය | ඉල්ලීම් සංඛ්‍යාව | | | ලැබුණු පිළිතුරු සංඛ්‍යාව | | | නොලැබුණු පිළිතුරු සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **2011** | **2012** | **2013** | **2011** | **2012** | **2013** | **2011** | **2012** | **2013** |
| **RILO-** චීනය | | | | | | | | | |
| **DRI-** ඉන්දියාව | 21 | 16 | 04 | 12 | 07 | | 09 | 09 | 04 |
| ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය | 14 | 10 | 08 | 14 | 07 | 06 | | 03 | 02 |
| එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය | 03 | 02 | 04 | 02 | 01 | | 01 | 01 | 04 |
| **HM Customs UK** | 01 | | | | | | 01 | | |
| ඕස්ට්‍රේලියා | 01 | 03 | | 01 | | | | 03 | |
| සිංගප්පූරුවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය | 01 | 01 | 01 | 01 | | | | 01 | |
| **UAE** | 01 | | | 01 | | | | | |
| ජපාන රේගු දෙපාර්තමේන්තුව | | 01 | | | 01 | | | | |
| නවසීලන්ත අභ්‍යන්තර ඒජන්ත කාර්යාලය | | | | | | | | | |
| පාකිස්තාන රේගුව | 03 | | | 03 | | | | | - |
| ඉන්දුනිසියානු රේගුව | | | | | | | | | |
| මාලදිවයින් රේගුව | 01 | 01 | | | 01 | | 01 | | |
| තායිලන්ත රේගුව | 01 | 02 | | | 02 | | 01 | | |
| නේපාල රේගුව | | | | | | | | | |
| ඉරාන රේගුව | | | | | | | | | |
| මලයාසියා රේගුව | | | 01 | | | | | | 01 |
| වියට්නාම් රේගුව | 01 | | 01 | | | | 01 | | 01 |
| **ICE ATTACHE** නව දිල්ලියෙහි ඇමෙරිකානු තානාපති කාර්යාලය | 01 | | | | | | 01 | | |
| තායිලන්ත තානාපති කාර්යාලය | | | 04 | | | | | | |
| ජපාන තානාපති කාර්යාලය | | | | | | | | | |

# පොදු වර්ධනයන්

**අ. CSI වැඩසටහනේ ප්‍රගතිය**

- අ. පරීක්ෂා කරන ලද සංක්‍රමණික / ප්‍රතිනැව්ගත කිරීම් සංඛ්‍යාව - 264
- ආ. පරීක්ෂා කරන ලද දේශීය බහලුම් සංඛ්‍යාව - නැත
- ඇ. භෞතික වශයෙන් පරීක්ෂා කරන ලද බහලුම් සංඛ්‍යාව - නැත
- ඈ. විෂමතා සහිත බහාලුම් සංඛ්‍යාව - නැත

**ආ. නීතිය ක්‍රියාත්මක කිරීමේ කාර්යසාධනය**

- a. ආරම්භ කරන ලද නඩු සංඛ්‍යාව - 61
- b. අවසන් කරන ලද නඩු සංඛ්‍යාව - 23
- c. දඩ ලෙස උපායගත් මුදල් ප්‍රමාණය - රු. 14,321,764/-
- d. විකුණුම් කටයුතු වලින් උපයාගත් මුදල් ප්‍රමාණය - රු. 27,234,281/-
- e. A/E ලෙස අය කර ගත් මුදල් ප්‍රමාණය - රු. 5,861,663/-
- f. රාජසන්තක කරන ලද භාණ්ඩවල වටිනාකම - රු. 320,000/-

## සුවිශේෂී කාර්යසාධනය

### A. <u>බුද්ධි තොරතුරු භාවිතයෙන් CI කාර්ය මණ්ඩලය විසින් සොයා ගනු ලැබූ විශේෂිත සිද්ධි</u>

I. වියළි හාල්මැස්සන් ලෙස ඉදිරිපත් කරමින් වියළි හාල්මැස්සන් අතර සඟවා ඩුබායි රටේ සිට නීතිවිරෝධීව ගෙන්වා නිශ්කාෂණය කිරීමට තැත් කළ සුවඳ විලවුන්, සපත්තු, සිගරට්, කෑම ඇතුළු රු. 32,576,261.00 වටිනා භාණ්ඩ තොගයක් අත්අඩංගුවට ගැනීම. ආනයනකරුට දඩ නියම කළ අතර භාණ්ඩ තොගය රාජසන්තක කරන ලදී.

II. පිළිගත් ආනයනයකරුවකු විසින් ආනයනය කරන ලද වේ ප්‍රෝටීන සම්බන්ධයෙන් කරන ලද පශ්චාත් විගණනයකදී සොයාගත් පරිදි වැරදි වර්ගීකරණයකින් පැහැර හරින ලද බදු ප්‍රමාණය මිලියන 30ක් බවට ගණනය කරන ලදී.

**වෙනත් සුවිශේෂී තත්ත්වයන්**

මෙම අංශයේ අධ්‍යක්ෂවරයා හා ජ්‍යෙෂ්ඨ අධිකාරිවරයෙකු වියට්නාමයේ පැවති RILO වාර්ෂික සමුළුවට සහභාගිවිය. එසේම මෙම අංශයට සම්බන්ධ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු කොරියාවේ පැවති RILO දේශ සීමා අතර සිදුවන අපරාධ මර්ධන වැඩසටහනකට සහභාගි වන ලදී.
කෙසේ වෙතත් නිලධාරීන්ගේ දැනුම හා දක්ෂතාවය වර්ධනය කිරීමට තවදුරටත් මෙවන් පුහුණු වැඩසටහන් අවශ්‍යව ඇත.

නාවික හමුදාව මගින් ආනයනික භාණ්ඩ පරීක්ෂාව 2013 ජුනි සිට නවතා ඇත. එමගින් නැවත නැවත පරීක්ෂාව අවම වන අතර ප්‍රමාදයන් හා අමතර වියදම් ද අවම වී ඇත.

# ආදායම් හා සේවා පරිෂදය

# ප්‍රකාශන කාර්යාංශය

## හැඳින්වීම

මෙම කාර්යාංශය "D" ශාඛාවෙන් දිගු කාමරයෙන්, රථවාහන අංශයෙන් හා කර්මාන්ත හා සේවා ලේඛන සකස් කිරීම් අංශය යන කොටස් වලින් සමන්විතය.

**ප්‍රධාන කාර්යයන්**

1. රේගු රෙගුලාසි හා අනෙකුත් ආශ්‍රිත ආඥාපනත් යටතේ රේගු ප්‍රකාශන සකස් කිරීම
2. ආනයන හා අපනයන භාණ්ඩ සම්බන්ධයෙන් නියමිත ආදායම තක්සේරු කිරීම හා එකතු කිරීම
3. වෙළඳාමේ, කර්මාන්තයේ හා පොදු මහජනතාවගේ යහපත වෙනුවෙන් රජයේ ප්‍රතිපත්ති යටතේ බදු විරාමයන් / නිදහස් කිරීම් ප්‍රදානය කිරීම හා තීරු බදු හා බදු අත්හිටුවීම
4. ආනයන හා අපනයනය වලට අදාල සියළු නෛතික අවශ්‍යතා සමග ස්වේච්ඡා අනුගත වීම තහවුරු කිරීම
5. වේගවත් නිෂ්කාශන ක්‍රියාවලී හරහා නීත්‍යානුකූල ආනයනකරුවන් / අපනයනකරුවන්ට අවශ්‍ය පහසුකම සපයා දීම

**අංශයේ මූලික අභිලාෂයන්**

මෙම අංශයේ ප්‍රධාන අභිප්‍රායයන් වන්නේ ආනයනික හා ගුදම් ගත කෙරෙන භාණ්ඩ සඳහා ප්‍රකාශන පහසුකම් සැපයීම. මෙය සපුරා ගැනීම සඳහා මෙම කාර්යාංශය මගින් පහත පහසුකම් සපයා ඇත.

i. DT1 මගින් රේගු සටහන්කර ලබාගැනීම.
ii. රේගු සටහන්කරයේ ඇති තීරුබදු සහ අනෙකුත් බදුගෙවීම් පිළිබඳ සහතික කර ගැනීම.
iii. FCL බහාලුම් SLPA අංගනයෙන් එළියට ගෙන යාමට අවසර පත්‍ර නිකුත් කිරිම.
iv. රේගු අධිකාරි/තක්සේරුකරු රේගු සටහන්කර ක්‍රියාකරවීම.
v. FCL , LCL බහාලුම් නිශ්කාෂණය කිරිම
vi. තෝරාගත් ආනයනකරුවන්ට ඉක්මන් නිශ්කාෂණ පහසුකම සපයාදීම.

"**Asycuda World**" මගින් සම්පූර්ණ ස්වයංක්‍රීයකරණය ක්‍රියාත්මක වන අතර එමගින් ආනයනකරුවන්ට පහසුවෙන් හා අප්‍රමාදව රේගු සටහන්කර කටයුතු කර ගත හැකි වේ. දැන් 2 වන මහලේ දිගු "**Asycuda**" පද්ධතිය මගින් රේගු සටහන්කර වල සියලු විස්තර අන්තර්ගත වන අතර DTI පහසුකම මගින් පරිහරණය කරන්නන්ට තමාගේ කාර්යාලයේ සිටම රේගු සටහන්කර ඇතුලත් කර හැක. භාණ්ඩ වර්ගීකරණය සම්බන්ධ කටයුතු පමණක් දැනුමැති නිලධාරීන් මඩුල්ලක් අතින් සිදු කරයි.

මෙම කාර්යාංශයේ අනෙකුත් කර්තව්‍යයන්

i. ආනයනය භාණ්ඩ නිශ්කාෂණය පහසුකිරිම.
ii. භාණ්ඩ ගුදම් ගත කිරීමට පහසුකම් සැලසීම.
iii. භාණ්ඩ වර්ගීකරණ කටයුතු හරහා ආදායම් අඩුවීම් හා විදේශ විනිමය අහිමි වීම අවම කර ගත හැක.
iv. D අංශය හරහා ආඥා පනත හා අදාළ නීති වලින් බලාත්මක කටයුතු කිරීම.
v. ආනයන භාණ්ඩ මත පනවන බදු ආදායම නියමිත පරිදි එකතු කිරීම.
vi. මුදල් අමාත්‍යාංශය අනුමැතිය ඇති ව්‍යාපෘති භාණ්ඩ නිශ්කාෂණ වලට බදු සහන ලබාදීමෙන් පහසුකම සැලසීම.
vii. බලපත්‍ර හිමියන්ට/ නීත්‍යානුකූල ආනයනකරුවන්ට තම වාහන / භාණ්ඩ ඉතා ඉක්මනින් නිදහස් කර ගෙන යාමට පහසුකම් සැලසීම.
viii. විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු/අනෙකුත් සංවිධාන/සාමාන්‍ය මහජනයාට පළාත් රේගු සටහන්කර හරහා භාණ්ඩ නිදහස් කර ගැනීමට සැලසීම.
ix. තහනම් හා සීමා කරන ලද භාණ්ඩ සඳහා බලාත්මක කිරීම් සිදු කිරීම.

ආනයනික භාණ්ඩ සඳහා රේගු සටහන්කර ක්‍රියා සන්තතිය කිසිදු පමාවකින් තොරව ඉක්මනින් සිදු කිරීමටත් රජයට නියමිත බදු ආදායම එකතු කර දීමටත් දිගු කාමරයේ නිලධාරීන් සහතික වෙයි. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, ආහාර හා බෙහෙත් වර්ග සඳහා වූ අධිකාරිය, සුවද විලවුන් උපාංග හා බෙහෙත් වර්ග සඳහා වූ අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය, පරමාණුක ශක්ති අධිකාරිය, විදුලි සංදේශ නියාමක කොමිෂම වැනි ආයතනවල අධිකාරියට යටත්ව ගෙන්වන භාණ්ඩ සඳහා එම බලපත්‍ර ලබා ගෙන තිබේදැයි අවධානයෙන් සිටීමට මෙම නිලධාරීන් වග බලා ගනී. තවද පහත අවශ්‍යතා ආනයනකරුවන් සම්පූර්ණ කර තිබේදැයි සලකා බලයි.

- භාණ්ඩ නිදහස් කර ගැනීම සඳහා භාණ්ඩ ප්‍රවාහකයාගේ අනුමැතිය.

- පරිගණක පද්ධතියේ ඇති නියමිත කේත යොදා ගනිමින් භාණ්ඩ වල සම්පූර්ණ;
- සංයෝජිත භාණ්ඩ වර්ගීකරණ නාමාවලිය පදනම් කර සෑදූ ආනයන තීරුබදු නාමාවලියට අදාලව භාණ්ඩ වර්ගීකරණය නිවැරදිව සිදු කිරීම;
- භාණ්ඩ වල සත්‍ය වෙළඳ වටිනාකම ප්‍රකාශ කිරීම;
- නියමිත විදේශ විනිමය අනුපාතය හා අදාළ මුදල් වර්ගය යොදා ගනිමින් භාණ්ඩ වල වටිනාකම ප්‍රකාශ;
- භාණ්ඩ සඳහා අනුමත බැංකුවකින් මුදල්;
- අවශ්‍ය පරිදි අදාළ අනුමැති, සහතික, බලපත්‍ර අමුණා.

ඉහත සියලුම අංශ පිළිවෙලට නිසි පරිදි සම්පූර්ණ කර ඇත්නම් අදාළ නිලධාරීන් භාණ්ඩ නිදහස් කර ගැනීම සඳහා රේගු සටහන්කර ක්‍රියාවලිය සිදු කරයි.

මෙම අංශය ප්‍රධාන ඒකක පහතින් සමන්විතයි.

A) "D" අංශය
B) දිගු කාමරය
C) මෝටර් රථ ඒකකය
D) කර්මාන්ත හා සේවා ලේඛන සැකසුම්
E) DOC මධ්‍යස්ථානය

## "D" ශාඛාව

"D" ශාඛාව කාර්යාංශයේ ලේකම් කාර්යාලය ලෙස සැලකිය හැකිය. ඓතිහාසික වශයෙන් වසර 200කට පමණ පෙර රේගු පාලක, ජනරාල්වරයා පත් කිරීමේදී ඔහු යටතේ සේවයේ නියුතු 'A' විෂයය, 'B' විෂයය යනාදී ලෙස විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ලිපිකරුවන් 4 දෙනෙකු සේවයේ යෙදී සිට ඇත. පසු කාලයේදී 'A' විෂයය දැනට පවතින මානව සම්පත් කළමනාකරණ කාර්යාංශය ලෙස (මීන් පෙර පරිපාලන ශාඛාව) විකාශය විය. "C" ලිපිකරු වරාය රාජකාරි ඉටු කළ අතර පසුව එය ශ්‍රී ලංකා වරාය අධිකාරිය නමින් වෙනමම ආයතනයක් ලෙසින් ස්ථාපිත විය. ඓතිහාසික වශයෙන් භාණ්ඩාගාරය හා රේගුව අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කළ, බදු විරාමයක් / නිදහස් ලබා දුන් හා නැව් භාණ්ඩ ලේඛන භාරගත් පැරණි "D" ශාඛාව තවමත් එම කාර්යයන්ට සමාන කාර්යභාරයක් ඉටු කරන අතර තවමත් ඒ නමින්ම හැඳින්වේ.

**ආනයනකරුවන්/සාමාන්‍ය මහජනයාට පහසුකම් සැලසීම සඳහා "D" ශාඛාව සතුව පවතී.**

01. DRA අංශය
02. බැංකු ඇපකර අංශය
03. තීරුබදු සහන අංශය
04. තොග භාණ්ඩ අංශය
05. Carnet අංශය
06. නැව් බඩු විස්තර අංශය
07. විමර්ශන අංශය
08. මෝටර් රථ බලපත්‍ර අංශය /headed by නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ (D)

"D" ශාඛාව විසින් පාලනය කරනු ලබන වැදගත් හා මුඛ්‍ය කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

1. මුදල් අමාත්‍යාංශය මගින් ලබාදෙන තීරුබදු සහන ලියාපදිංචි කිරීම.
2. පාර්ලිමේන්තුවෙන් පනවන ආදායම් සංරක්ෂණ වාර්තාව අනුව තීරුබදු සහන හා නිදහස් කිරීම් ලබාදීම.
3. තානාපති කාර්යාල සේවකයන්ට ලබාදී ඇති සහතිකයේ විදේශ කටයුතු අමාත්‍යාංශය ලබාදුන් අනුමැතිය ප්‍රකාරව .
4. විවිධ වෙළඳ ගිවිසුම් යටතේ ආනයනය කරන භාණ්ඩ සඳහා නිදහස් තීරුබදු හෝ වරණීය තීරුබදු අනුපාත ලබාදීම.
5. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ උපදේශකත්වය යටතේ රාජ්‍ය ආයතන සඳහා වූ භාණ්ඩ නිශ්කාෂණයේදී වාරික ගෙවීම් කොන්දේසි ලබාදී පහසුකම් සැලසීම.
6. භාණ්ඩ නිශ්කාෂණය සඳහා විවිධ හේතු මත රේගු සටහන්කර ඉක්මණින් ඉදිරිපත් කිරීමට නොහැකි අවස්ථාවේදී හා යම් කාර්යයක් සඳහා ආනයනය කර නැවත ප්‍රතිඅපනයනය සිදු කරන අවස්ථාවේදී ඒ සඳහා Provisional Basis යටතේ එය සිදු කිරීමට පහසුකම් සැලසීම.
7. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ තීරණය මත ප්‍රතිආනයනය කිරීමට අවශ්‍ය ව්‍යාපෘති භාණ්ඩ ලියාපදිංචිය හා අධීක්ෂණය කිරීම.
8. නාවික නියෝජිතයන් විසින් ඉදිරිපත් කරනු ලබන නැව් බඩු ලේඛන හා ඒවායේ සංශෝධන භාර ගැනීම.
9. රේගු අධ්‍යක්ෂ (Declarations)ගත් තීරණ පරිදි Provisional රේගු සටහන්කර හා අනෙකුත් කාරණා සම්බන්ධයෙන් බැංකු අණකර ඇප හෝ සංයුක්ත අණකර ඇප ලබාගැනීම.
10. CPD Carnet or ATA Carnet මත තාවකාලිකව ආනයනය කරන ලද වාහන සහ උපකරණ අධීක්ෂණය සඳහා ලියාපදිංචි කිරීම.
11. තොග භාණ්ඩ ආනයනය කිරිම, අධීක්ෂණය කිරීම හා අවශ්‍ය විටකදී අමතර අයකිරීම් ලබාගැනීම.
12. තීරු බදු සහන ලබාදුන් භාණ්ඩ පිළිබඳ වාර්තා සකස් කිරීම හා ඒවා මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම.
13. විවධ ආනයනය පාලන නීති රේගු නීති කඩකිරීම් හසු කර ගැනීම හා ඒ සම්බන්ධයෙන් රේගු ආඥා පනත යටතේ ක්‍රියා කිරීම.
14. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග සහයෝගීව කටයුතු කිරීම.

# දිගු කාමරය

ඓතිහාසික වශයෙන් ගත් කළ රේගු පරිපාලනයේදී දිගු කාමරය සැබැවින්ම දිගු කාමරයක් වූ අතර අදටත් එය දැකිය හැක්කේ දිගු කාමරයක් ලෙසය. මෙය බ්‍රිතාන්‍යයේ යටත්විජිත ලෙස පැවති බොහෝ ආසියාතික රටවල හා යුරෝපයේ ඉතා පැරණි රේගු සංවිධාන පැවති සමහර රටවල උදා; ඩෙන්මාර්කය හා නෙදර්ලන්තය දැකිය හැකි පොදු ලක්ෂණයකි.

රේගුව ප්‍රධාන වශයෙන් ආදායම කේන්ද්‍ර කොට ගත් රජයේ ආයතනයක් බැවින් මෙම දිගු කාමරයේ වැදගත්කම සුළු කොට තැකිය නොහැකිය. එවකට පැවති විශාල ප්‍රමාණයේ ඉලක්කයන් කාලය ගත වීමත් සමග සමාජ ආරක්ෂණ බැදීම් බවට පරිමානය වී ඇති නමුත් ආදායම එකතු කිරීම නම් වූ මූලික ප්‍රමුඛතාවයේ වෙනසක් සිදුව නොමැත.

රේගු ආඥාපනතේ 10 වන වගන්තිය රේගු බදු අය කිරීමට රේගුවට බලය පවරන අතර එහි 47 වන වගන්තිය අනුව භාණ්ඩ තොග අනායනය කරනු ලබන තැනැත්තා විසින් ඒ පිළිබඳ සැබෑ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු අතර එම භාණ්ඩ සම්බන්ධයෙන් ගෙවිය යුතු සියළු බදු (තීරු බදු ඇතුළුව) ආනයනකරු විසින් ගෙවිය යුතුය.

රේගුවේ දිගු කාමරය යනු, මෝටර් වාහන හැර අනෙකුත් සියළු මුහුදු භාණ්ඩ සම්බන්ධයෙන් ආනයනකරුවන් විසින් රේගු ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු ස්ථානයයි. මෝටර් රථ සම්බන්ධයෙන් රේගු සටහන්කර සකස් කිරීම දැන් පූර්ණ වශයෙන් මෝටර් රථ අංශය වෙත භාර දී තිබේ.

රේගුව විසින් රේගු බදු වලට අමතරව පහත දැක්වෙන බදු වර්ගද අය කරනු ලැබේ.

- අගය එකතු කිරීමේ බද්ද (VAT)
- වරාය හා ගුවන්තොටුපොල සංවර්ධන බද්ද (PAL)
- ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT)
- විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (SCL)
- සුරාබදු (විශේෂ විධිවිධාන)
- බදු (Cess)

මෙම බදු පහත අංශ 5 හරහා අයකෙරේ.

| | |
|---|---|
| A අංශය - | HS Code 01-44 |
| B අංශය - | HS Code 45-73 |
| C අංශය - | HS Code 74-84 |
| D අංශය - | HS Code 85-97 (මෝටර් රථ නොමැතිව) |
| E අංශය - | කෑම වර්ග, බෙහෙත්, තීරු බදු නිදහස් භාණ්ඩ, තොග භාණ්ඩ; |

රේගු සටහන්කර ඉදිරිපත් කිරීම.

ආනයනකරු රේගු සටහන්කර පිටපත් 06ක් ලබාදිය යුතුය. රේගු ආඥාපනතේ 47 වන පරිච්ඡේදය යටතේ නිකුත් කරන ලද ගැසට් නිවේදනය අනුව රේගු සටහන්කර ඉදිරිපත් කරන අවස්ථාවේදී පහත ලේඛන ඉදිරිපත් කළ යුතුය.

රේගු ආඥා පනතේ 47 වන වගන්තියෙන් නියම කරන පරිදි ආනයනය කල රේගු සටහන්කරය පිටපත් 05කින් ඉදිරිපත් කල යුතුව ඇත. (වොරන් පිටපත, Delivery පිටපත, සංඛ්‍යා ලේඛන පිටපත, Exchange පිටපත හා පාර්ශවයේ පිටපත) තවද එම පිටපත් සමග පහත ලියකියවිලි ද ඉදිරිපත් කල යුතුව ඇත.

1. නැව් භාර පත්‍රය

2. භාර දීමේ නියෝගය

3. (NFE යටතේ භාණ්ඩ ආනයනයකදී හැර බැංකුව විසින් අතින් සහතික කරන ලද ඉන්වොයිස් පත්‍රය

4. HS හඳුනා ගැනීමට අදාළ තාක්ෂණික තොරතුරු

5. නිෂ්පාදිත රට තහවුරු කිරීමට අදාළ ලියවිලි

6. ආනයන භාණ්ඩ, සීමා කල භාණ්ඩ නම් ඊට අදාළ බලපත්‍ර ආදිය;

7. නිවැරදිව පුරවන ලද ආකෘති පත්‍ර දෙකක්

8. ණයවර ලිපි, විදුලි සංදේශ හුවමාරු වැනි මුදල යන ක්‍රම ගැන ඔප්පු කිරීම.
9. ඇසුරුම් ලේඛනය

10. වෙනත් විශේෂ ලේඛන (DPL, නිදහස් තීරුබදු ;)

එක් රේගු සටහන්කරයක භාණ්ඩ කිහිපයක් විවිධ වර්ගීකරණ කේත HS අංක යටතේ ඇති විට වැඩිම තීරුබදු ප්‍රමාණයක් ගෙවීමට ඇති භාණ්ඩය අඩංගු ඒකකය අදාළ ඒකකය ලෙස තෝරා ගැනේ.

ආඥාපනතේ 12, 43 වගන්තිය හා 'ආ' උපලේඛනයට අනුව භාණ්ඩ ආනයනය කරන අවස්ථාවේදී රේගුව විසින් වෙනත් ඕනෑම නීතියක ඇතුලත් සීමාවන් හා තහනම් පැනවිය යුතුය. මෙම ඉතා පුළුල් විධිවිධානයට අනුව දැනට ක්‍රියාත්මකව පවතින පනත්, ආඥාපනත් හා රෙගුලාසි 33කට අධික සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීම රේගුවට සිදු වේ. මින් ප්‍රධානතම පනත වන්නේ 1969 අංක 01 දරණ ආනයන හා අපනයන පාලන පනතයි.

## රථ වාහන අංශය

රථවාහන අංශයේ මූලික කාර්යභාරය වන්නේ ආනයනය කරනු ලැබූ වාහන සම්බන්ධයෙන් වන CusDecs සකස් කිරිමයි. රජයේ ආදායමින් 55% ක් පමණ රේගුව විසින් එකතු කරන බැවින් හා ඉන් 27% ක් වාහන සම්බන්ධ බදු ආදායම වන හෙයින් මෙම ඒකකයේ ඇති දැවැන්ත වැදගත්කම යමෙකුට පහසුවෙන් වටහාගත හැකිය.

ACCESS ජාලයේ දැනට පවතින 'AsyCuda World' මෘදුකාංගය හා සම්බන්ධ වීමෙන් රේගුවට බැංකු සමග සම්බන්ධ වී වාහන ආනයනයේදී ප්‍රේෂණය කෙරෙන විදේශ විනිමය පරීක්ෂා කර බැලිය හැකි අතර, එසේ ආනයනය කරනු ලබන වාහන ලියාපදිංචිය පහසු කරවා ගැනීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමගද සම්බන්ධ විය හැකිය. එබැවින් රේගු බදු නොගෙවන ලද වාහන ලියාපදිංචිය වැලැක්විය හැකිය.

රේගු සටහන්කර පිළියෙල කිරීමේදී පහත කරුණු පිළිබඳ අවධානය යොමු කෙරේ.

a. ත්‍යාග හා පරණ වාහන සඳහා ආනයන බලපත්‍ර
b. තීරුබදු සහන යටතේ රාජ්‍ය සේවකයන්ට පාර්ලිමේන්තු නියෝජිතයන්ට බලපත්‍ර ලබාදීම.
c. මහ බැංකුව මගින් NRFC ගිණුම් හිමියන්ට බලපත්‍ර ලබාදීම.
d. රාජ්‍යතාන්ත්‍රිකයන්ට හා රාජ්‍ය නොවන සංවිධානවලට විදේශ කටයුතු අමාත්‍යාංශ ප්‍රධානීන්ට තීරුබදු රහිත බලපත්‍ර ලබාදීම.
e. ව්‍යාපෘති සඳහා ආනයනය කරන ලද වාහන සඳහා තාවකාලික රේගු සටහන් කර පිළියෙල කිරීම.

පහත සඳහන් තොරතුරුවල නිරවද්‍යතාව පරීක්ෂා කරනු ලැබේ,

a. පහත සඳහන් ලේඛන වල භාණ්ඩ විස්තර නිවැරදි දැයි පරීක්ෂා කර බැලීම.
   ලියාපදිංචි කිරීමේ සහතිකය
   පරීක්ෂා කිරීමේ සහතිකය

ඉන්වොයිසිය
අංගනයේ සිටින තක්සේරු වාහනය පරීක්ෂා කිරීමේ වාර්තාව.

b. වාහනයේ වයස නිවැරදිව ගණනය කිරීම.
c. නියෝජිතයාගෙන් වාහනයට ලැබෙන වටිනාකම
d. ඉන්වොයිස් පත්‍රය අනුව ඇති මුදල් වර්ගය නිවැරදිව සටහන් කර තිබීම.
e. මවිරට නිවැරදිදැයි බැලීම.
f. ප්‍රකාශ කර ඇති වාහනය නිවැරදිව ප්‍රකාශ කර ඇත්ද?,
g. ප්‍රවාහන ගාස්තු නිසි ලෙස ප්‍රකාශ කිරීම.
h. පරීක්ෂා කිරීමේ සහතිකය සමඟ ඇති අමතර අංග ගැලපීම.
i. සහනදායී ආනයන සඳහා අදාළ බලපත්‍ර අනුමත කිරීම වාහනයේ නිශ්කාෂණය කිරීම රථවාහන අංශයේ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ අනුමත කල යුතුය.

## කර්මාන්ත හා සේවා ලේඛන සකස් කිරීමේ ඒකකය

මෙම ඒකකයේ ප්‍රධාන කාර්යය වන්නේ To- බැඳුම්කර හා Ex- බැඳුම්කර සකස් කිරීම වන අතර ප්‍රතිව්‍යුහගත කිරීමට පෙර මෙය බැඳුම්කර ඒකකයේ කොටසක්ව පැවතිණ. කර්මාන්ත හා සේවා සඳහා වෙනම කාර්යාංශයක් තිබුණද, අදාල රේගු සටහන්කර සකස් කිරිම සිදු කරනුයේ ප්‍රකාශන කාර්යාංශය විසිනි.

## DOC Center

1) භාණ්ඩවලට අදාළ ලියකියවිලි රේගු අධිකාරි විසින් පරීක්ෂා කරයි.
2) බඩු භාරදීමේ හා භාරදීමේ නියෝගයේ පිටපත් ඔහු අත්සන් කරයි.
3) සම්පූර්ණ බහලුමක බඩු නිදහස් කිරීමේ ස්ථාන භාර දීමේ නියෝගය මත සහකාර රේගු අධිකාරිවරයකු පරීක්ෂා කර අත්සන් කරයි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අවසර පත්‍ර අංකය, ලොරි අංකය සහ ලොරියේ පසු පස අංකය . සහකාර රේගු අධිකාරි විසින් සටහන් කරයි.
4) සහකාර රේගු අධිකාරි විසින් ගේට්ටු අවසර පත්‍ර නිකුත් කිරීම.
5) ප්‍රධාන රේගු පරීක්ෂක විසින් දෛනික වාර්තා පිළියෙල කිරීම.

## **2013** වර්ෂය සඳහා වූ අංශයන් වලට අදාළ කාර්ය සාධනය

1) “**Asycuda World**” මගින් ඉක්මන් නිශ්කාෂණයට ඉඩ සැලසීමෙන් ආනයන වෙළඳාමට පහසුකම් සැපයීම.

2) “**Asycuda World**” මගින් තොරතුරු ලබාගැනිමෙන් දෛනික වැඩ පහසුවෙන් හා කාර්යක්ෂමව සිදු කිරිම. මගින් නිලධාරීන් මත පැටවී ඇති බර අඩු වී ඇති අතර ඔවුන්ගේ කාර්යක්ෂමතාව ඉහළ නැග ඇත.

3) **දත්ත තුළින් පිටපත් කිරීමේ කාර්යය මෙම අංශය තුළ සිදු නොකරන අතර එමගින් මහජනතාවට හා නිලධාරීන්ට තොරතුරු ලබාගැනීමේ පහසුකම් ඇත.**

4) **මෙම අංශය මගින්** 2013 වර්ෂයේ එකතු කරන ලද සම්පූර්ණ ආදායම රු**.328,807,310,194.25** ක් වන අතර රු **.56,643,360,709/-** ප්‍රමාණයක් මුළු බදු ආදායම ලෙස රාජ්‍ය ආදායමට එකතු විය.

5) තෝරා ගත් ආනයනකරුවන්ට අධිවේගී නිශ්කාෂණ ක්‍රියාවලිය හඳුන්වාදීම.

6) විද්‍යුත් නැව් බඩු ලේඛනය හඳුන්වාදී ඇත. එමගින් නාවික නියෝජිතයන්ට පිටපත් ලබාදීමකින් තොරව
සෘජුවම අන්තර්ජාලය හරහා නැව් බඩුලේඛණ ලබාදිය හැක.

7) “D” අංශයේ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ වාහන බලපත්‍ර විද්‍යුත් ඉවත් කිරීම සිදු කරයි.

# කර්මාන්ත හා සේවා කාර්යාංශය

**හැඳින්වීම**

ඓතිහාසිකව රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය වන්නේ ආනයන හා අපනයන බදුකරණයයි. යම් විශේෂ හේතූන් මත මෙම බදුකරණ ක්‍රියාවලිය 'බැඳුම්කර' ආකාරයෙන් තාවකාලිකව නතර කරනු ලබන (අත්හිටුවන) අවස්ථා තිබේ. රේගු ව්‍යවහාරයේදී 'බැඳුම්කර' යන්නෙන් අදහස් කරනුයේ ආනයනය කරන ලද බදු අය කළ යුතු භාණ්ඩ එම කාර්යය සඳහාම වෙන් වූ 'බැඳුම්කර ගබඩාවක්' ලෙසින් හඳුන්වනු ලබන ගබඩාවක ආරක්ෂිතව තැබීමයි.

අතීතයේදී මෙම 'බැඳුම්කර' ක්‍රමවේදය යොදාගනු ලැබුවේ බදු ගෙවීමකින් තොරව සිය ආනයනික භාණ්ඩ නැවත අවශ්‍ය වන තෙක් 'රැජිනගේ ගබඩාවේ' තැන්පත් කොට තබන වෙළඳුන් හට අවශ්‍ය පහසුව සැපයීමයි. ඇතැම් අවස්ථාවල වෙළඳුන් මූල්‍ය හේතු මත භාණ්ඩ බැඳුම්කරණය කිරීමටද ඉදිරිපත් වී ඇත. පසු කාලයකදී මෙම ක්‍රමය වෙනස් වී නිෂ්පාදකයන් හට බදු ගෙවීමකින් තොරව අමුද්‍රව්‍ය ගබඩාකොට තැබීමටත් එම අමුද්‍රව්‍ය යොදාගනිමින් අපනයනය සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීමට ඉඩ දීම දක්වාත් විකාශනය විය. එමගින් ඔහුට බදු ගෙවීමට අවශ්‍යතාවයක් උදා නොවුනු නමුත් රටට අවශ්‍ය විදේශ විනිමය ඉපැයීමට එය හොඳ අවස්ථාවක් විය. මෙම මූලික සංකල්පයට විවිධ එකතුවීම් සිදුව ඇති අතර එමගින් විවිධ නව කර්මාන්තයන් හට ඉදිරියට ඒමට අවස්ථාව නිර්මාණය වී තිබේ. දැනට එය රටේ කර්මාන්ත හා ආර්ථික වර්ධනයට දිරි දීමේ ක්‍රමවේදයක් ලෙස ඉදිරියට පැමිණ ඇත. මෙහි වඩාත්ම වැදගත් කාර්යය වනුයේ එය අප රට ජාත්‍යන්තර වෙළඳාමේ කරලියට ගෙන ඒමයි.

කර්මාන්ත හා සේවා අංශය ආනයනය කරන ලද භාණ්ඩ, කර්මාන්ත හ වාණිජ අවශ්‍යතාවයන් පරිදි විශේෂිත ක්‍රියා පටිපාටි යටතේ නිෂ්කාශනය කිරීම සඳහා ආරක්ෂිත / බැඳුම්කර යටතේ තාවකාලිකව ගබඩා කර තැබීමට අදාල රේගු කටයුතු සිදු කරයි. එමෙන්ම රේඛීය ආයතන සම්බන්ධීකරණය කිරීම මගින් එනම්, විශේෂයෙන්ම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග සම්බන්ධිකරණය මගින් නිෂ්පාදන / අපනයන කර්මාන්ත විවිධාංගීකරණ ප්‍රවණතාව ගවේෂණය කිරීමේ අරමුණින් කටයුතු කිරීම සඳහා එකී කර්මාන්ත ධෛර්යමත් කරයි.

**ප්‍රධාන කාර්යයන්**

වෙළඳාම පහසු කිරීමේ රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම / පරිපාලනය කිරීම මෙම කාර්යාංශය වෙත පවරා ඇති කාර්යභාරය වේ. කාර්යාංශයේ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

1. රේගු බැඳුම්කර ගබඩා කළමනාකරණය කිරීම
2. අපනයන සැකසුම් සඳහා වන තාවකාලික ආනයන හා තීරුබදු ප්‍රතිදාන පරිපාටි ආදී අපනයන පහසුකරවීමේ යෝජනා ක්‍රම කළමනාකරණය කිරීම
3. තීරු බදු රහිත සාප්පුවල කටයුතු කළමනාකරණය කිරීම
4. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපාරවලට අදාල භාණ්ඩ ආනයන / අපනයන කටයුතු කිරීමේදී එම ආයතනය සමග සම්බන්ධීකරණය කිරීම
5. බඩු ගබඩා කිරීම, තොග පාලනය, නැව් බඩු පාලනය හා ආයෝජන මණ්ඩලයේ ආනයන / අපනයන සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ පද්ධති පවත්වා ගෙන යාම සඳහා ICT කාර්යාංශය සමග සම්බන්ධීකරණය කිරීම.
6. 'විලම්බන තන්ත්‍ර' රේගු සටහන්කර. සකස් කිරීමේදී ප්‍රකාශන කාර්යාංශය සමග සම්බන්ධීකරණය කිරීම

කර්මාන්ත හා සේවා කාර්යාංශයේ ප්‍රධාන ශාඛා

1. ලේඛන ශාඛාව
2. ව්‍යාපෘති ශාඛාව
3. නියාමන හා නැවත ගෙවීමේ ශාඛාව
4. ආයෝජන මණ්ඩල සම්බන්ධීකරණ ඒකකය
5. තැපැල් තක්සේරු (කොළඹ) ශාඛාව

## ලේඛන ශාඛාව

සකස් කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව

| | 2011 | 2012 | 2013 |
|---|---|---|---|
| (අ) ප්‍රධාන කාර්යාලයේ ඇති මුළු රේගු සටහන්කර සංඛ්‍යාව | 88,096 | **95,397** | 110865 |
| (ආ) ආයෝජන පහසුකම් අංශයෙහි ඇති මුළු රේගුසටහන් කර සංඛ්‍යාව | 6,030 | 4,618 | 5,154 |

කර්මාන්ත හා සේවා අංශයේ අය කර ගැනීම්

| | 2011 | 2012 | 2013 |
|---|---|---|---|
| ආදායම් එකතුකර ගැනීම (රු. මිලියන) | 15,466 | **15,783** | 21,211.9 |
| පරීක්ෂණ ගාස්තු (රු. මිලියන) | 7.0 | 7.3 | 8.08 |

## ව්‍යාපෘති අංශය

## රේගු බැඳුම්කර ගබඩාවල වත්මන් තත්ත්වය (2013)

| | | පොදු බැඳුම්කර | පෞද්ගලික බැඳුම්කර | නිෂ්පාදන බැඳුම්කර | සීනි බැඳුම්කර | UPB Bonds |
|---|---|---|---|---|---|---|
| i | වසර ආරම්භයේදී බැඳුම්කර සංඛ්‍යාව | 6 | 49 | 6 | 4 | 8 |
| ii | වසර තුළදී නව අනුමැති සංඛ්‍යාව | - | 2 | - | - | - |
| iii | අවලංගු කිරීම් සංඛ්‍යාව | - | 2 | - | - | - |
| iv | වසර අවසානයේදී බැඳුම්කර සංඛ්‍යාව | 6 | 49 | 6 | 4 | 8 |

| | | සේවා බැඳුම්කර | Feeder Bonds | තීරු බැඳුම්කර | MCC බැඳුම්කර | එකතුව |
|---|---|---|---|---|---|---|
| i | වසර ආරම්භයේදී බැඳුම්කර සංඛ්‍යාව | 13 | 76 | 53 | 07 | **222** |
| ii | වසර තුළදී නව අනුමැති සංඛ්‍යාව | - | 4 | 3 | - | **9** |
| iii | අවලංගු කිරීම් සංඛ්‍යාව | 1 | 2 | 2 | - | **7** |
| iv | වසර අවසානයේදී බැඳුම්කර සංඛ්‍යාව | 12 | 78 | 54 | 7 | **224** |

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ තීරුබදු රහිත සාප්පුවල වෙළඳාම පිළිබඳ තොරතුරු

| | 2011 | 2012 | 2013 |
|---|---|---|---|
| **සී ට්‍රාන්ස් ඩියුටි ෆ්‍රී ෂොප් (USD)** | 1,349,906/- | 1,144,855/- | 1,246,289/- |
| **සිලෝන් පෝර්ට්ස් සර්විසස් ලිමිටඩ්. (USD)** | 647,200/- | නැත | නැත |
| **STC ජෙනරල් ට්‍රේඩින් කොම්පැණි ලිමිටඩ් . (USD)** | 703,444/- | 1,161,806/- | 1,588,401/- |
| **එඩිසන් ඉලෙක්ට්‍රිකල් ඩියුටි ෆ්‍රී** | නැත | නැත | නැත |
| **Total (USD)** | 2,407,578/- | 2,306,661/- | 2,834,690/- |

## TIEP1, TIEP 4 & IBG වැඩසටහන්වල වර්තමාන තත්ත්වය (2012)

1. මෙහෙයුම්කරුවන්

| | TIEP 1 | TIEP 4 | IBG |
|---|---|---|---|
| i. වසර ආරම්භයේදී මෙහෙයුම්කරුවන් සංඛ්‍යාව. | 927 | 493 | 215 |
| ii. වසර තුළදී එක් වූ මෙහෙයුම්කරුවන් සංඛ්‍යාව. | 74 | 24 | 10 |
| iii. වසර අවසානයේදී මෙහෙයුම්කරුවන් සංඛ්‍යාව. | 1001 | 517 | 225 |

# අධීක්ෂණ හා නැවත ගෙවීම් අංශය

ලබාගත් ආදායම

| | 2013 |
|---|---|

| | ඇපකර සංඛ්‍යාව |
|---|---|
| පිළිගත් බැංකු ඇපකර | 1929 |
| ඉල්ලා සිටි බැංකු ඇපකර | 1613 |
| පියවන ලද බැංකු ඇපකර | 1468 |
| පිළිගත් පුද්ගල ඇපකර හා ආයතනික ඇපකර | 148 |
| | |

# ආයෝජන මණ්ඩල කර්මාන්ත සම්බන්ධීකරණ අංශය

ආයෝජකයින් සංඛ්‍යාව

| | 2011 | 2012 | 2013 |
|---|---|---|---|
| වසර ආරම්භයේදී ආයෝජකයන් සංඛ්‍යාව | 190 | 214 | 293 |
| වසර තුළදී ලියාපදිංචි නව ආයෝජකයින් | 24 | 79 | 70 |
| වසර අගදී ආයෝජකයන් සංඛ්‍යාව | 214 | 293 | 363 |

| | 2012 | 2013 |
|---|---|---|
| ආයෝජන මණ්ඩල ව්‍යාපාරවලින් ලත් ආදායම (රු. මිලියන ) | 9,984 | 9226.09 |
| ඇපකර අවලංගු කිරීම හේතුවෙන් ආයෝජන මණ්ඩල ව්‍යාපාරවලින් ලත් ආදායම (රු. මිලියන) | 37.0 | 14.9 |

රේගු ආයෝජන මණ්ඩල සම්බන්ධීකරණ ඒකකය **(CBCU)**

| | 2011 | 2012 | 2013 |
|---|---|---|---|
| වසර ආරම්භයේදී තිබූ සිද්ධි සංඛ්‍යාව | 51 | 51 | 51 |
| වසර තුළ මුල පුරන ලද සිද්ධි සංඛ්‍යාව | 1 | - | - |
| වසර තුළදී අවසන් කරන ලද විමසුම් සංඛ්‍යාව | 3 | - | - |
| විමර්ෂණ අවසන් නොමැති සිද්ධි සංඛ්‍යාව | 48 | 45 | 45 |
| අවසන් නොවූ පරීක්ෂණ සංඛ්‍යාව | - | 1 | 1 |
| වසර අවසානයේදී | - | | |
| අධිකරණයේදී නඩු පවරන ලද සිද්ධි සංඛ්‍යාව (වසර අවසානයේදී | - | - | - |
| අයකර ගැනීම් (රු.) | | | |
| විශේෂ තැන්පත් (රු.) | - | - | - |
| දඩ/රාජසන්තක කිරීම් (රු.) | 88,552,987 | - | |
| විකුණුම් ආදායම (රු.) | | 527,500 | - |
| රාජසන්තක කරන ලද භාණ්ඩවල වටිනාකම (රු.) | | - | |
| එකතුව (රු.) | **88,552,987** | **527,500** | **-** |

## බැඳුම්කර විමර්ෂණ ඒකකය


අනාවරණය කරගත් උල්ලංඝණයන් සංඛ්‍යාව, අයකරගත් සංඛ්‍යාව හා අධිකරණයේ පවරන ලද නඩු

| | 2011 | 2012 | 2013 |
|---|---|---|---|
| වසර මුලදී තිබූ සිද්ධි සංඛ්‍යාව | 619 | 569 | 574 |
| වසර තුළදී මුල පුරන ලද සිද්ධි සංඛ්‍යාව | 12 | 29 | 59 |
| වසර තුළදී අවසන් කරන ලද විමර්ෂණ සංඛ්‍යාව | 62 | 7 | 10 |
| විමර්ෂණ අවසන් නොමැති සිද්ධි සංඛ්‍යාව | 569 | 574 | 611 |
| වසර අවසානයේදී අවසන්වන නොමැති විමර්ෂණ සංඛ්‍යාව | 3 | 1 | 4 |
| අධිකරණයේ නඩු පවරන ලද සිද්ධි සංඛ්‍යාව (වසර තුළදී) | 2 | Nil | Nil |
| දඩ/ රජසන්තක කිරීම් | 750,000 | 14,229,764 | 266,043,829 |
| රාජසන්තක කිරීම් වල වටිනාකම | 234,720 | 37,637,847 | - |

## තැපැල් තක්සේරු අංශය

### 2013 වසරේදී එකතුකරගත් ආදායම

| කොළඹ (රු.) | නුවර (රු.) | ගාල්ල (රු.) | ත්‍රිකුණාමලය (රු.) | යාපනය (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|---|
| 52292746 | 6823048 | 4734594 | 1854348 | 2674711 | 68379447 |




| | PA | BULK | EMS | TOTAL |
|---|---|---|---|---|
| POD සංඛ්‍යාව | 29939 | 845 | 14555 | 45339 |

| | | | | |
|---|---|---|---|---|
| පාර්සල් සංඛ්‍යාව | 35112 | 904 | 16731 | 52747 |
| වටිනාකම (රු.) | 122030724.5 | 3591269 | 316562072 | 442184065 |
| මුළු බදු (රු.) | 17803593 | 292175 | 40229291 | 58314927 |

# භාණ්ඩ පරීක්ෂණ අංශය

## හැඳින්වීම

භාණ්ඩ පරීක්ෂණ අංශයේ ප්‍රධාන වගකීම වන්නේ මුහුදු මගින් ආනයනය කල භාණ්ඩ ඒවායේ හිමිකරුවන් වෙත මුදා හැරීමට පෙර රේගු අවශ්‍යතා සඳහා එම භාණ්ඩ පරීක්ෂා කර බැලීමයි. මෙම පරීක්ෂණ සිදු කරනු ලබන්නේ අදාළ භාණ්ඩවලින් රජයට නියමිත ආදායම ලැබෙන බව සහතික කිරීම සඳහා වේ. එමෙන්ම තාක්ෂණික හා භෞතික තහවුරුව මගින් රේගු ආඥා පනත හා අනෙකුත් අනුෂංගික අණ පනත් මගින් කර ඇති තහනම් හා සීමා කිරීම් පිළිබඳව කටයුතු කිරීම සහතික කිරීම ද මෙමගින් සිදු කෙරේ. නීත්‍යානුකූල වෙළඳාම සඳහා පහසුකම් සැලසීම මෙම අංශයේ ප්‍රධාන වගකීමකි.

මුහුදු මගින් ගෙන එන භාණ්ඩ පරීක්ෂණ කටයුතුවලට, පුද්ගලික ප්‍රයෝජනය සඳහා ගෙන එන භාණ්ඩ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ අපනයන ඉලක්ක කරගත් කර්මාන්ත සඳහා ගෙන එන භාණ්ඩ, TIEF යෝජනා ක්‍රමය හා රේගු බැඳුම්කර යෝජනා ක්‍රමය යටතේ ගෙන එන භාණ්ඩ ද ඇතුළත් වේ. මුහුදු මගින් ගෙන එන භාණ්ඩ, පූර්ණ බහාලුම් ධාරිතාවන් ද, අඩු බහාලුම් ධාරිතාව හා මහා පරිමාණ තොග වශයෙන් ද පැමිණෙන මධ්‍යම මට්ටමේ අවදානමක් සහිත හා ඉහළ අවදානමක් සහිත බහාලුම් සම්පූර්ණ පරීක්ෂාව සඳහා වරායෙන් පිටත බහාලුම් අංගන දෙකක ක්‍රියාත්මක වේ. ඒවා ග්‍රේලයින් -1 සහා ග්‍රේලයින් - 2 වශයෙන් නම් කෙරේ. එමෙන්ම අඩු අවදානම් සහිත බහාලුම් සඳහා වෙනම රත්ක් බහාලුම් අංගනය (RCT) නමින් තවත් අංගනයක් ක්‍රියාත්තමක වේ. අඩු බහාලුම් ධාරිතාව (LCL) සහිත භාණ්ඩ තොග පරීක්ෂාව සඳහා වරාය තුළ පරීක්ෂණ ඒකක දෙකක් හා වරායෙන් පිටත එක කබඩාවක් පිහිටුවා ඇත. නිදහස් වෙළඳ කලාපයෙන් පිටත පිහිටි ආයෝජන මණ්ඩලයට අදාළ ආයතනවල පූර්ණ බහාලුම් ධාරිතාවය සහිත බහාලුම් පරීක්ෂාව සඳහා මධ්‍යම පරීක්ෂණ පර්යන්තය (CVT) නමින් වෙනම අංගනයක් පිහිටුවා ඇත. එක්ස්රේ ස්කෑන් යන්ත්‍ර 2 න් එකක් වරාය තුළ හා අනෙක වරායෙන් පිටත RCT අංගනයේ ද පිහිටුවා ඇත.

ප්‍රධාන කාර්යයන්:

1. ආනයනකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ආනයන රේගු ප්‍රකාශන නිරවද්‍යභාවය සඳහා තවදුරටත් පරීක්ෂා කිරීම.
2. වෙනස් පරීක්ෂණ මට්ටම් යටතේ භාණ්ඩ පරීක්ෂා කිරීම සඳහා බහාලුම් විවිධ පරීක්ෂණ මධ්‍යස්ථානවලට යොමු කිරීම.
3. බහාලුම් පරීක්ෂාවේ දී හා නිදහස් කිරීමේ දී අවදානම් කළමනාකරණය පදනම් කරගත් බහාලුම් තේරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.
4. නියමිත ආදායම ලබන බව සහතික කිරීම සඳහා බහාලුම් භෞතිකව පරීක්ෂා කිරීම.
5. සිතාමතාම බහාලුම් ප්‍රකාශන නිසි පරිදි ඉදිරිපත් නොකෙරෙන අවස්ථා හසු කර ගැනීමට හා වැළැක්වීම සඳහා බහාලුම් භෞතිකව පරීක්ෂා කිරීම.
6. තහනම් කරන ලද හා සීමා කරන ලද භාණ්ඩ සංචලනයට අදාළ අනෙකුත් මුහුදු සීමා පාලන රෙගුලාසි භාවිතා වන බව සහතික කිරීම සඳහා බහාලුම් පරීක්ෂාව
7. වේගවත් නිශ්කාශන කටයුත් පහසු කරන මෙවලමක් වශයෙන් සඟවා ගෙන එන සහ ප්‍රකාශ නොකළ භාණ්ඩ හසුකර ගැනීම සඳහා එක්ස්රේ ස්කෑන් යන්ත්‍ර භාවිතා කිරීම.


## පහසුකම් වැඩිදියුණු කිරීම


භාණ්ඩ නිෂ්කාශනය පහසුකිරීම හා සැපයුම් දාමයේ ප්‍රමාදයන් අවම කිරීම සඳහා පූර්ණ සේවක මණ්ඩලයකින් සමන්විත කාර්යාලයෙක් සහිත ස්කැනර් අංගනයක් වරාය තුළ පිහිටුවා ඇත. අහඹු ලෙස තෝරාගත්, ආයෝජන මණ්ඩලයට අදාළ ආයතනවල බහලුම් ස්කෑන් පරීක්ෂාවට ලක් කිරීමද මෙහිදී සිදු කෙරේ. X රේ ස්කෑන් පරීක්ෂාව ඉහළ අවදානමක් සහිත බහලුම් පරීක්ෂාව ඉලක්ක කරගෙන සිදු කරන අතර මෙය අඩු අවදානම් සහිත බහාලුම් අඩු මැදිහත්වීම් මත ඉක්මණින් මුදා හැරීම සඳහා පහසුකම් සලසන මෙවලමක් ලෙස ද භාවිතා කරනු ලැබේ.


ඔරුගොඩවත්ත CVT අංගනය මගින් අංගනය මගින් ආයෝජන මණ්ඩලය යටතේ පාලනය වන කර්මාන්ත සඳහා පැය 24 පුරාම නිෂ්කාශන පහසුකම් සලසා ඇත. එමෙන්ම ආයෝජකයාගේ පරිශ්‍ර යේදීම පරීක්ෂා කිරීම් සිදු කිරීම දක්වා පහසුකම් පුළුල් කර ඇත. ආයෝජන මණ්ඩලය මගින් නිර්දේශ කරනු ලබන තෝරාගත් සමාගම් සඳහා ග්‍රීන් චැනල් පහසුකම් ලබාදී ඇත.


## කාර්ය සාධනය 2013

| විස්තරය | | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| පරීක්ෂණ මධ්‍යස්ථානවලදී ලියාපදිංචි කරන ලද ආනයන රේගු ප්‍රකාශන ( නිවාස වල භාවිතය සඳහා -LCL & FCL ) registered at examination points | | 226,584 | 222,131 | 189,617 | 175,062 |
| පරීක්ෂණ මාදිලිය | Amber | 114,257 | 153,647 | 138,360 | 140,624 |
| | Detail | 12,834 | 12,791 | 15,036 | 18,748 |
| | HRC | 4,416 | 5,956 | 3,329 | 2,257 |
| | Red | 9,145 | 1,576 | 1,868 | 6,217 |
| | වෙනත් (InFac, TIEP, etc...) | 13,725 | 7,749 | 6,240 | 7,216 |
| නිශ්කාෂණයේදී බහලුම් සංඛ්‍යාව ( නිවාසවල භාවිතය සඳහා) | | 200,314 | 236,103 | 245,714 | 261,165 |
| කොළ චැනලය යටතේ නිශ්කාෂණය කරන ලද බහලුම් සංඛ්‍යාව | (නිවාසවල භාවිතය සඳහා) | | | 24,784 | 29,446 |
| ස්කෑන් කරන ලද බහලුම් සංඛ්‍යාව | | 9,758 | 12,627 | 14,238 | 24,985 |
| BOI ආයතන සඳහා නිශ්කාෂණ (පිටත කලාප - LCL & FCL) cleared | | 27,968 | 58,362 | 59,010 | 58,065* |
| ආනයනය කළ බහලුම් සංඛ්‍යාව (BOI - පිටත කලාප) | | | | 27,446 | 24,765 |
| අපනයනය කළ බහලුම් සංඛ්‍යාව (BOI - පිටත කලාප) | | | | 17,316 | 19,260 |
| හසුකරගත් සිද්ධි සංඛ්‍යාව | | 325 | 436 | 572 | 222 |
| අතිරේක රේගු සටහන්කර වලිකන් අයකරගත් මුදල් (රු. මිලියන) | | 113 | 506.3 | 487 | 715.6 |
| අයකරගත් දඩ මුදල් (රු. මිලියන) | | 55.8 | 62.4 | 67 | 49.1 |
| රාජසන්තක කළ බඩුවල වටිනාකම (රු. මිලියන) | | 7.8 | 30.5 | 2.1 | 7.2 |


Comparison of CusDecs & Containers 2010-2013
400,000
200,000
0
2010
2011
2012
2013
No. of Imports CusDecs ( Home use-LCL & FCL ) registered at examination points
No. of Containers cleared ( Home use)
No. of Containers Scanned
Consignments for BOI Enterprises (Outer zones - LCL & FCL) cleared


Comparison of Revenue Recovered (2010-2013)
1,000.0
100.0
10.0
1.0
2010
2011
2012
2013
Value of Goods Foreifeited (Rs. in millions)
Recoveries on Additional CusDecs (Rs. in millions)
Recoveries of Penalty (Rs. in millions)


Types of Examination (Home use)
11%
1%
4%
4%
80%
Amber
Detail
HRC
Red
Other (InFac, TIEP, etc...)


Import Consignments ( Home Use) Cleared in 2013
100,000
10,000
1,000
100
10
1
Gray Line I
HRC
JCT
G/Pier
PVQ
No of Cusdecs Registered for Home Use

## හැඳින්වීම

මගී සේවා අංශය කොළඹ වරායට ඇතුළු වන හා ඉන් පිටවන මගීන් හා භාණ්ඩ ඵලදායි ලෙස පාලනය කිරීම වෙනුවෙන් වගකීමට බැඳී සිටී.

ප්‍රධාන කාර්යයන්

1. රටින් බැහැරව හා රටට පැමිණෙන මගීන් හා භාණ්ඩ නිශ්කාෂණය පහසු කිරීම
2. ආදායම් සුරක්ෂිත කිරීම හා තහනම් කරන ලද හා සීමා කරන ලද භාණ්ඩ ආනයනය හා අපනයනය වැළැක්වීම
3. සමාජයේ සමාජ ආර්ථික, සංස්කෘතික හා පාරිසරික අපේක්ෂාවන් ආරක්ෂා කිරීම
4. UPB ගබඩා පාලනය හා නියාමනය කිරීම

## 2013 වර්ෂය තුළ ගමන් බඩු අංශයේ ආදායම

| | දඩමුදල් | අතිකාල | බදු හා අයබදු(රු.) | එකතුව (රු) |
|---|---|---|---|---|
| BO (කවුන්ටරය) | 11,065,325 | | 42,573,011 | 29,729,888 |
| BO (විකුණුම්) | 19,250 | | 665,136,372 | 147,424,507 |
| BO (NNR) | 2,282,203 | | 36,470,100 | 57,216,749 |
| ලක්සිරි සේවා | 465,799 | 2,650,231 | 21,734,979 | 59,476,157 |
| ට්‍රාන්ස්කෝ | 578,665 | 2,278,260 | 25,117,111 | 38,335,317 |
| මිඩ්කෝ | 816,212 | 2,713,097 | 15,135,441 | 25,417,831 |
| Trico(කොළඹ) | 1,330,202 | 3,275,349 | 61,641,685 | 74,096,225 |
| CSL (කොළඹ) | 1,100,663 | 2,951,439 | 39,802,554 | 63,200,748 |
| උප එකතුව | **17,658,319** | **13,868,376** | **907,611,253** | **939,137,948** |
| | | | | |
| Trico (ගාල්ල) | 478,740 | 2,403,485 | 11,589,572 | 14,471,797 |
| Trico (කුරුණෑගල) | 504,600 | 5,082,093 | 19,774,079 | 25,360,772 |
| CSL (මහනුවර) | 254,026 | 4,051,540 | 11,702,715 | 16,008,281 |
| මත්තල ගුවන්තොටුපල | 11,540,052 | | 17,317,104 | 28,857,156 |
| එකතුව | **12,777,418** | **11,537,118** | **60,383,470** | **84,698,006** |
| | | | | |
| BIA | 234,789,421 | 7,770,894 | 255,556,208 | 498,116,523 |
| | | | | |
| එකතුව | **234,789,421** | **7,770,894** | 255,556,208 | **498,116,523** |

# අපනයන කාර්යාංශය

## හැඳින්වීම

අපනයන අංශය සමඟ ක්‍රියාපරිපාටි සරල කිරීම තුලින් හා Direct Trader Input (DTI), ක්‍රමය හඳුන්වාදීම මගින් අන්තර්ජාතික නිත්‍යානුකූල භාණ්ඩ සංචලනය ධෛර්යමත් කරන අතර සෘජු අපනයන හා ප්‍රති අපනයන නිෂ්කාශනය සඳහා පහසුකම් සලසයි. එමෙන්ම මෙම අංශය රටේ සංස්කෘතික, පාරිසරික, සමාජ අභිලාෂයන් ආරක්ෂා කිරීම පිළිබඳ වගකීමද දරනු ලබයි.

**ප්‍රධාන කාර්යයන්**

1. මෙම අංශය, වරාය මගින් හා ගුවන් මගීන් කරනු ලබන අපනයන සම්බන්ධව සියලු කටයුතු වලට සම්බන්ධ වේ.
2. රටෙන් අපනයනය කරනු ලබන සියලු භාණ්ඩ සම්බන්ධ සෑම කරුණකටම දායක වේ.
3. අපනයන භාණ්ඩ රේගු අවශ්‍යතා සහ ආරක්ෂක අවශ්‍යතා සඳහා පරික්ෂා කිරීම
4. අපනයන බදු, සෙස් බදු, රාජ්‍ය භාග සියලු අපනයනය කරනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන් අය කිරීම
5. කොළඹ හා තදාසන්න ප්‍රදේශවල බහාලුම් නවතන ස්ථාන කළමනාකරණය
6. MCC තොග ගබඩාව පවත්වාගෙන යාම
7. Carnet ක්‍රමය යටතේ තාවකාලික ආනයන/අපනයන පහසු කරවීම
8. ආපසු ගෙවීම් ඉල්ලීම් අනුමත කිරීම
9. නැව්ගත කිරීමේ සහතික නිකුත් කිරීම
10. තීරුබදු ප්‍රතිදාන ලේඛන සහතික කිරීම
11. නිදහස් ප්‍රති අපනයන සහතික ලියාපදිංචිය
12. Rules of Origin අනුව වෙළඳ දෙපාර්තමේන්තුව නැව්ගත කිරීම සහතික කිරීම
13. ප්‍රතිනැව්ගත කිරීම් කටයුතු පහසු කරලීම
14. ජාතික වෙළඳ සංඛ්‍යාති සැපයීම
15. ජාතියේ සමාජ ආර්ථික, සංස්කෘතික හා පාරිසරික අවශ්‍යතා ආරක්ෂා කිරීම
16. පුද්ගලික අංශය, රාජ්‍ය ආයතන ඇතුළුව සියලු දායකයන් සමග සහයෝගිතාවය ගොඩ නැගීම
17. සියලු ව්‍යාපාරික ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය නිරන්තරයෙන් වර්ධනය කෙරෙන ආකාරයට පද්ධති හා ක්‍රියාපටිපාටි ක්‍රියාවට නැගීම
18. අපනයන වෙළඳාම පහසු කිරීම සඳහා තොරතුරු තාක්ෂණය උපරිම ආකාරයට භාවිතයට ගැනීම

<u>අපනයන ආදායම් වර්තාව</u>

| | අපනයන කාර්යාලය | ගුවන් භාණ්ඩ අපනයන කාර්යාලය | |
|---|---|---|---|
| | කොළඹ **2013** | කටුනායක - 2013 | එකතුව |
| | **(රු.)** | **(රු.)** | **(රු.)** |
| EEC | 2,030,740,267 | - | 2,030,740,267 |
| අපනයන බද්ද (CCBO) | 20,987,104 | | 20,987,104 |
| සෙස් - රබර් | 515,697 | | 515,697 |
| සෙස් - තේ | 726,936,515 | | 726,936,515 |
| සෙස් - පොල් | 1,272,299,142 | 98,678 | 1,272,397,820 |
| පරීක්ෂණ ගාස්තු | 41,300,000 | 8,539,561 | 49,839,561 |
| Royalty | 34,541 | - | 34,541 |
| ආනයන බදු * Import Duty (1/10) | 1,171,058 | - | 1,171,058 |
| වරාය හා ගුවන් තොටුපල පද්ද * PAL (1/10) | 516,721 | - | 516,721 |
| වෙනත් | 4,941,806 | - | 4,941,806 |
| දඩ මුදල් | 4,882,921 | 2,469,338 | 7,352,259 |
| රාජසන්තක කිරීම් | 27,400,000 | - | 27,400,000 |
| අතිකාල ගාස්තු | 12,203,575 | 34,904,657 | 47,108,232 |
| නැව් සහතික ගාස්තු | 80,000 | - | 80,000 |
| පරිගණක ගාස්තු | 21,543,000 | 17,254,750 | 38,797,750 |
| **එකතුව** | 4,166,552,347 | 63,266,984 | 4,227,819,331 |

* නැවත අපනයනය කරන අවස්ථාවේදී අය කර ගන්නා ලදී.

**1.** <u>ඉදිරිපත් කළ රේගු සටහන්කර සංඛ්‍යාව</u>

| | |
|---|---|
| අපනයන කාර්යාලය | - 84,460 |
| ගුවන් බඩු කාර්යාලය | - 70,284 |
| ශ්‍රී ලංකා ගුවන් බඩු කාර්යාලය | - 1,712 |
| එකතුව | **- 156,456** |

**2.** <u>සමූහ පරීක්ෂණය</u>

පරීක්ෂණ සංඛ්‍යාව - 11,895

**3.** <u>එකතු කර ගන්නා ලද පරීක්ෂණ ගාස්තු</u>

| | |
|---|---|
| අපනයන කාර්යාලය (O/E) | - රු. 41,300,000 |
| ගුවන් බඩු කාර්යාලය (O/E) | - රු. 8,539,561 |
| එකතුව | - රු. **49,839,561** |

**4.** <u>එකතු කර ගන්නා ලද පරිගණක ගාස්තු</u>

| | |
|---|---|
| අපනයන කාර්යාලය | - රු. 21,543,000 |
| ගුවන් බඩු කාර්යාලය | - රු. 16, 230,750 |
| ශ්‍රී ලංකා ගුවන් සේවය | - රු. 1,024,000 |
| එකතුව | - රු. **38,797,750** |

**5.** <u>එකතු කර ගන්නා අපනයන බද්ද</u>

අපනයන බද්ද - රු. 20,987,104

| | |
|---|---|
| රාජ්‍ය භාගය(Royalty) | - රු. 34,541 |

| | | |
|---|---|---|
| සෙස්: | a) CC1 | - රු. 127,299,142 |
| | b) TC1 | - රු. 726,300,919 |
| | c) TC2 | - රු. 635,596 |
| | d) RC1 | - රු. 515,514 |
| | e) RC4 | - රු. 183 |
| | f) EEC (E/O) | - රු. 2,030,740,267 |
| | g) Import Duty (1/10) | - රු. 1,171,058 |
| | h) PAL (1/10) | - රු. 516,721 |

**6.** සෙස් :

| | |
|---|---|
| a) CC1 | - පොල් සංවර්ධන මණ්ඩලයේ සෙස් බද්ද |
| b) TC1 | - තේ මණ්ඩල සෙස් බද්ද |
| c) TC2 | - තේ වෛද්‍ය ආධාර - සෙස් බද්ද |
| d) RC1 | - රබර් සෙස් බද්ද |
| e) RC4 | - රබර් වෛද්‍ය සෙස් බද්ද |
| f) EEC | - අපනයන ප්‍රවර්ධන මණ්ඩල සෙස් බද්ද |

**අතිකාල ගෙවීම්**

| | |
|---|---|
| අපනයන කාර්යාලය | - රු. 1,131,800 |
| ගුවන් බඩු කාර්යාලය | - රු. 33,663,830 |
| ශ්‍රී ලංකා ගුවන් සේවය | - රු. 1,240,827 |
| CFS අංගනය | - රු. 11,071,775 |
| එකතුව | - රු. **47,108,232** |

**8.** ජංගම ගිණුම්

| | |
|---|---|
| ජංගම ගිණුම් හිමිකරුවන්ගේ ප්‍රමාණය | - 46 |
| සක්‍රිය ජංගම ගිණුම් සංඛ්‍යාව | - 35 |
| කාල පරාසය තුළදී තැම්පතු ප්‍රමාණය | - රු. 1, 644,452,956 |
| කාල පරාසය තුළදී ගිණුමෙන් අඩු වූ ප්‍රමාණය | - රු. 1,529,139,316 |

**9.** ඉල්ලීම මත නිකුත් කළ **FRIC** - 671

**10.** නිකුත් කරන ලද නැව් සහතික - 320

**11.** නැව් සහතික නිකුත් කිරීමේ ගාස්තු එකතුව - රු. 80,000

**12.** නැව් හා ගුවන් යානා නව සංශෝධන

| | |
|---|---|
| අපනයන කාර්යාලය (දඩ) | - රු. 4,882,921 |
| ගුවන් භාණ්ඩ කාර්යාලය (දඩ) | - රු. 2,469,338 |
| එකතුව | - රු. **7,352,259** |

**13.** නැව් නාම සංශෝධනය කිරීම - 13,280

**14.** නැව් හුවමාරු

| | |
|---|---|
| පැමිණි බහලුම් සංඛ්‍යාව (Containers) | - 995,750 |
| නැව්ගත කළ බහලුම් සංඛ්‍යාව | - 1,279,523 |

# මගී සේවා (කටුනායක) කාර්යාංශය

හැඳින්වීම

ශ්‍රී ලංකා රේගුවේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය තුල මගී සේවා කාර්යාංශය ආදායම් හා සේවා පර්ෂදය ඇතුලත ක්‍රියාත්මක වේ. වර්තමානයේදී මෙම අංශය එහි ස්ථිර කාර්ය මණ්ඩලයට අමතරව රේගු අධ්‍යක්ෂවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ. නි.රේ.අ. තනතුරට පහළ තනතුරේ තවත් නිලධාරී කණ්ඩායමක් සේවා මුර ක්‍රමයට බ.ජා.ගු. තොටුපොලේ රාජකාරි ඉටු කරමින් දවසේ පැය 24 පුරාම රාජකාරි ආවරණය කරනු ලබයි.

මගී සේවා අංශය ගුවන් භාණ්ඩ ප්‍රදේශය හැර බ.ජා.ගු. තොටුපොලේ පාලන / ආවේක්සණ කටයුතු භාරව ක්‍රියා කරන අතර බ.ජා.ගු. තොටුපොලේ සේවයේ යෙදී සිටින රේගු නිලධාරීන් පැමිණීමේ / පිටවීමේ පර්යන්ත වල දේශසීමා නිලධාරින් ලෙස කටයුතු කරයි.

මූලික ඉලක්කයන්

- ගුවන් මගී සංචලනය පහසු කිරීම
- රේගු ආඥා පනත හා අනෙකුත් අදාල නීති යටතේ පවරා දී ඇති නීති බලාත්මක කිරීමේ කටයුතු සිදු කිරීම
- ගුවන් සංචලන සම්බන්ධ දේශසීමා මෙහෙයුම් නියාමනය හා අධික්ෂණය කිරීම
- ගුවන්යානා සංචලන පාලනයේදී කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කිරීම
- ආදායම් අහිමිවීම් / විදේශ විනිමය අහිමිවීම් අවම කිරීම, එවන් අවස්ථා හඳුනාගැනීම හා ඊට එරෙහි කඩිනම් පියවර ගැනීම
- ආරක්ෂක අමාත්‍යාංශය TRC, SLSI, CDDA, ආනයන පාලන දෙපාර්තමේන්තුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ආදී වෙනත් ආයතන හා අධිකාරි වලට අදාල පනත් හා රෙගුලාසි මගින් රේගුව වෙත පවරා දී ඇති බලතල ක්‍රියාත්මක කිරීම
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, ගුවන්තොටුපොල හා ගුවන් සේවා, නිරෝධායන දෙපාර්තමේන්තුව, අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය ආදී ගුවන් තොටුපොල පරිශ්‍රයේ පිහිටි අනෙකුත් රජයේ ආයතන සමග ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගෙන යාම

මෙම කාර්යාංශයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධ මට්ටමේ විවිධ තනතුරු දරන නිලධාරීන් විසින් පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටු කරනු ලබයි.

**ප්‍රධාන කාර්යයන්**

1. රට තුළට පැමිණෙන හා රටින් පිටවන මගීන්ගේ හා ඔවුන්ගේ ගමන් බෑග වල සංචලනය පහසු කිරීම
2. බ.ජා.ගු. තොටුපොලේ ප්‍රභූ ගමන් බිමන් පහසු කිරීම
3. ශ්‍රී ලංකාවට පැමිණෙන හා ඉන් පිටවන ගුවන් යානා හා ඒවායේ කාර්යමණ්ඩල සැලසුම් කිරීම
4. මගී ගමන් බෑග සඳහා තීරුබදු රහිත ගමන් බෑග දීමනාව ප්‍රදානය කිරීම හා අධීක්ෂණය සහ එවන් පහසුකම් අපහරණය කිරීම වැලැක්වීමට අවශ්‍ය පියවර ගැනීම
5. ATA කාඩ්පත්, ඇපකර හා විශේෂ තැන්පතු මත භාණ්ඩ මුදා හැරීම
6. රේගුව / ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් අනුමත කරන ලද මැණික් / ස්වර්ණාභරණ පාර්සල් හැසිරවීම
7. රට තුළට පැමිණෙන / ඉන් පිටවන මගීන්ගේ විදේශ මුදල් ප්‍රකාශ පරීක්ෂා කිරීම හා අනුමත කිරීම
8. මගියා පිට වූ පසු ඔහු විසින් රැගෙන නොගිය බෑග ඇටෝර්නි බලපත්‍ර සහිත බලයලත් පුද්ගලයෙකු හට ඉතිරි ගමන් බෑග දීමනාව ලබා දීම
9. සැකසහිත අවස්ථාවක හෝ අවශ්‍ය වෙනත් අවස්ථාවක හිමිකරුවන් නොමැති බෑග පරීක්ෂා කිරීම
10. අවශ්‍ය විටකදී පුද්ගලයින් පරීක්ෂා කිරීම
11. වැරදි අනාවරණය කරගැනීම විමර්ශනයන් සිදු කිරීම හා අනාවරණය කොටගත් රේගු සිද්ධි පිළිබඳ විමර්ශනය කිරීම
12. රටින් පිටතට යන ගුවන් යානා සඳහා නිෂ්කාශන නිකුත් කිරීම
13. වාණිජ අන්දමේ භාණ්ඩ රැගෙන එන මගීන්ගෙන් තීරුබදු හා අනෙකුත් බදු අය කර ගැනීම

## 2013 වසරේ කාර්යසාධනය

### A. සංචලනය පහසු කිරීම - රට තුළට පැමිණෙන හා රටින් පිටවන මගීන් හා ඔවුන්ගේ ගමන් බෑග

2013 වසරේ සංඛ්‍යාලේඛන වලට අනුව, පසුගිය වසරට සාපේක්ෂව මගී ගමන් වල කැපී පෙනෙන වර්ධනයක් 2013 වසර තුළ අත්පත් කරගෙන තිබේ. පසුගිය වසර තුළ මගීන් මිලියන 3.2 ක් රට තුළට පැමිණ ඇති අතර මිලියන 3.2 ක් රටින් පිටතට ගොස් තිබේ.

මෙම මගීන් ශ්‍රී ලාංකිකයන්, වෙනත් ජාතින්ට අයත් සංචාරකයින්, සංක්‍රාන්ති මගීන්, ද්විත්ව පුරවැසිභාවය සහිත පුද්ගලයන්, ශ්‍රී ලංකා රජයේ හා වෙනත් රටවල දූත පිරිස්, ජාත්‍යන්තර ව්‍යාපාරිකයන්, වෘත්තිකයන්, ක්‍රීඩකයන් ආදී ලෙස කාණ්ඩ කළ හැකිය. පහසු කිරීම් හා වෙනත් සේවාවන් ඒ ඒ කාණ්ඩවලට අවශ්‍ය වන පරිදි සපයා දෙන ලදී.

### B. ජාතික සමාජ ආර්ථික, සංස්කෘතික හා පරිසර විද්‍යාත්මක බැඳියාවන් ආරක්ෂා කිරීම

ජාතියේ සමාජ ආර්ථික, සංස්කෘතික හා පරිසර විද්‍යාත්මක බැඳියාවන්ට හානි සිදුවන ආකාරයේ කටයුතු කළ ඇතැම් සංවිධානාත්මක කණ්ඩායම් හා පුද්ගලයින්ගේ එකී ප්‍රයත්නයන් සාර්ථකව ව්‍යර්ථ කිරීමට මගී සේවා කාර්යාංශය සමත් වී ඇත.

රටේ ඇති ඉහළ ශාක හා සත්ව විශේෂ විවිධත්වය හේතුවෙන් ශ්‍රී ලංකාව ලෝකයේ ජෛව විවිධත්ව දර්ශකයේ ඉහළම ස්ථානයක් හිමි කර ගන්නා රටක් වන අතර වටිනාකම තක්සේරු කළ නොහැකි ජාන සම්පත් ඇති රටක් ලෙසද එය ලොව තුළ සුවිශේෂී ස්ථානයක් ගනී.

රටේ ඉතිහාසය හා සංස්කෘතික උරුමය පිරික්සීමේදී පුරා විද්‍යාත්මක වටිනාකම මිළ කළ නොහැකි භාණ්ඩද එහි හමුව ඇත. මෙවන් ජාතික වටිනාකමක් සහිත භාණ්ඩ ජාවාරම් කිරීමට මේ වන විට ජාත්‍යන්තර ජාවාරම්කරුවන් කටයුතු කරමින් සිටින හෙයින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලේ මගීන්ගේ ගමන්මළු පිළිබඳ විශේෂයෙන් විමසිලිමත් වෙමින් එකී භාණ්ඩ විවිධ ස්වරූපයන්ගෙන් රටින් පිටමං කිරීම වැලැක්වීමට ගුවන් තොටුපොලේ දේශසීමා නිලධාරීන්ට හා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලේ රේගු නිලධාරීන් හට විශේෂ කාර්යභාරයක් පැවරේ.

එවන් ප්‍රයත්නයක් ව්‍යර්ථ කිරීමේ පියවරක් ලෙස, එවන් ක්ෂේත්‍ර පිළිබඳ විශේෂ පුහුණුවක් ලත් නිලධාරීන් පිටවීමේ පර්යන්ත ප්‍රදේශයේ සේවයේ යොදවා තිබේ.

රේගුව විසින් අනාවරණය කොටගත් ඉතා වැදගත් සිද්ධි කිහිපයක් පහත දැක්වේ.

- පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත කාසි රටින් පිටමං කිරීමට ගත් ප්‍රයත්නයන්

ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් කාසි 736 ක් නිතිවිරෝධී ලෙස රටින් පිටතට ගෙන යාමට උත්සාහ කළ ශ්‍රී ලාංකික මගියකු පිටවීමේ පර්යන්තයේදී අත්අඩංගුවට ගැනීමට රේගු නිලධාරීන් සමත් විය. එම කාසි පුරා විද්‍යාත්මක වශයෙන් ඉතා වටිනා බව විමර්ෂණයේදී තහවුරු වූ අතර පරීක්ෂණයේදී ඒවා රාජසන්තක කරන ලදී.

- ශ්‍රී ලංකාවෙන් පිටතට රැගෙන යාමට සූදානම් කොට තිබූ වල්ලපට්ට කි.ග්‍රෑ. 53.6ක් අනාවරණය කොට රාජසන්තක කරන ලදී.

**ඇ. නීතිවිරෝධී මත්ද්‍රව්‍ය / මත්කුඩු හා පුරෝගාමී රසායන ද්‍රව්‍ය අනාවරණය කර ගැනීම**

නීතිවිරෝධී මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගනිමින් සමාජය ආරක්ෂා කිරීම පිළිබඳව අප අපගේ විශේෂ අවධානය යොමු කොට ඇත්තෙමු. මේ පිළිබඳව විමසිලිමත්ව හිඳිමින් දේශසීමා කේන්ද්‍රයක් වන ගුවන් තොටුපොලේදී අපගේ බුද්ධි තොරතුරු නිලධාරීන් විසින් සාර්ථක මෙහෙයුම් අටක් සිදු කරන ලදී. නීති විරෝධී මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගනිමින් සමාජය ආරක්ෂා කිරීම පිළිබඳව අපගේ විශේෂ අවධානය යොමු කොට ඇත්තෙමු. මේ පිළිබඳව විමසිලිමත්ව හිඳිමින් දේශසීමා කේන්ද්‍රය වන ගුවන් තොටුපොලේදී බුද්ධි තොරතුරු නිලධාරීන් විසින් සාර්ථක මෙහෙයුම් 04 සිදුකොට හෙරොයින් ග්‍රෑම් 32,537 අත් අඩංගුවට ගන්නා ලදී.

ඉහත අත් අඩංගුවට ගැනීම් සඳහා ගුවන්තොටුපොළ රේගු කාර්ය මණ්ඩලයට විශේස පුහුණු ලත් රේගු මත්ද්‍රව්‍ය නිවාරණ ඒකකයේ නිලධාරීන්ගේ සහාය ලැබුණි.
තහනම් කරන ලද හා සීමා කරන ලද වෙනත් භාණ්ඩ සොයා ගැනීම්

ඈ. තහනම් කරන ලද හා සිමා කරන ලද වෙනත් භාණ්ඩ සොයා ගැනීම

මෙම කාණ්ඩය යටතේ අත් අඩංගුවට ගත් භාණ්ඩ පහත දැක්වේ.

- ස්වාභාවික පළතුරු හා මල් වර්ග
- ජීවී පැලෑටි
- සතුන් (සුරතල් මසුන්)
- CDDA, SLSI, TRC, MOD, හා නිරෝධනය අනුමැතිය අවශ්‍යා සීමා කරන ලද ද්‍රව්‍ය

2013 වර්ෂය තුළ, එවන් ද්‍රව්‍ය අනුමැතියකින් තොරව ශ්‍රී ලංකාවට ගෙන එන අතර, ඒවා රාජසන්තක කිරීමට කටයුතු කරන ලදී.

## එ. මුදල් විශුද්ධිකරණය, රත්‍රන් මැණික් හා ස්වර්ණාභරණ ජවාරමට එරෙහි පියවර

රේගුවේ මුඛ්‍ය කාර්යයක් ලෙස, විදේශ මුදල්, රත්‍රන් හා වටිනා ගල් වර්ග ජාවාරම් කිරීමට ගත් උත්සාහයන් අනාවරණය කර ගන්නා ලදී. සිද්ධි 22 කදී රු. මිලියන 78ක වටිනාකමකින් යුත් විදේශ මුදල්, සිද්ධි 87 කදී රු. මිලියන 174ක වටිනාකමකින් යුත් රත්‍රන් හා සිද්ධි 5 කදී රු. මිලියන 13.8 ක වටිනාකමින් යුත් වටිනා ගල් වර්ග සොයාගැනීමට අපට හැකි විය.

| | ජන. | පෙබ. | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සිදුවීම් සංඛ්‍යාව | 20 | 19 | 14 | 24 | 18 | 26 | 27 | 25 | 34 | 18 | 19 | 39 | **283** |
| රාජසන්තක කරන ලද භාණ්ඩවල වටිනාකම. | 31,359,801 | 30,589,651 | 12,368,980 | 17,647,641 | 2,570,501 | 13,555,520 | 28,851,820 | 26,195,984 | 46,440,681 | 44,746,813 | 27,571,432 | 34,884,750 | **316,783,574** |
| රාජසන්තක කරන ලද මුදල් වල වටිනාකම | 6,957,121 | 21,757,838 | nil | 3,080,754 | 7,288,744 | nil | 27,219,153 | 1,984,519 | 3,391,574 | 7,263,240 | nil | nil | **78,942,943** |
| රාජසන්තක කරන ලද බදු නිදහස් භාණ්ඩවල වටිනාකම | nil | nil | nil | 44,512 | nil | nil | 190,417 | 82,460 | 273,775 | nil | nil | nil | **591,164** |
| රාජසන්තක කරන ලද මැණික්වල වටිනාකම | nil | 1401155 | nil | nil | nil | nil | nil | 11,639,675 | 597,402 | nil | 185,200 | nil | **13,823,432** |
| රාජසන්තක කරන ලද රත්‍රන්වල වටිනාකම | 17,103,498 | 3,432,000 | 10,808,500 | 12478137 | 1,441,500 | 11,804,520 | 890,000 | 7,380,000 | 36,052,000 | 11,050,000 | 26,897,857 | 34,825,000 | **174,163,012** |
| රාජසන්තක කරන ලද රිදී වල වටිනාකම | nil | nil | nil | nil | nil | nil | 426,250 | nil | 505,800 | nil | nil | nil | **932,050** |
| රාජසන්තක කරන ලද දුම්කොළ නිෂ්පාදනවල වටිනාකම | 100,000 | 288,000 | nil | 636,000 | 0 | 275,000 | 126,000 | nil | 4,908,000 | 2,205,300 | 100,000 | nil | **8,638,300** |
| ත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් ප්‍රමාණ | 1970 gms | 1018 gms | 10.056 kgs | nil | nil | 1510 gms | nil | nil | nil | 24,000,000 | nil | nil | |
| රාජසන්තක කරන අනෙක් භාණ්ඩවල වටිනාකම | 1,387,479 | 308000 | 60,480 | 1,409,000 | 153,351 | 1,476,000 | 0.00 | 3,142,450 | 712,130 | 228,273 | 388,375 | 59,750 | **9,325,288** |
| කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | 13 | 9 | 7 | 13 | 13 | 18 | 16 | 13 | 27 | 16 | 15 | 20 | **180** |
| අත් අඩංගුවට ගන්නා ලද සීමා කරන ලද භාණ්ඩ සංඛ්‍යාව | 3 | 122 | 1240 | 150 | 1889 | 26 | 11 | 33 | 19 | 15 | 21 | 68 | **3,597** |
| රාජසන්තක කරන ලද සිගරට් සංඛ්‍යාව | 35 | 144 | 310 | 280 | 0 | 55 | 63 | 89 | 1374 | 448 | 149 | 526 | **3,473** |
| රඳවා ගන්නා ලද අනෙක් භාණ්ඩ පෙට්ටි සංඛ්‍යාව | 50 | 18 | nil | nil | 0 | 0 | 2 | 13 | 0 | 3 | 13 | 24 | **123** |

# ආදායම් හා සේවා කාර්යාංශය (කටුනායක )

**හැඳින්වීම :**

ආදායම් හා සේවා කාර්යාංශය (කටුනායක) කටුනායක බන්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලේ ගුවන් භාණ්ඩ පර්යන්තයේ ස්ථාපිත කොට ඇත.
නිසි ආදායම එකතු කර ගැනීම හා ආනයනය කරන ලද භාණ්ඩ දේශ සීමා පාලන රෙගුලාසි සුරැකෙන ආකාරයට නිෂ්කාශනය කිරීම සහ රේගු ආඥාපනතේ හා වෙනත් අදාල නීති හා රෙගුලාසි වල විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම මෙම කාර්යාංශයේ වගකීම වේ.

ගුවන් භාණ්ඩ පර්යන්තයේ ප්‍රධානතම භාණ්ඩ නැව් හැසුරුම්කරු ලෙස කටයුතු කරන්නේ ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් ලිමිටඩ් ආයතනයයි. අනෙකුත් නැව් භාණ්ඩ හැසුරුම්කරුවන් ලෙස හා නිහඬ රේගු පාලන යටතේ සේවා සැපයිම සඳහා නැව් භාණ්ඩ පර්යන්ත II හි ස්වයං හැසුරුම් සේවා සපයන්නා ලෙස SLFFA කාගෝ සර්විස් ලිමිටඩ් හා එක්ස්පෝ ඒවියේෂන් ලිමිටඩ් යන ආයතන කටයුතු කරයි. කුරියර් භාණ්ඩ, වේගවත්ව නිශ්කාෂණය කිරීමේ කටයුතු DHL හා Colombo Cargo Express(Pvt) Ltd මගින් බැඳුම්කර ගුදම් වලදී සිදු කරයි.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

1. ගුවන් මගින් ආනයනය කරනු ලබන භාන්ඩ වලට අදාල රේගු තීරු බදු, සෙස් හා වෙනත් ගෙවීම් තක්සේරු කිරීම හා එකතු කිරීම
2. භාණ්ඩ ප්‍රකාශ හා නිෂ්කාශන බලපත්‍ර සකස් කිරීම
3. නිෂ්පාදන හා සේවා කාර්යාංශය යටතේ ක්‍රියාත්මක විවිධ අපනයන කේන්ද්‍රිය පහසුකරණ වැඩසටහන් යටතේ ආනයනය කරනු ලබන භාණ්ඩ නිෂ්කාෂණය සඳහා අනුමැතිය ලබා දීම
4. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි ව්‍යාපාර වෙත යැවීමට නියමිත ආයතනික භාණ්ඩ නිෂ්කාශනය සඳහා අනුමැතිය ලබා දීම
5. ඉක්මනින් නරක් වන ද්‍රව්‍ය, කුරියර් භාණ්ඩ, වදේශ දූත මණ්ඩල භාණ්ඩ හා තැපැල් ආදී ආනයනික හදිසි භාණ්ඩ කඩිනමින් නිෂ්කාශනය කිරීම සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක වීම
6. නැවත පැමිණෙන මගින් විසින් කැටුවනොයන ලද බෑග කැටුව නොයන ලද මගී බෑග් ගබඩා වෙත මාරු කර යැවීම පහසු කිරීම
7. ආයෝජන මණ්ඩල, ආයෝජන මණ්ඩල නොවන, කුරියර් හා ඉක්මනින් නරක්වන භාණ්ඩ සඳහා අපනයන CusDecs සකස් කිරීම හා නිෂ්කාශන ලබා දීම

## ආදායම් හා සේවා කාර්යාංශය (කටුනායක) - වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2013

| අංකය | විස්තරය | CODE | එකතුව |
|---|---|---|---|
| 1 | ආනයන බදු | CID | 1,658,791,901.00 |
| 2 | අගය එකතු කල බද්ද | VAT | 3,049,586,717.00 |
| 3 | වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්ද | PAL | 2,837,016,997.00 |
| 4 | සමාජ ආරක්ෂණ බද්ද | SRL | 50,001.00 |
| 5 | විශේෂ වෙළඳ බද්ද | SCL | 332,609,167.00 |
| 6 | Consolidated Levy | CON | 29,431,011.00 |
| 7 | Surcharge | CIS | |
| 8 | නිෂ්පාදන බදු | XDO | 2,149,829.00 |
| 9 | නිෂ්පාදන බදු ( ඛණිජ තෙල්) | XDP | |
| 10 | ජාතිය ගොඩනැගීමේ බද්ද | NBT | 1,324,269,518.00 |
| 11 | අපනයන සෙස් ( EDB) | EIC | 583,578,183.00 |
| 12 | පරිගණක ගාස්තු | COM | 24,523,350.00 |
| 13 | පරීක්ෂා කිරීමේ ගාස්තු | EXM | 29,512,247.00 |
| 14 | අතිකාල | OVP | 1,035,371.00 |
| 15 | අතිකාල ගාස්තු | OTC | 59,631,749.00 |
| 16 | සීල් ගාස්තු | SEL | 661,350.00 |
| 17 | දඩමුදල් | PTY | 43,530,204.00 |
| 18 | සත්‍යාපන ගාස්තු | VCS | 6,481,743.60 |
| 19 | අනෙකුත් වියදම් | MISC | 641,770.00 |
| 20 | විශේෂ තැන්පතු | SPD | |
| 21 | වෙනත් ( Entry Amended Penalty) | AMD | 106,246.00 |
| | එකතුව | | 9,983,607,354.60 |
| 22 | මුළු රේගු සටහන්කර සංඛ්‍යාව | | 80,141 |
| 23 | රේගු බදු හා අනෙකුත් බදු | | |
| 24 | බැඳුම්කර, ආයෝජන පහසුකම් හා TIEP යටතේ වූ රේගු සටහන්කර | | 2,719 |
| 25 | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ වූ රේගු සටහන්කර | | 104,116 |
| | අන්තරාල වෙළඳාම | | 126 |
| 26 | S.R.අයදුම්පත් සංඛ්‍යාව (DRA) | | 364 |
| 27 | පළාත් යටතේ ඉදිරිපත් කළ රේගු සටහන්කර | | 153 |
| | 19 A වගන්තිය යටතේ ඉදිරිපත් කළ රේගු සටහන්කර | | 1,205 |
| 28 | No of Applications Passed under Transshipments සඳහා ඉදිරිපත් කල රේගු සටහන්කර | | 3,430 |
| 29 | රාජතාන්ත්‍රික බහලුම් සංඛ්‍යාව | | 444 |
| 30 | Carnet යටතේ රේගු සටහන්කර | | 71 |
| 31 | B.G( ACT/DHL/CC) යටතේ ඉදිරිපත් කරන ලද රේගු සටහන්කර | | 117 |
| 32 | ISAFTA/SAFTA යටතේ ඉදිරිපත් කරන ලද රේගු සටහන්කර | | 212 |
| 33 | P.G( ACT/DHL/CC) යටතේ ඉදිරිපත් කරන ලද රේගු සටහන්කර | | 278 |
| | එකතුව | | 193,376 |

### 2013 වර්ෂය සඳහා වූ ආදායම් ඉලක්ක

| | |
|---|---|
| 2013 සඳහා අපේක්ෂා කරන ලද ආදායම | 11,491 මිළි. |
| 2013 දී ලද ආදායම | 9,984 මිළි. |
| ලද ආදායම අපේක්ෂිත ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස | 86.89% |
| 2013 දී ලද ආදායම | 9,984මිළි. |
| 2012 දී ලද ආදායම | 9,389මිළි. |
| 2012 ට සාපේක්ෂව 2013 දී ආදායමෙහි වැඩිවීම ප්‍රතිශතයක් ලෙස | 6.34% |

# සහාය සේවා

# පර්ෂදය

# ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය

## හැඳින්වීම:

ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය ප්‍රධාන වශයෙන්ම ප්‍රතිපත්තිමය ගැටළු, තීරුබදු ගැටළු හා අන්තර් ජාතික කටයුතු පිළිබඳ වගකීම දරයි. එම අංශයේ පුළුල් අරමුණු පහත දැක්වෙන පරිදි සංක්ෂිප්ත කොට දැක්විය හැකිය.:

1. දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිමය කරුණු වැඩි දියුණු කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහාය වීම හා එම ප්‍රතිපත්ති අදාළ අංශයන් මගින් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියා පටිපාටි බවට පත් කිරීම, එකී තීරණ නිලධාරීන්ගේ දැන ගැනීමට හා අනුගත වීඹ සඳහා දැනුම් දීම.
2. රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ඉල්ලා සිටි විට
   (i) ආර්ථික/වෙළඳ ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම සහ
   (ii) එම ප්‍රතිපත්ති තීරුබදු උපාය මාර්ග බවට පත් කිරීම යන කටයුතුවලට සහාය වීම;
3. තීරුබදු උපාය මාර්ග මහජනතාවට හා නිලධාරීන්ට අවශ්‍ය පරිදි දැන ගැනීමට හා ක්‍රියාත්මක කිරීම සඳහා සහාය ලබාදීම.
4. ජාතික රේගු තීරුබදු නිරතුරුවම යාවත්කාලීන ලෙස පවත්වාගෙන යාම සහතික වීම, සියලුම තීරුබදු සම්බන්ධ විමසුම් වලට අවශ්‍ය කටයුතු කිරීම, තීරුබදු සම්බන්ධ ආරවුල් නිරාකරණය කිරීම.
5. රේගු තොරතුරු මධ්‍යස්ථානය මගින් මහජනතාව වෙත ස්වයං අනුගතවීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීම.
6. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව ලෝක රේගු සංවිධානයේදී හා එහි ප්‍රාදේශීය සංවිධානවලදී හා අනෙකුත් අන්තර් ජාතික සංවිධාන(ලෝක රේගු සංවිධානය හා බහුවිධ පාරිසරික ගිවිසුම්) හා ද්විපාර්ශවික හා බහු පාර්ශවික වෙළඳ සංවිධාන වලදී නියෝජනය කිරීම.
7. දෙපාර්තමේන්තුවේ දැක්ම ළඟා කරගනු පිණිස ලෝක රේගුඅ සංවිධානයේ නිර්දේශ හා සාර්ථක අත්දැකීම් ප්‍රතිපත්ති හා ක්‍රියාපරිපාටි බවට පත් කිරීම මගින් එම සංවිධානයේ කටයුතුවලට අනුගත වීම.

**ප්‍රධාන කාර්යයන්:**

1. **දෙපාර්තමේන්තු නියෝග** (DOPLs)මගින් මහා භාණ්ඩාගාරයේ තීරුබදු ප්‍රතිපත්ති පිළිබඳ තීරණ ක්‍රියාත්මක කිරීම
2. රේගුවේ ප්‍රතිපත්තිමය තීසෘණ දෙපාර්තමේන්තු නියෝග මගින් ක්‍රියාවට නැංවීම.
3. ආනයන තීරුබදු මාර්ගෝපදේශ සංග්‍රහය යාවත්කාලීන කිරීම.
4. මහජනතාවගේ හා නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා ජාතික ආනයන තීරුබදු මාර්ගෝපදේශ සංග්‍රහය සංයුක්ත තැටි හා පොත් වශයෙන් එළි දැක්වීම.
5. අවශ්‍ය වූ අවස්ථාවන්හිදී තීරුබදු ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා HS කේත ක්‍රමයේ උප බෙදීම් නිර්මාණය කිරීම සඳහාම හා භාණ්ඩාගාරයට සහාය වීම.
6. දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම.
7. අදාළ අංශයන්හි ප්‍රගතිය විමර්ශනය කිරීමෙන් අනතුරුව දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා සකස් කිරීම.
8. ලෝක රේගු සංවිධානය, ලෝක රේගු සංවිධිනයේ ආසියා පැසිපික් කාර්යාලය, ලෝක වෙළඳ සංවිධානය, අනෙකුත් අන්තර්ජාතික සංවිධාන හා රේගු පාලනාධිකාරීන් සමඟ ගනුදෙනු කිරීමේ අනෙකුත් අදාළ කටයුතු පිළිබඳව සම්බන්ධ වන සම්බන්ධීකරණ ස්ථානය (contact point)
9. අනෙකුත් රේගු පාලනාධිකාරීන් සමඟ රේගු සහයෝගිතා හා අන්‍යෝන්‍ය පරිපාලන සහයෝගිතා ගිවිසුම්වලට අදාළ කටයුතු වලට මැදිහත් වීම.
10. නිදහස් වෙළඳ ගිවිසුම් හා වරණීය වෙළඟ ගිවිසුම්වලට සම්බන්ද කටයුතු වලට මැදිහත්වීම.
11. නාමකරණ කමිටුව, වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ කමිටුව, අවදානම් කළමනාකරණ කමිටුව හා අනෙකුත් තාක්ෂණ කමිටුවලට අදාළ ලේඛණ කටයුතු කිරීම හා අනෙකුත් තාක්සණ කමිටුවල කටයුතු සම්බන්ධීකරණය කිරීම.
12. තීරුබදු වෙළඳම හා නිශ්කාෂණ පරිපාටි ආදි කරුණුවලට අදාළ පර්යේසණ කටයුතු සිදු කිරීම.
13. කාර්ය පරිපාටි අත්පොත සකස් කිරීම හා යාවත්කාලීන කිරීම.
14. විනිමය හුවමාරු අනුපාතික දැන්වීම් සකස් කිරීම හා ප්‍රසිද්ධ කිරීම.
15. මහජන සම්බන්ධතා හා රේගු තොරතුරු මධ්‍යස්ථානයට අදාළ කටයුතු සිදු කිරීම.
16. වාර්ෂිකව ලෝක රේගු දින උත්සවයක් සංවිධානය කිරීම.

## රේගු තීරුබදු නාමාවලිය:

සාම්ප්‍රදායිකව ශ්‍රී ලංකා රේගුවට අන්තර්ජාතික වෙළඳාමේදී පනවා ඇති සියලු බදු රැස් කිරීම පිළිබඳ වගකීම පැවරී ඇත. 2013 වර්ෂය තුළ ආනයන භාණ්ඩ සම්බන්ධයෙන් රේගුව විසින් ආනයන බද්ද, නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද,

ආනයන සෙස් බදු, වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු, එකතු කළ අගය මත බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද යන බදු මගින් ආදායම් රැස්කර ඇත. සමහර අපනයන භාණ්ඩ සම්බනධයෙන් අපනයන බදු හා ආනයන සෙස් බදු ගෙවිය යුතුවේ. ඊට අමතරව සමහර අත්‍යාවශ්‍ය පරිභෝජන භාණ්ඩ සම්බන්ධව විශේෂ භාණ්ඩ බද්ද කාලානුරූපව පනවන ආකාරයට ගෙවිය යුතුය. මෙම විවිධ බදු නිසා රේගු තීරු බදුවල දැක්වෙන එක් එක් භාණ්ඩය සඳහා විවිධ බදු පැනවෙන අතර එය සංකීර්ණ ලේඛණයක් බවට පත්ව ඇත. මීට අමතරව ශ්‍රී ලංකාව හා ද්විපාර්ශ්වික හා බහු පාර්ශ්වික වෙළඳ ගිවිසුම් ඇති කරගත් රටවල නිෂ්පාදන භාණ්ඩ සඳහා වරණීය තීරුබදු අයකරනු ලබයි. තවද එම බදු වටිනාකම මත හා ඒකක මත අයකරන බදු අනුපාත වශයෙන්ද ගනු ලබයි. මෙලෙස සංකීර්ණත්වයට පත්වන තීරුබදු සාමාන්‍ය ජනතාවට මෙන්ම රේගු නිලධාරීන්ටද මෙම සියලු බදු හා බදු අනුපාත මතක තබා ගැනීමට අපහසු වී ඇත. එම නිසා රේගු දෙපාර්තමේන්තුව පසුගිය දශකයේ සිට අයවැය අවසානයේ වාර්ෂික තීරුබදු නාමාවලියක් තනි පොතක් ලෙස එළිදැක්වීමට කටයුතු යොදා ඇත. එහි එක් එක් භාණ්ඩ සඳහා අයවිය යුතු රේගු බදු හා බදු අනුපාත වෙන වෙනම දක්වා ඇත.

## දෙපාර්තමේන්තුමය චක්‍රෙල්ඛ

ප්‍රතිපත්තිමය තීරණයක් සංනිවේදනය කිරීමට අවශ්‍ය වූ විට දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ නිකුත් කරනු ලැබේ. එමෙන්ම පවත්නා ක්‍රියා පරිපාටින්හි වෙනසක් සිදු වූ විටද, නව ක්‍රියා පරිපාටි හඳුන්වාදීමට අවශ්‍ය වූ විටද, එසේ නැතහොත් ක්‍රියා පරිපාටි අත් පොතෙහි වෙනසක් සිදු වූ විටද මේ ආකාරයට දෙපාර්තමේන්තු චක්‍රලේඛ නිකුත් කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස දෙපාර්තමේන්තු චක්‍රලේඛ වැදගත් නිල ප්‍රවෘත්ති මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරයි. අදාළ අංශයන්හි ප්‍රතිපත්ති පිළිබඳ සංකල්ප බිහිවන අතර ඒවා ප්‍රතිපත්ති සැලසුම් හා පර්යේෂණ අංශයට යොමු කෙරේ. අන්තර්ගතය පවත්නා චක්‍රලේඛ සමඟ අන්තර්ගතය හා ක්‍රියා පටිපාටි සසඳා නොගැලපීම් ඇත්දැයි පරීක්ෂා කොට අවසාන වශයෙන් එහි පෙළ සකස් කෙරේ. ඉන්පසු එම චක්‍රෙල්ඛය නිල ස්වරූපයක් දරණ අතර නියමිත ආකෘතියට අනුව සැකසේ. එය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කිරීමෙන් පසුව මුද්‍රණය කොට බෙදා හැරේ. බෙදා හැරීමද ඇතුළුව මෙම සම්පූර්ණ ක්‍රියාවලිය කාලය වැයවන නීරස එකක් වුවද මෙම අංශය මෙකී චක්‍රෙල්ඛ ප්‍රමාදයකින් තොරව නිකුත් කිරීමට උත්සාහ ගනු ලබන්නේ එමගින් පළමුවෙන්ම ඉතා වැදගත් උපදෙස් කාර්ය මණ්ඩලයට නිකුත් කිරීම සඳහා චක්‍රෙල්ඛ අවශ්‍ය වන බැවිණි.

ආදායම් ආරක්ෂණ නියෝජග තවත් චක්‍රලේඛ විශේෂයක් වන අතර ඒවා සකස් කොට මුද්‍රණය කොට අවම කාලයක් තුල නිකුත් කළ යුතුවේ. (බොහෝ විට වැඩ කරන දිනය තුළම) මෙමගින් බදු හා අය බදු වල වෙනස්කම් සන්නිවේදනය කරනු ලබන අතර එමගින් නිලධාරීන්ට ඒවා බලාත්මක වන දිනයේ හා වේලාවේ සිටම නව අනුපාතයන්ට අනුව රැස්කර ගැනීමට ඉඩ ලැබේ. මෙකී වෙනස්කම් මහා භාණ්ඩාගාරයෙන් නිකුත් වන අතර මෙම නියෝග බදුකරණයේ වැදගත් කොටසක් නියෝජනය කරයි.

## විනිමය අනුපාත චක්‍රලේඛ

සියලුම ආනයනයන්හි වටිනාකම් විදේශ විනිමය අනුපාතිකයන්ගෙන් ප්‍රකාශයට පත් වෙන අතර ඒවා ශ්‍රී ලංකා රුපියල් වටිනාකමට පරිවර්තනය කිරීමට රේගුවට සිදුවේ. බැංකු හා මුදල් මාරු කරන්නන් විසින් භාවිත කෙරෙන නිරන්තරයෙන් වෙනස්වන (පාවෙන) විනිමය අනුපාතික මෙන් නොව ශ්‍රී ලංකා රේගුව වැඩකරන සතියක් සඳහා බලපවත්වන විනිමය අනුපාතික භාවිත කරයි. සෑම සති අන්තයකම විනිමය හුවමාරු අනුපාතික වෙනස්වන අතර ඊළඟ සඳුදා සිට නව අනුපාතික බලපවත්වයි. එකී අනුපාතික ශ්‍රී ලංකා මහ බැංකුව මගින් තීරණය කරන අතර සෑම සිකුරාදාවකම ඒවා ප්‍රසිද්ධියට පත් කර දැනුම් දෙනු ලබනුයේ ප්‍රතිපත්ති සැලසුම් හා පර්යේෂණ අංශය මගිනි. මෙය රේගුවේ සංනිවේදන හා තොරතුරු තාක්ෂණ අංශය මගින් රේගු වෙබ් අඩවියටද ඇතුළත් කරනු ලබයි. මෙම චක්‍රලේඛය බදුකරණයේ නියුක්ත වෙළඳ ව්‍යාපාරිකයන්ට හා නිලධාරීන්ට අත්‍යාවශ්‍ය මහ පෙන්වන ලේඛනයකි.

## අන්තර්ජාතික කටයුතු

මෙම අංශයේ නමෙහි අන්තර්ගත නොවූවද ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශයට රේගු කටයුතු සම්බන්ධ අන්තර් ජාතික කටයුතු පිළිබඳ වගකීම ද පැවරී ඇත. මේ යටතට වැටෙන ප්‍රධාන කර්තව්‍යයක් වන්නේ ලෝක රේගු සංවිධාන හා එහි ආසියා පැසිපික් කලාපීය කාර්යාලය සමඟ අදහස් හුවමාරු කර ගැනීමට කටයුතු කිරීමයි. ලෝක රේගු සංවිධානය නිරන්තරයෙන් නිවේදන නිකුත් කරන අතර ඒවාට සුදුසු ලෙස ප්‍රතිචාර දැක්විය යුතුවේ. ශ්‍රී ලංකා රේගුවට වර්ගීකරණ ගැටළු විසඳ ගැනීමට අපහසු වූ කල්හි එවන් ආරවුල් සහගත තත්ත්වයන් ලෝක රේගු සංවිධානය වෙත යොමු කරනු ලැබේ. **HS** නාමකරණයට අදාළ වෙනස්කම් ලෝක රේගු සංවිධානය විසින් දැනුම් දෙන අතර මෙම අංශය ඒවාට අනුගත වීමට කටයුතු කරනු ලබයි. ඊට අමතරව, ප්‍රතිපත්ති සැලසුම් හා පර්යේෂණ අංශය, කලාපීය ද්විපාර්ශ්වික හා බහු පාර්ශවික වෙළඳ ගිවිසුම් වලට සම්බන්ධ අන්‍යොන්‍ය රේගු සහයෝගිතාවට අදාළ වගන්ති පිළිබඳ කටයුතු කිරීමේ වගකීම දරයි. දැනට ඉන්දියාව ශ්‍රී ලංකාවේ විශාලතම වෙළඳ හවුල්කරු වන අතර පාකිස්ථානය දෙවන විශාලතම හවුල්කරු වේ. ඉන්දු ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික රේගු අන්‍යොන්‍ය සහයෝගිතා ක්‍රියාකාරකම් හොඳින් ස්ථාපිත වූ යෝජනා ක්‍රමයක් බවට පත්ව ඇත. පාකිස්ථාන රේගුව සමඟ අන්‍යොන්‍ය සහයෝගිතාව වර්ධනය කිරීම සඳහා වන එකී යන්ත්‍රනය මේ වන විට නිසි ආකාරයට වර්ධනය වීමට පටන් ගත්තා පමණි. පිළිවෙලින් ඉන්දියාව හා පාකිස්ථානය සමඟ වන ද්විපාර්ශ්වික ගිවිසුම්වලට අමතරව ශ්‍රී ලංකාව, ඉරානය, ඉරාකය, පකිස්ථානය හා මෙක්සිකෝව ආදී රටවල් සමඟ රේගු සහයෝගිතාවන් ගොඩ නගා ගැනීමට ඇති හැකියාවන් සම්බන්ධව ක්‍රියාකාරී ලෙස සොයා බලමින් සිටී.

## අන්තර්ජාතික වෙළඳ ගිවිසුම්

| | |
|---|---|
| SAARC | සාර්ක් ප්‍රාදේශීය දුම්රිය මාර්ග ගිවිසුම් කෙටුම්පත හා මෝටර්රථ වාහන පිළිබඳ ගිවිසුම් කෙටුම්පත |
| SAFTA | දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම |
| SAPTA | දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම |

## දෙපාර්තමේන්තුමය තාක්ෂණික කමිටුව

ප්‍රතිපත්ති සැලසුම් හා පර්යේෂණ අංශයට ඉතා වැදගත් තාක්ෂණික කමිටුවක් සඳහා ලේඛණ කටයුතු හා සේවා පහසුකම් සැපයීමට සිදුව තිබේ. ඒවා නම්,

1. රේගු නාමකරණ හා වර්ගීකරණ කමිටුව ( මෙය NC කමිටුව ලෙසද හැඳින් වේ.)

සෑම අඟහරුවාදාම රැස් වන NC කමිටුව වර්ගීකරණයට අදාළ ගැටළු හා ආරවුල් සම්බන්ධව කටයුතු කරන අතර 2013 වර්ෂයේදී එලෙස 33 වතාවක් රැස්වී ඇත.

## සැලසුම්කරණයට අදාළ කටයුතු

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය කිරීම හා ඊළඟ වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම තීරණය කිරීම ද මෙම අංශයට පැවරී ඇති වගකීම් දෙකක් වේ. දෙපාර්තමේන්තුව ආරම්භ කර ඇති ප්‍රධාන කාර්යයන්හි ප්‍රගති සමාලෝචනය කිරීම ද වාර්ෂික කාර්ය සාධන සැලැස්ම සකස් කිරීම ද පැවරී ඇති තවත් කාර්යයන් වේ.

මෙම අංශය මගින් සිදුකරනු ලබන තවත් වැදගත් කාර්යයක් වන්නේ ජාතික හා අන්තර් ජාතික සංවිධාන සමඟ එළඹෙන අවබෝධතා ගිවිසුම් (උදාහරණ වශයෙන් අනෙකුත් රටවල රේගු සමඟ) වලට අදාළ සියලු කටයුතු සිදු කිරීමයි.

## පර්යේෂණ කටයුතු

මෙම අංශය අනිකුත් අංශ වලින් මාසිකව ප්‍රගති වාර්තා ලබා ගන්නා අතර, පරිපාලනයට අවශ්‍ය පරිදි පර්යේෂණ කටයුතු සිදු කරනු ලබයි. ආදායම් පිළිබඳ විශ්ලේෂණය මෙම අංශයේ ප්‍රධානම කාර්යයන්ගෙන් එකක් වන අතර එමගින් ආදායම් කාර්ය සාධනයට සවිස්තරාත්මක විග්‍රහයක් ලබා දෙයි.

## 2013 කාර්ය සාධනය

2013 වර්ෂය තුළ මෙම අංශය විනිමය අනුපාත වලට අදාළ චක්‍රලේඛ 52 ක් හා දෙපාර්තමේන්තු නියෝග 85 ක් නිකුත් කර ඇත.

- වැට් සංශෝධන 04
- නිෂ්පාදන බදු සංශෝධන 06
- වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු සංශෝධන 01
- විශේෂ භාණ්ඩ බදු සංශෝධන 09
- සෙස් බදු සංශෝධන 07
- ආදායම් ආරක්ෂණ නියෝග 03
- ජාතිය ගොඩනැගීමේ බදු සංශෝධන 01

## 2013 වර්ෂයේ නිකුත් කළ දෙපාර්තමේන්තු චක්‍රලේඛ

| DOPL NO | දිනය | RELATED TO | SUBJECT |
|---|---|---|---|
| 841 | 01.01.2013 | පොදු | රේගුවේ ප්‍රතිරූපය වර්ධනය කිරීම |
| 842 | 10.01.2013 | ආනයන පාලන බලපත්‍රය (ICL) | HCFC අඩංගු ශීතකාරක මිශ්‍රණයන් හා HCFC ආනයන කිරීම සඳහා වාර්ෂික පංගුව (Quota) ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම |
| 843 | 16.01.2013 | පහසුකම් තාවකාලිකව නවතාලීම | - එම - |
| 844 | 09.01.2013 | සමාජ ආරක්ෂණය | රේගු දෙපාර්තමේන්තුවට මාධ්‍ය ප්‍රකාශකවරයෙකු පත් කිරීම |
| 845 | 22.01.2013 | සෙස් බද්ද | ආනයන මත EDB සෙස් බද්ද |
| 846 | 22.01.2013 | සෙස් බද්ද | අපනයන මත EDB සෙස් බද්ද |

| | | | |
|---|---|---|---|
| 847 | 30.01.2013 | සුරාබදු(Excise duty) | මෝටර් රථ වාහන හා ගුවන්තොටුපල මගී ප්‍රවාහනය මත සුරාබදු පැනවීම (Excise Duty) |
| 848 | 08.02.2013 | VAT | ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ඖෂධ වර්ග සඳහා භාවිතා කරන VAT බද්දෙන් නිදහස් කිරිම. |
| 849 | 12.02.2013 | විශේෂ භාණ්ඩ බද්ද SCL | විශේෂ භාණ්ඩ බද්ද සංශෝධනය කිරීම |
| 850 | 14.02.2013 | වලංගු මුදල් | ශ්‍රී ලංකාවේ වලංගු මුදල් ආනයනය/අපනයනය |
| 852 | 20.02.2013 | ආදර්ශයන් (Samples) | අපනයනික වෙළඳ ආදර්ශයන් සඳහා වන වටිනාකම් සීමාව ඉහළ දැමීම. |
| 853 | 01.03.2013 | එතනෝල් | එතනෝල් අපනයනය තහනම් කිරීම |
| 854 | 01.03.2013 | මිළ තක්සේරු කිරීම | මෝටර් රථ සඳහා වන මිල තක්සේරු උප කමිටුව |
| 855 | 01.03.2013 | අතිකාල දීමනා | අතිකාල දීමනා කමිටු තීරණ |
| 856 | 06.03.2013 | STVD / RTF | STVD ,RTF ලෙස නැවත නම් කිරිම |
| 857 | 21.03.2013 | උපරිම සිල්ලර මිළ MRP | උපරිම සිල්ලර මිළ (MRP) ලකුණු කිරීමේ සේවා සපයන්නා ලෙස ග්ලෝබල් ට්‍රාන්ස්පෝර්ට් සහ ලොජිස්ටික් පුද්ගලික සමාගම පත් කිරිම. |
| 858 | 08.04.2013 | සුරාබදු | ඊතයිල් ඇල්කොහොල් සඳහා සුරාබදු පැනවීම |
| 859 | 18.04.2013 | ආනයන | වාහන ආනයනය සම්බන්ධයෙන් වන රේගු විකමර්ශන සඳහා පහසුකම් සැලසීම. |
| 860 | 07.05.2013 | විශේෂ භාණ්ඩ බද්ද | විශේෂ භාණ්ඩ බද්ද - ආර්තාපල් අල |
| 861 | 08.05.2013 | CIB | රේගු විමර්ශන හා විභාග කිරීම් |
| 862 | 09.05.2013 | මගීන් කැටුව නොඑන පුද්ගලික භාණ්ඩ | Colombo Cargo Express හරහා මගීන් කැටුව නොඑන පුද්ගලික භාණ්ඩ නිෂ්කාශණය කිරීම. |
| 863 | 07.06.2013 | විශේෂ භාණ්ඩ බද්ද | විශේෂ භාණ්ඩ බදු සංශෝධනය |
| 864 | 21.06.2013 | ආනයන | මෝටර් රථ සඳහා වන පූර්ව නැව්ගත කිරීමේ සහතිකය Pre - Shipment certificate |
| 865 | 21.06.2013 | රත්රන් | රත්රන් සඳහා රේගු බදු පැනවීම |
| 866 | 21.06.2013 | රත්රන් | රත්රන් මත අධිභාරයක් පැනවීම. |
| 867 | 11.07.2013 | විශේෂ භාණ්ඩ බද්ද | ලොකුළුණු මත විශේෂ භාණ්ඩ බදු සංශෝධනය |
| 868 | 31.07.2013 | ප්‍රමිති සහතකිය | කුරුඳ අපනයන සඳහා වන ප්‍රමිතිකරණය හා තත්ව පාලන රෙගුලාසි |
| 869 | 31.07.2013 | මණික් | රටින් පිටවන මගීන් හරහා මැණික් ගල් අපනයනය කිරීමේ විශේෂ යෝජනා ක්‍රමය |
| 870 | 31.07.2013 | ආදායම් සංරක්ෂණ නියෝග අංක 2 RPO 02.2013 සුරාබදු | ආදායම් සහතික නියෝග අංක 2/2013 සුරාබදු හා RPO 02/2013 සංශෝධනය |
| 871 | 31.07.2013 | සුරාබදු | ඊතයිල් ඇල්කොහොල් සඳහා වන සුරාබදු සංශෝධනය |
| 872 | 02.08.2013 | විශේෂ භාණ්ඩ බද්ද | සීනි සඳහා විශේෂ භාණ්ඩ බද්ද |
| 873 | 02.08.2013 | ආනයන පාලන බලපත්‍රය | තරුව (fork) සහතිව හෝ රහිතව යතුරු පැදි බඳ ආනයනය කිරීම |
| 874 | 05.08.2013 | මෝටර් රථ අවසරපත්‍රය | මෝටර් රථ අවසරපත්‍ර අංක 01/2010 ට කෙරෙන සංශෝධනය |
| 875 | 08.08.2013 | කිරිපිටි | DCD අඩංගු විය හැකි කිරිපිටි. |
| 876 | 13.08.2013 | පොදු | 2013/01 දරණ වාණිජ කේන්ද්‍ර රෙගුලාසි සහිත මූල්‍ය පනත |
| 877 | 19.08.2013 | ආනයන | බෝතල්කල පානීය ජලය සම්බන්ධයෙන් වන ආහාර පාලන රෙගුලාසි |
| 878 | 19.08.2013 | කිරිපිටි | DCD අඩංගු විය හැකි ආනයනික කිරිපිටි පරීක්ෂා කිරීම සඳහා වන යෝජනා ක්‍රමය |
| 879 | 23.08.2013 | විශේෂ භාණ්ඩ බද්ද | අර්තාපල් හා ලොකුළුනු සඳහා වන විශේෂ භාණ්ඩ බද්ද සංශෝධනය |
| 880 | 27.08.2013 | CDDA | ඖෂධ ලියාපදිංචි කිරීමේ සහතික අවලංගු කිරීම |
| 878A | 27.08.2013 | කිරිපිටි | DCD අඩංගු විය යුතු ආනයනික කිරිපිටි පරීක්ෂා කිරීමේ |
| 881 | 11.09.2013 | CSD's | මහලුම් ආරක්ෂා කිරීමේ ක්‍රමවේදයකට ප්‍රවේශවීම |
| 880A | 16.09.2013 | නිවැරදි කිරිම් | DOPL 880 හි නිවැරදි කිරීම් |
| 854C | 25.09.2013 | මෝටර් රථ වාහන | මෝටර් රථ තක්සේරු කිරීමේ අනු කමිටුව |
| 882 | 25.09.2013 | සෙස් බද්ද | HS 25.05 ට සිදුකල අපනයන සෙස් බද්ද |
| 883 | 26.09.2013 | PCAD | Compliance නම්නීකරණ හා පහසුකම් සැලසීමේ අංශය |

| | | | |
|---|---|---|---|
| 884 | 09.10.2013 | ඖෂධ වර්ග | නිකෝබෝල්ට්(Nickobolt) සඳහා වන රේගු නිශ්කාෂණය |
| 885 | 23.10.2013 | ICT අරමුදල | අතිකාල හා ICT අරමුදල සඳහා වන සංශෝධන |
| 886 | 29.10.2013 | රේගු පහසුකම් තාවකාලිකව අත්හිටුවීම | රණතුංග මෝටර්ස් සඳහා වන රේගු පහසුකම් තාවකාලිකව අත්හිටුවීම. |
| 869A | 12.11.2013 | ගමන් බඩු | අනේවාසික පිටව යන මගීන් හරහා මැණික්ගල් අපනයනය කිරිම |
| 887 | 19.11.2013 | විශේෂ භාණ්ඩ බද්ද | අර්තාපල් හා බීළූනු මත පනවන විශේෂ භාණ්ඩ බද්ද |
| 866A | 21.11.2013 | අයවැය 2014 - අධිභාරය | රත්රන් මත පනවා තිබූ අධිභාරය ඉවත් කිරිම |
| 888 | 21.11.2013 | අයවැය 2014 - විශේෂ භාණ්ඩ බද්ද | විශේෂ භාණ්ඩ බද්දට කෙරෙන සංශෝධන |
| 889 | 21.11.2013 | අයවැය 2014 - මෝටර් රථ වාහන | පාවිච්චි කළ මෝටර් රථ ක්ෂය වීමේ වගු සටහන |
| 890 | 21.11.2013 | අයවැය 2014 - ආදායම් සංරක්ෂණ නියෝග | ආදායම් සංරක්ෂණ නියෝග 03/2013 |
| 891 | 21.11.2013 | අයවැය 2014 - සුරාබදු | සුරාබදු (විශේෂ විධිවිධාන) |
| 892 | 21.11.2013 | අයවැය 2014 - සෙස් බද්ද | ආනයන මත පනවන සෙස් බදු අනුපාත |
| 893 | 21.11.2013 | අයවැය 2014 - සෙස් බද්ද (අපනයන) | අපනයන මත පනවන සෙස් බදු අනුපාත |
| 894 | 23.11.2013 | අයවැය - 2014 - PAL ගුවන් තොටුපල බද්ද | ආනයන මත පනවන ගුවන් තොටුපල බද්ද |
| 890A | 27.11.2013 | දෝෂ (නිවැරදි කිරීම්) | RPO 03/2013 හි දෝෂ නිවැරදි කිරීම |
| 892A | 27.11.2013 | දෝෂ (නිවැරදි කිරීම්) | අයවැය 2014 හි සෙස් බද්ද සම්බන්ධයෙන් වන දෝෂ නිවැරදි කිරීම |
| 895 | 27.11.2013 | ආනයන පාලන බලපත්‍රය | ආනයන පාලන බලපත්‍රය අවශ්‍යතා |
| 896 | 27.11.2013 | කජු | ගුවන් තොටුපල හරහා කෙරෙන කජු ආනයනය |
| 897 | 27.11.2013 | BIA | පිටව යන මගීන් සතු ස්වර්ණාභරණ |
| 898 | 06.12.2013 | පහසුකම් තාවකාලිකව අත්හිටුවීම | Hash ජාත්‍යන්තර සමාගමට ලබාදෙන රේගු පහසුකම් තාවකාලිකව අත්හිටුවීම |
| 899 | 09.12.2013 | BIA | පිටව යන මගීන් සතු ස්වර්ණාභරණ (දෙපාර්තමේන්තු නියෝග අංක 897 අවලංගු කිරීම) |
| 900 | 19.12.2013 | අපනයන බලපත්‍ර | අපනයනික ගෘහ භාණ්ඩ, පැළෑටි බීජ වර්ග හා වෙනත් ශාකමය නිෂ්පාදන සඳහා බලපත්‍ර ලබාගැනීම. |
| 901 | 26.12.2013 | ශක්ති ජනක පානයන් | ශක්ති ජනක පානයන් නිශ්කාසණය කිරගනැීම සඳහා වන අවශ්‍යදෑ. |
| 902 | 31.12.2013 | අයවැය 2014 - ජාතිය ගොඩනැගීමේ බද්ද | අයැවැය 2014 ට අදාුළ ජාතිය ගොඩනැීමේ බද්දට කෙරෙන වෙනස්කම් |
| 903 | 31.12.2013 | අයවැය 2014 - VAT බද්ද | අයවැය 2014 ට අදාළව VAT බද්දට කෙරෙන වෙනස්කම් |
| 905 | 31.12.2013 | ගුවන් ගමන්බඩු | ගුවන් ගමන්බඩු මෙහෙයවීම සඳහා ගබඩා පහසුකම් ප්‍රතිෂ්ඨාපනය කිරීම. |

## අලුතෙන් විවෘත කරන ලද දෙපාර්තමේන්තු විෂයානුබද්ධ ලිපිගොණු

| දිනය | PL No: | විස්තරය |
|---|---|---|
| 02.01.2013 | 713 | මහජනතාවට කෙරෙන දැනුම්දීම |
| 09.01.2013 | 714 | ඉමල්ෂන් ආශ්‍රිත පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා කර්මාන්තශාලාවක ස්ථාපිත කිරීම |
| 15.01.2013 | 715 | ව්‍යාපාරිකයන්ට, ආනයනකරුවන්ට හා අපනයනකරුවන්ට අනතුරු ඇඟවීම් කරන පුවත්පත් දැන්වීම |
| 31.01.2013 | 716 | ආනයනකරුවන් විසින් ගෙවිය යුතු උපරිම සිල්ලර මිළ පාදක කරගත් සෙස්බද්ද සම්බන්ධයෙන් සේවා සපයන්නකු ලෙස ලියාපදිංචි වීම සඳහා "Global Park" ආයතනයෙන් විමසිය යුතු බව. |
| 05.02.2013 | 717 | ඵලදායිතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය |
| 19.02.2013 | 718 | ශ්‍රී ලංකාව හා කෙන්යාව අතර වන ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම |
| 19.02.2013 | 719 | 2013 වසරට අදාළ ක්‍රියාකාරකම් සඳහා වන දින දර්ශනය රේගු කටයුතු සම්බන්ධයෙන් වන තුන්වැනි සාක් පුහුණුවීම් වැඩසටහන |
| 28.03.2013 | 720 | ගුවන් විදුලි උපකරණ ගෙන්වීම සම්බන්ධයෙන් වන බලපත්‍ර අවශ්‍යතා |
| 08.04.2013 | 566 B | රේගු කටයුතු සම්බන්ධයෙන් වන ඉන්දු - ශ්‍රී ලංකා සාමූහික හා අන්‍යොන්‍යාධාර ගිවිසුම |
| 10.04.2013 | 721 | 2013.01.31 දින දරණ අංක 1795/35 අතිවිශේෂ ගැසට්පත්‍රය |
| 08.05.2013 | 722 | දෙපාර්තමේන්තු ක්‍රියාපටිපාටිය පිළිබඳ වන අත්පොත |
| 04.06.2013 | 723 | නෞකා තුළ ඉතිරිවන දැනුවුණු තෙල් ඉවත් කිරීම |
| 13.06.2013 | 724 | Basal සම්මුතිය ක්‍රියාත්මක කිරීම සම්බන්දෆයන් වන ජාතික සහයෝගිතා කමිටු රැස්වීම |
| 14.08.2013 | 725 | ලෝක රේගු සංවිධානය සමඟ ගනුදෙනු කරන ලියවිලි |
| 11.09.2013 | 726 | කැගල්ල වැව්ලි සමාගම (Centrifugal separators) කේන්ද්‍රාපසාරී වෙන් කිරීමේ උපකරණ ආනයන කිරීමේදී පනවන VAT බද්ද) 0 |
| 23.10.2013 | 727 | ලෝක රේගු සංවිධානයේ ඉහළ විද්‍යුත් ක්‍රමවේදයක් ඔස්සේ භාණ්ඩ හා සම්බන්ධ තොරතුරුවල අවශ්‍යතාවයන් පිළිබඳ සමීක්ෂණය |
| 25.10.213 | 728 | ජල සවිකිරීම් හා අමතර කොටස් හඳුනාගැනීම සඳහා වන සංයෝජිත වර්ගීකරණයන්හි ජාතික උප ශීර්ෂ හඳුන්වාදීම. |

## HSC හා RSC සඳහා වූ ලෝක රේගු සංවිධානයේ රැස්වීම

**ප්‍රතිපත්ති හා සැලසුම් පර්යේෂණ අංශයේ රේගු අධ්‍යක්ෂතුමා හා NC කමිටුවේ සාමාජිකයින් 2013 මාර්තු හා සැප්තැම්බර් HSC** සැසිවාර සඳහා 2013 ජුනි හා නොවැම්බර් **RSC** සැසිවාර සඳහා සහභාගි වූහ.

## 2013 අයවැය සඳහා ඇතුලත් කෙරුණුවස් TIP ඉදිරිපත් කළ NSD වල විස්තර

1. දියර සපත්තු පොලිෂ් ආලේපන
2. විල්බැරෝ හා අමතර කොටස්
3. හයිබ්‍රිඩ් ඩීසල් වාහන
4. පොල් වතුර
5. මුද්‍රණය කරන ලද පොලිසඑතිලීස් ෆොයිල්

## රේගු අධ්‍යක්ෂතුමා හා නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරු සහභාගිවූ රැස්වීම්

1. වාණිජ දෙපාර්තමේන්තුව
2. ආනයන/අපනයන පාලක දෙපාර්තමේන්තුව
3. විදේශ කටයුතු අමාත්‍යාංශය
4. පරිසර අධිකාරිය
5. මුදල් අමාත්‍යාංශය

රේගු දෙපාර්තමේන්තුවේ රාජකාරි ක්‍රියාත්මක කිරීමේ පටිපාටිය සකස් කිරීම මෙම අංශයේ තවත් කාර්යයකි. පහත දැක්වෙන අංශවල ඒවා නිමකර ඇත.

1. භාණ්ඩ පරීක්ෂණ අංශය
2. අපනයන අංශය
3. මිළ පිරික්සුම් අංශය

## PP&R අංශය මගින් සංවිධානය කරනු ලබන වැඩසටහන්

**1. ජාත්‍යන්තර රේගු දිනය**

| | |
|---|---|
| දිනය | – 27.02.2013 |
| ස්ථානය | – රේගු මූලස්ථානය |
| තේමාව | – රේගුවේ දියුණුව සඳහා නවීකරණය |
| ප්‍රධාන ආරාධිත අමුත්තා | – ආචාර්ය පී.බී. ජයසුන්දර, භාණ්ඩාගාර ලේකම් |

**2. රේගු සහයෝගිතාව සඳහා වූ 9 වැනි සාර්ක් උපකමිටු රැස්වීම හා රේගු කටයුතු සඳහා වූ 3 වැනි වැඩසටහන**

| | |
|---|---|
| දිනය | – 18-21 June 2013 |
| ස්ථානය | – මවුන්ට් ලැවීනියා හෝටලය |
| සහභාගී වූ රටවල් | - සාර්ක් රටවල් සහ ඇෆ්ගනිස්ථානය |

**3. HS 2012 හා සංශෝධන හඳුන්වාදීමේ පුහුණු වැඩසටහන**

| | |
|---|---|
| දිනය | – 18/19 ජුනි 2013 |
| ස්ථානය | – මවුන්ට් ලැවීනියා හෝටලය |
| සම්පත්දායකත්වය | – ආර්.පී.ඩී.පී. සෙනෙවිරත්න මහතා |

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

ප්‍ර දේශයන්හි

හැඳින්වීම

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ අරමුණ වන්නේ පැය විසිහතර පුරාම නිරන්තරයෙන් දෙපාර්තමේන්තුව වෙත රේගු ප්‍රකාශන පිළිබඳ කටයුතු කිරීමට හා අන්තර්ජාල සේවාවන් පවත්වාගෙන යාමට අවශ්‍ය තාක්ෂණ, සේවා හා පහසුකරණයන් ලබාදීමයි. රේගු ප්‍රකාශන සම්බන්ධව කටයුතු කිරීමේ ක්‍රියාවලිය පූර්ණ වශයෙන් ස්වයංක්‍රියකරණය කිරීමෙන් යහපත් රේගු පරිපාලනයක් සඳහා වේගවත්, ගුණාත්මක තොරතුරු පද්ධති ඵලදායී හා ප්‍රතිඵලදායී හා කාර්යක්ෂම ලෙස ලබා දීම සහතික කරයි. මෙම අංශය මේ වන විට වඩා ඵලදායී හා බිඳවැටීම් වලින් තොර තොරතුරු තාක්ෂණය පදනම් කරගත් පද්ධති ස්ථාපිත කිරීමටත්, රේගු ප්‍රකාශන හා ඊට අදාළ සහාය ලියකියවිලි ඉලෙක්ට්‍රෝනිකව ගබඩා කර තැබීමටත් අවශ්‍ය කටයුතු කරමින් සිටියි.

**ප්‍රධාන කාර්යයන්**

1. ස්වයංක්‍රියකරණය තුළින් ආයතනික අරමුණු ඉටුකර ගැනීමට සහාය වීම.
2. පද්ධති ජාලය, පරිගණක හා දත්ත පදනම් සාර්ථක ලෙස නඩත්තු කිරීම.
3. රේගු පාලනයට, අනෙකුත් රේගු අංශයන්ට, අනෙකුත් රජයේ ආයතනවලට හා සහායක ආයතන වලට අවශ්‍ය වේලාවට නිවැරදි තොරතුරු වාර්තා ලබාදීම.
4. ගෝලීය වැඩි දියුණු කිරීම් වලට සාරානුකූලව ඇගයීම් සිදු කිරීම හා පවත්නා පද්ධති යාවත්කාලීන කිරීම; "ආසිකුඩා" භාණ්ඩ පාලන පද්ධතිය, රථවාහන පාලන පද්ධතිය හා "තිනෙත්" (Thineth) පද්ධතිය
5. අධීක්ෂණ මෙහෙයුම් අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙම අංශයේ කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම සමඟ වෘත්තීය ගුණාත්මකභාවය වර්ධනය කිරීම.
6. 2013 වර්ෂයේදී දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම හා ඒවායේ මෙහෙයුම් වලට අදාළ පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.

## 2013 වර්ෂයේ කාර්ය සාධනය

- 'e- ගෙවීම් ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී.
- ' ASYCUDA - WORLD' මෝටර් රථවාහන අංශයේ සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදී.
- බැඳුම්කර අංශයේ 'e-Manifest' ක්‍රමය සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදී.
- මුදල් අමාත්‍යාංශය වෙතින් බදු සහන හා බලපත් ඉලෙක්ට්‍රෝනිකව ලබා ගැනීම හඳුන්වාදෙන ලද නව ක්‍රමය සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදී.
- DTI පහසුකම් හරහා බ්‍රෝකර්වරුන් සඳහා ASYCUDA - WORLD' ලබාදීම.
- තේ අපනයනකරුවන්ට හා තේ මණ්ඩලයට Blend Sheet පහසුකම ලබාදීම.
- රේගු කාර්යාලවලට ASyCuDa World ක්‍රියාත්මක කිරීම.
- රේගු කාර්යාලවල 'e- ගෙවීම් පහසුකම ක්‍රියාත්මක කිරීම
- ආයෝජන මණ්ඩලවල කාරක්යාලවල ASyCuDa World ක්‍රියාත්මක කිරීම.
- බැඳුම්කර අංශයේ මෙන්ම දිගු කාමරයේත් 'e-Manifest' ක්‍රියාත්මක කිරීම.

| 2013 වර්ෂයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ කාර්ය සාධනය | | |
|---|---|---|
| | ආසිකුඩා++ | ආසිකුඩා |
| කටයුතු කළ රේගු ප්‍රකාශන සංඛ්‍යාව | 147,472 | 1,058,589 |
| අතින් | 103,403 | 112,821 |
| DTI | 44,069 | 945,768 |
| | | |
| **ආනයන** | | |
| මුලු රේගු ප්‍රකාශන සංඛ්‍යාව | 124,886 | 508,100 |
| ආනයන (සාමාන්‍ය) (IM4) | 78,975 | 264,277 |
| ආනයන (මෝටර් වාහන) | 0 | 6336 |
| ආනයන- පහසුකරණ යෝජනා ක්‍රමය (IM5, IM6, IM7) | 57,916 | 225,601 |
| | | |
| **අපනයන** | | |
| අපනයන (සාමාන්‍ය) | 12,850 | 552,106 |
| | | |
| **වාර්තා** | | |
| අභ්‍යන්තර (විමර්ශණ අංශය සහ අනිකුත් රේගු අංශය) | 591 | |
| අභ්‍යන්තර විගණන | 180 | |
| බාහිර (රජයේ දෙපාර්තමේන්තු) | 561 | |
| බාහිර ( අයබදු අංශය- පොලීසිය, CID ආදිය) | 752 | |
| බාහිර (පෞද්ගලික අංශ) | 160 | |
| වෙබ් ප්‍රකාශන සහ සංශෝධන | 768 | |
| | | |
| විනිමය අනුපාත | | 52 |
| ටෙන්ඩර් දැන්වීම් | | 38 |
| HS සංශෝධන | | 68 |
| ප්‍රකාශන | | 20 |
| **2013 වර්ෂයේදී සිදුකල රඳවා තබාගැනීම්** | | |
| 2013 වර්ෂයේදී ලියාපදිංචි කළ සිද්ධි ගණන | | 78 |
| සම්පූර්ණ කළ සිද්ධි ගණන | | 52 |
| ඔප්පු කර දඩ නියම කළ සිද්ධි ගණන | | 19 |
| එකතු කළ දඩමුදල් ප්‍රමාණය | | Rs. 36,116,556 |
| රාජසන්තක කළ බඩුවල මුළු වටිනාකම | | Rs.498,465 |
| A/E ලෙස එකතු කළ මුදල් ප්‍රමාණය | | Rs. 235,661 |
| 2012 දී අවසන් නොකළ සිද්ධි ගණන | | 16 |

# මධ්‍යම මිළ පිරික්සුම් අංශය

## හැඳින්වීම

**රේගු ආදායම සුරක්ෂිත කිරීම පිණිස රේගු ආඥාපනතේ "ඊ" උපලේඛනය යටතට ගැනෙන ආනයනික භාණ්ඩ වල වටිනාකම තීරණය කිරීමට අදාළ කටයුතු පිළිබඳ වගකීම මධ්‍යම මිල පිරික්සුම් අංශයට පැවරී ඇත.**

**ප්‍රධාන කාර්යයන්**

1. රේගු අවශ්‍යතා සඳහා වටිනාකම් තීරණය කිරීම.
2. මිළ පිරික්සුම් වටිනාකම් දත්ත පද්ධතිය නඩත්තු කිරීම.
3. රේගු අවශ්‍යතා සඳහා ලෝක වෙළඳ සංවිධානයේ අදාළ වටිනාකම්

## වටිනාකම සංශෝධනයෙන් අයකල අමතර මුදල්

ජනවාරි සිට දෙසැම්බර් දක්වා **– 2013**

| | |
|---|---|
| **ලියාපදිංචි කළ සිද්ධි ගණන** | - 142 |
| **සම්පූර්ණ කළ සිද්ධි ගණන** | - 84 |
| **රජසන්තක කිරීම්/දඩ ලෙස මුදල් අයකරගත්** | - 496,706,508 |
| **රාජසන්තක කල බඩු** | - Nil |
| A/E **ලෙස එකතු කළ මුදල්** | - 3,033,934,399 |
| **විකිණීම්** | - Nil |
| **සම්පූර්ණ නොකල සිද්ධි ගණන** | - 103 |

**A/E අය කර ගැනීම් සහ දඩමුදල් අයකර ගැනීම්**

**(ජනාවරි 2013 සිට දෙසැම්බර් 2013)**

| මාසය | A/E | දඩය | එකතුව |
|---|---|---|---|
| ජනවාරි | 88,349,166 | 26,400,000 | 114,749,166 |
| පෙබරවාරි | 83,073,149 | 16,750,000 | 99,823,149 |
| මාර්තු | 54,449,123 | 7,350,000 | 61,799,123 |
| අප්‍රේල් | 86,986,255 | 28,856,498 | 115,842,753 |
| මැයි | 106,700,905 | 11,180,200 | 117,881,105 |
| ජුනි | 102,043,682 | 19,350,000 | 121,393,682 |
| ජුලි | 132,629,674 | 26,025,000 | 158,654,674 |
| අගෝස්තු | 85,934,802 | 13,150,000 | 99,084,802 |
| සැප්තැම්බර් | 60,193,196 | 11,669,780 | 71,862,976 |
| ඔක්තෝබර් | 79,584,685 | 9,210,000 | 88,794,685 |
| නොවැම්බර් | 108,686,473 | 11,810,000 | 120,496,473 |
| දෙසැම්බර් | 76,124,888 | 24,700,000 | 100,824,888 |
| | 1,064,755,998 | 206,451,478 | 1,271,207,476 |

# විශේෂ සේවා අංශය

## හැඳින්වීම

විශේෂ සේවා අංශය මගින් රේගු දෙපාර්තමේන්තුවට සහ රේගු සේවය ලබා ගන්නා අනෙකුත් ආයතන සහා විවිධ සේවාවන් සපයයි. ඒ අතර භාණ්ඩ වර්ගීකරණය රසායන ද්‍රව්‍ය විශ්ලේෂණය කැණික් හා ස්වර්ණාභරණ තක්සේරුකරනය, රේගු නියෝජතියන්ට බලපත්‍ර නිකුත් කිරිම, ආනයන/අපනයනකරුවන් ලියාපදිංචි කිරීම වැනි දෑ වේ. මේ අංශය යටතේ කොස් 5 ක් ඇත.

**ප්‍රධාන කාර්යයන්**

1. භාණ්ඩ වර්ගීකරණය
2. මැණික්, වටිනා ලෝහ හා ස්වර්ණාභරන හඳුනාගැනීම, වර්ගීකරණය හා වටිනාකම තක්සේකරු කරයි.
3. රේගු නියෝජිතයන්ට බලපත්‍ර නිකුත් කිරිම.
4. ආනයන/අපනයන කරුවන් ලියාපදිංචි කිරීම.

The specialized services directorate under the corporate cluster of the Customs department has various units.

## භාණ්ඩ වර්ගීකරණ කොට්ඨාශය

ආනයන/අපනයන භාණ්ඩ සඳහා වඩාත් සුදුසු වන HS කේත තීරණය කිරීමේදී සහාය වේ. ආනයන/අපනයනකරුවන් හට HS වර්ගීකරණය යටතේ භාණ්ඩ සඳහා කේත කලින් ලබා ගැනීමට හැකියාව ඇත. ඒ සඳහා වෙබ් අඩවියේ ඇති ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

| | |
|---|---|
| පූර්ව වර්ගීකරණය සඳහා ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව | - 627 |
| නිකුත් කළ පූර්ව භාණ්ඩ වර්ගීකරණ සංඛ්‍යාව | - 514 |
| ඉදිරිපත් වුණු වර්ගීකරණ සංඛ්‍යාව | - 792 |
| අවසන් කළ වර්ගීකරණ සංඛ්‍යාව | -795 |

## රේගු විද්‍යාගාර කොට්ඨාශය

ආනයන හා අපනයන කරන රසායනික ද්‍රව්‍ය හා ඒවා සමාන ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා රේගුවට හා පාර්ශවකරුවන්ට සහායවීමට මෙම අංශය පිහිටුවන ලදී. ආනයනික රසායන ද්‍රව්‍ය හා ඒ සම්බන්ධ භාණ්ඩවල සැකයක් මතුවූ අවස්ථාවලදී ඒවා පරීක්ෂා කිරිම සඳහා ඒවායේ නියැදි රේගු විද්‍යාගාරය වෙත යවනු ලැබේ. එවැනි ද්‍රව්‍යවල වර්ගීකරණය පිළිබඳව මතභේද මතු වූ අවස්ථාවලදී ද එම බඩු හා ලිපිලේඛන මෙම අංශය වෙත යොමු කරයි. මෙම වසරේදී රේගු සටහන්කර 488ක් මෙම අංශයට යොමු කර ඇති අතර ඒවා සියල්ලගේම කටයුතු අවසන් කර ඇත.

## මැණික්, වටිනා ලෝහ හා ස්වර්ණාභරන

මැණික්, වටිනා ලෝහ හා ස්වර්ණාභරන තක්සේරු කිරීම හා ආනයන/අපනයන ලේඛන සකස් කිරීම මගින් අපනයනකරුවන් හා ආනයනකරුවන් සංචාරකයින් හට අවශ්‍ය පහසුව සලසාදීම මෙම අංශයේ වගකීමයි.

## 2013 වර්ෂයේ කාර්යසාධනය

**සකසන ලද ප්‍රකාශන සංඛ්‍යාව**

No. of declarations processed

| | |
|---|---|
| ආනයන | - 2,823 |
| අපනයන | - 6,605 |
| ප්‍රති අපනයන | -1,221 |

ආනයන වටිනාකම

| | |
|---|---|
| රළු දියමන්ති | -Rs. 23,238,174,434/= |
| කපා ඔප දැමූ දියමන්ති | -Rs. 13,241,380,605/= |
| මැණික් | -Rs. 2,492,587,924/= |
| රිදී | -Rs. 148,148,343/= |
| රත්‍රන් | -Rs. 25,574,696,121/= |
| ස්වර්ණාභරන | -Rs. 700,996,939/= |
| පාරිභෝගික ද්‍රව්‍ය | -Rs. 98,941,762/= |
| ප්‍රති ආනයන | -Rs. 5,639,980,010/= |
| එකතුව | -Rs. 71,134,906,138/= |

අපනයන වටිනාකම

| | |
|---|---|
| මැණික් | -Rs. 17,569,888,209/= |
| දියමන්ති ස්වර්ණාභරන | - Rs. 232,162,764/= |
| අනෙකුත් ස්වර්ණාභරන | - Rs. 2,250,874,758/= |
| දියමන්ති | -Rs. 37,682,262,099/= |
| ගෙවුඩ හා ඛණිජ ද්‍රව්‍ය | -Rs. 104,628,598/= |
| රත්‍රන් ප්‍රති අපනයන | -Rs. 3,966,701,047/= |
| එකතුව | -Rs. 61,806,517,475/= |

# වාප්පු නියෝජිත කොට්ඨාශය

ශ්‍රී ලංකාවේ ඇති ඕනෑම වරායකට එන/යන නෞකා සම්බන්ධයෙන් හෝ භාණ්ඩ හෝ මගී බඩු නිෂ්කාශනය සම්බන්ධයෙන් රේගුව සමඟ සම්බන්ධීකරණ කටයුතු කරන වාප්පු නියෝජිතයන්ගේ බලපත්‍ර නිකුත් කිරීම මෙම ඒකකයේ කාර්යය වේ.

**2013 වර්ෂයේ කාර්ය සාධනය**

1. නව ලියාපදිංචි කිරීම

| | |
|---|---|
| වාප්පු නියෝජිතයන් | 94 |
| වාප්පු සහකාර | 139 |
| තාවකාලික වාප්පු සහකාර | 436 |

2. අලුත් කිරීම

| | |
|---|---|
| වාප්පු නියෝජිතයන් | 1601 |
| වාප්පු සහකාර | 4868 |

3. අවලංගු කිරීම

| | |
|---|---|
| වාප්පු නියෝජිතයන් | 27 |
| වාප්පු සහකාර | 436 |

# TIN/VAT ලියාපදිංචි කොට්ඨාශය

රේගු ආඥාපනත 115 වන වගන්තිය ප්‍රකාරව ආනයනකරුවන් හා අපනයනකරුවන් ලියාපදිංචි කිරීම මෙම ඒකකයේ කාර්යය වේ. ලියාපදිංචි ආනයනකරුවකු හෝ අපනයකරුවකු නොවන කිසිවකු විසින් කිසිඳු භාණ්ඩයක් ආනයනය/අපනයන නොකළ යුතුයි.

No. of registration for the year 2013

| | |
|---|---|
| **තනි හිමිකරු** | 989 |
| **හවුල්කාරින්** | 533 |
| **සීමිත වගකීම්** | 1651 |
| **තනිපුද්ගල ආනයන** | 6128 |
| **දයානුග්‍රහය**/ NGOs | 181 |
| **එකතුව** | 9482 |

## හැඳින්වීම

රජයෙන් පවරන අත්‍යවශ්‍ය රාජකාරී ඉටු කිරීම සඳහා රේගු දෙපාර්තමේන්තුවේ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන අංශයකි. සේවා හා සැපයුම් අංශයේ පරමාර්ථය වන්නේ ඵලදායී ලෙස හා විනිවිදභාවයෙන් රේගුවේ සියලුම අංශයන් සඳහා සියලු අවශ්‍යතා සැපයීම, නඩත්තුව කිරීම හා සේවා කටයුතු සිදු කිරීමයි.

**ප්‍රධාන කාර්යයන්**

1. දෙපාර්තමේන්තුවේ කාකර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස ගුණාත්මකභාවය ආරක්ෂා කරමින් අදාළ අංශ වෙත සේවා හා සැපයීම් ලබාදීම.
2. ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව යමින් විනිවිද පෙනෙන ආකාරයට භාණ්ඩ හා සේවා මිලදී ගැනීම.
3. විධිමත් ආකාරයේ තොග පාලනයක් හා කාර්යක්ෂම ගබඩා පාලන ක්‍රමයක් පවත්වාගෙන යාම සහතික කිරීමත් මිලදී ගන්නා භාණ්ඩවල ආරක්ෂාව හා උපරිම ප්‍රයෝජන ලැබෙන පරිදි ඒවා ගබඩා කිරීම හා ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යාම.
4. රේගු දෙපාර්තමේන්තුවේ චංචල හා නිශ්චල වත්කම් කළමනාකරණය
5. කාලසටහනට අනුව රේගු මූලස්ථාන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නිම කිරීම හා පරිශ්‍ර කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක වන බවට සහතික වීම.
6. සුදුසු පියවර මගින් රේගු දෙපාර්තමේන්තුවේ රථවාහන සමූහය උපරිම තත්ත්වයෙන් පවත්වාගෙන යාම සහතික කිරීම.

## 2013 වසරේ කාර්ය සාධනය

2013 වර්ෂයේදී රේගු දෙපාර්තමේන්තුවේ භෞතික සම්පත් වැඩිදියුණු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමුවිය. එහි සම්පූර්ණ වගකීම සේවා හා සැපයුම් අංශයට පැවරිණි. මේ අතර මූලික වූයේ නව රේගු මන්දිරයේ අවසාන ක්‍රියාකාරකම් සඳහා සැපයුම් හා සේවා ලබාදීමයි. 2011 දී ගොඩනැගීම් කටයුතු තවමත් අවසන් නැති නව ගොඩනැගිල්ලට යාමට දෙපාර්තමේන්තුවට සිදුවීම අමතර පීඩනයක් ගෙනදුණි. දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු වලට බාධා නොවන ආකාරයෙන් නිවැරදි බඩු වට්ටෝරු පද්ධතියකට අනුව පරණ ලී බඩු ඉවත් කිරීමත්, නව ලී බඩු සවි කිරීමත් ප්‍රධාන අභියෝගය විය. කෙසේ වෙතත් 2013 වර්ෂය තුළදී බලාපොරොත්තු වූන සේවා හා සැපයුම් අවශ්‍යතා සම්පූර්ණ කිරීමට අප අංශයට හැකි විය.

### 2013 දී සම්පූර්ණ කල අනෙකුත් කාර්යයන්

1. නව ගොඩනැගිල්ලේ සළකුඅණු පුවරු සවි කිරීම නිමකරන ලදී.
2. ආරක්ෂා තර කිරීම සඳහා **CCTV** කැමරා පද්ධතිය ක්‍රියාත්මක කළ අතර එය හොඳින් ක්‍රියාත්මක වේ.
3. රථවාහන මුරපොළ සඳහා ප්‍රවේශ සීමා පද්ධතියක් ක්‍රියාත්මක කරන ලදී.
4. ප්‍රවේශ සීමා පද්ධතිය හරහා නිලධාරීන්ට හා අමුත්තන්ට නව රාජකාරී හැඳුනුම්පතක් නිකුත් කරන ලදී.
5. විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට 9වැනි කම්ටුවේත්, රේගු කාර්ය මණ්ඩලය හා අමුත්තන් සඳහා බිම්මහලේත් ආපනශාලා පහසුකම් ඇති කරන ලදී.
6. යෝජිත රේගු කෞතුකාගාරය සඳහා සියලුම අවශ්‍යතා සපයන ලදී.
7. මහල් අංකය අනුව නව දුරකථන අංක හඳුන්වා දී අවසාන කරන ලදී.
8. මූලස්ථාන ගොඩනැගිල්ලේ ප්‍රධාන කොන්ත්‍රාත්කරු හා එක්ව ප්‍රේක්ෂකාගාරයේ ස්ථරවල වෙනස් කිරීම් සිදුකරන ලදී.
9. මූලස්ථාන ගොඩනැගිල්ලේ බිඳුණු වීදුරු ඉවත්කර නව වීදුරු සවිකරන ලදී.
10. කටුනායක රේගු විවේකාගාරය සහ හම්බන්තොට හා මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපලේ රේගු කාර්යාල වලට අවශ්‍ය සේවා හා සැපයුම් ලබාදෙන ලදී.

*11.* ගාල්ල හා අනෙකුත් පිටත වරායන්හි රේගු කාර්යාලවල අළුත්වැඩියා කිරීම් සිදු කරන ලදී.

**2013** පටන්ගෙන 2014 නිම කිරීමට නියමිත වැඩසටහන්

**1.** ප්‍රධාන කාර්යාලයේ විද්‍යාගාරයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය ප්‍රතිසම්පාදන ලබාදීම.
**2.** ව්‍යායාම ශාලාව සැකසීම හා ඊට අවශ්‍ය උපකරණ සඳහා අවශ්‍ය ප්‍රතිසම්පාදන ලබාදීම**.**
**3.** රේගු මූලස්ථාන ගොඩනැගිල්ල විවෘත කිරීමට ප්‍රථම සියලු රේගු නිලධාරීන් සඳහා නව නිල ඇඳුමක් ලබාදීම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම.

ඉහත කටයුතු සඳහා අරමුදල් රැස්කල අන්දම පහත වගුවේ දැක්වේ.

## දරන ලද වියදම් (රු. මිලියන)

| වියදම | **2012** සැබෑ | **2013** සැබෑ | **2014** ඇස්තමේන්තු ගත |
|---|---|---|---|
| සැපයීම් | 75.4 | 85.9 | 125.0 |
| නඩත්තු කිරීම් | 73.0 | 81.8 | 87.5 |
| සේවා | 163.9 | 191.9 | 225.0 |

## මූලධන වියදම්

**1. මූලික වත්කම් වැඩිදියුණු කිරීම (රු. මිලියන)**

| වියදම | **2012** සැබෑ | **2013** සැබෑ | **2014** ඇස්තමේන්තු ගත |
|---|---|---|---|
| *ගොඩනැගිලි ව්‍යුහය* | 18.0 | 39.4 | 20.0 |
| *යන්ත්‍රෝපකරණ* | 4.5 | 6.0 | 5.0 |
| *වාහන* | 1.8 | 2.5 | 3.0 |

**2. ස්ථාවර වත්කම් අත්කර ගැනීම (රු. මිලියන)**

| වියදම | **2012** සැබෑ | **2013** සැබෑ | **2014** ඇස්තමේන්තු ගත |
|---|---|---|---|
| වාහන | - | 7.4 | - |
| ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ | 0.9 | 1.3 | 3.0 |
| යන්ත්‍රෝපකරණ | 1.8 | 2.5 | 4.0 |
| ගොඩනැගිලි ව්‍යුහයන් | 875.0 | 707.0 | 300.0 |

# මානව සම්පත් පර්ෂදය

# මානව සම්පත් කළමනාකරණ අංශය

**හැඳින්වීම**

මානව සම්පත් කළමනාකරණ අංශය දෙපාර්තමේන්තුවේ මානව ප්‍රාග්ධනයේ ආයෝජන වෙනුවෙන් උපරිම ප්‍රතිඵල ළඟා කර ගැනීමට අපේක්ෂා කරන අතර මූල්‍ය අවදානම අඩු කර ගැනීමටද කටයුතු කරයි. මෙම අංශය මෙකී අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂා කරන්නේ හැකියාවන් සහිත පුද්ගලයන් හා ඔවුන්ගේ දක්ෂතාවන්, දෙපාර්තමේන්තුවේ උපාය මාර්ගික සැලැස්ම සහ ආයෝජනයට අනුරූපීව ලැබෙන ප්‍රතිඵල උපරිම කිරීම හා අනාගත පැවැත්ම හා සාර්ථකත්වය යන කරුණු සමඟ එකට ගැලපීම තුළිනි. එම අරමුණු ඉටු කර ගැනීම සහතික කිරීම පිණිස මානව සම්පත් කළමනාකරණ අංශය, රජයේ කම්කරු නීති හා රෙගුලාසි, සදාචාර සම්පන්න ව්‍යාපාර විධි සහ දළ වියදම, යෝජිත අභිප්‍රේරණය, කැපවීම හා ඵලදායිතාවය හැකිතාක් දුරට උපරිම ආකාරයට ප්‍රයෝජනට ගැනීම සිදු කරයි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ සිට ඉන් පහත මට්ටම් වන මාණ්ඩලික හා මාණ්ඩලික නොවන මට්ටම්වල මානව සම්පත් කළමනාකරණයට අදාළ සියලු කරුණු සම්බන්ධව අවසාන අධිකාරි බලය හිමි ආයතනයයි.

මානව සම්පත් කළමනාකරණ අංශය, මේ හේතුව නිසා වරින් වර රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනීම්, උසස් කිරීම්, කාකර්ය සාධන කළමනාකරණය ආදිය මෙන්ම ආයතන සංග්‍රහය, රේගු ආඥාපනත හා මුදල් රෙගුලාසි ආදිය සම්බන්ධව නිකුත් කරන නියෝග වලට අනුගතව කටයුතු කරයි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත මාණ්ඩලික නිලධාරීන් සම්බන්ධව ආයතන සංග්‍රහයේ II වන කොටසේ දෙවන උපලේඛණයේ සඳහන් වැරදි සම්බන්ධව විනයානුකූලව කටයුතු කිරීමට සහ ස්ථාන මාරුකිරීමටත් බලය පවරා ඇති අතර අනෙක් සියලු නිලධාරීන්ගේ සියලුම විනය හා ස්ථාන මාරු සම්බන්ධව බලය පවරා ඇත. (රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමේ අයිතියට යටත්ව)

එසේම රාජ්‍ය සේවයේ පවත්නා රෙගුලාසි වලට අනුගත වන අතරම රේගු දෙපාර්තමේන්තුවට කාර්ය සාධන ආකෘති හා උසස් කිරීමේ නිර්ණායක ද ඇතුළුව නිදහස ද ඇත.

**ප්‍රධාන කාර්යයන්**

**දෙපාර්තමේන්තුවේ දැක්ම ළඟා කර ගැනීම සඳහා මානව සම්පත් කළමනාකරණ අංශය ඉතා වැදගත් කාර්යයක් ඉටු කරයි;**

1. බඳවාගැනීම්, තෝරා ගැනීම් හා සම්පත් භාවිතා කිරීම.
2. සේවක වාර්තා තබා ගැනීම හා රහස්‍යභාවය.
3. ආයතනික සැලසුම් හා සංවර්ධනය .
4. ප්‍රතිව්‍යුහපතකරණය හා වෙනස්වීම් කළමනාකරණය, කාර්ය සාධනය.
5. හැසිරීම හා චර්යා කළමනාකරණය.
6. පාරිභෝගික හා සේවක සම්බන්ධතා.
7. මානව සම්පත්, මානව සම්පත්(මිනිස්බල) විග්‍රහය හා මිනිස්බල දත්ත කළමනාකරණය.
8. වන්දි ගෙවීම හා සේවක ප්‍රතිදාන කළමනාකරණය.
9. සේවක අභිප්‍රේරණ හා ධෛර්යය ගොඩනැගීම.

## 2013 වසර තුළ කාර්ය සාධනය

**බඳවා ගැනීම් හා උසස් කිරීම් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.**

| සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ තනතුර | පුරප්පාඩු සඳහා | දිනය |
|---|---|---|
| රේගු අධ්‍යක්ෂ | 01 අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් | 25.10.2013 |
| නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | 04 රේගු අධ්‍යක්ෂ | 28.10.2013 |
| රේගු අධිකාරි | 13 නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | 17.12.2013 |
| නියෝජ්‍ය රේගු අධිකාරි | 27 රේගු අධිකාරි | 21.06.2013 |
| සහකාර රේගු අධිකාරි 1 | 74 නියෝජ්‍ය රේගු අධිකාරි | 15.08.2013 |
| රේගු පරීක්ෂක II | 02 රේගු පරීක්ෂක I | 15.08.2013<br>12.11.2013 |
| රේගු නියාමක | 42 (බඳවා ගැනීම්) | 18.11.2013 |

**විභාග පැවැත්වීම්**

| විභාගය | අපේක්ෂකයන් | සංඛ්‍යාව |
|---|---|---|
| කාර්යක්ෂමතා කඩඉම | නියෝජ්‍ය රේගු අධිකාරි , **ශ්‍රේණිය** II; රේගු පරීක්ෂක, **ශ්‍රේණිය** II (පැරණි) , රේගු පරීක්ෂක , **ශ්‍රේණිය** II.(නව) | 10 |

**අවසන් කරන ලද**

| නඩු සංඛ්‍යාව | **පෙත්සම්කරුවන්** | **ප්‍රතිඵල** |
|---|---|---|
| SCFR 1427/2012 | ඩබ්ලිව්.එම්. නිමල් සංජීව | නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. |
| HRC 1427/2012 | පී.ජී. ප්‍රියදර්ශනී | නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. |
| HRC 1523/2012 | උපාධිධාරි රේගු පරීක්ෂක | නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. |

**අනෙකුත් කාර්යයන්**

සමස්ත රේගු කාර්ය මණ්ඩලය සඳහා දිරි දීමනා ගෙවන ලදී.

## කාර්ය සාධන සැසඳීම

**2008 වර්ෂය**

| | |
|---|---|
| උසස්වීම් සඳහා සම්මුඛ පරීක්ෂණ සංඛ්‍යාව | 02 (සහකාර රේගු අ.-I සහ රේගු පරීක්ෂක -I.). |
| උසස් වීම් සංඛ්‍යාව හා බඳවා ගැනීම්. | 4 නි.රේ.අ., 116 ස.රේ.අ. -II, 10 (ප්‍රධාන රේගු පරීක්ෂක සිට ස.රේ.අ. -II). |
| කාර්ය සාධන කඩඉම් පරීක්ෂණ ඉල්ලා සිටින ලද සංඛ්‍යාව. | ඉල්ලා සිටි සංඛ්‍යාව 09, විභාග දෙපාර්තමේන්තුව පවත්න ලද සංඛ්‍යාව - 05. |
| සේවක දිරිදීමනා ගෙවීම | මුළු වර්ෂය සඳහා ගෙවන ලදී. |

**2009**

රේගු අධ්‍යක්ෂ තනතුරු 4, ප්‍රධාන රේගු පරීක්ෂක - 41, සහ රේගු පරීක්ෂක 1 තනතුරු- 3. කාර්යක්ෂම කඩඉම් විභාග 08ක් විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින ලදී. මුළු වර්ෂය සඳහා දිරි දීමනා ගෙවන ලදී.

**2010**

| | |
|---|---|
| බඳවා ගැනීම් විභාග හා සම්මුඛ පරීක්ෂණ සංඛ්‍යාව කී දෙනෙකු සඳහාද ? | විවෘත තරඟ විභාග සඳහා ගැසට් නිවේදන මගින් ඉල්ලුම් පත්‍ර කැඳවන ලදී. ස.රේ.අ. II - 100, රේගු පරීක්ෂක II 100, සහ රේගු නියාමක 50. |
| උසස් කිරීම් සඳහා සම්මුඛ පරීක්ෂණ සංඛ්‍යාව | රේගු අධ්‍යක්ෂ - 12, නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ -32, රේගු අධිකාරි 107, නියෝජ්‍ය රේගු අධිකාරි - 376, සහ ප්‍රධාන රේගු පරීක්ෂක - 92. |
| උසස් කිරීම් සංඛ්‍යාව හා බඳවා ගැනීම් | අති.රේ.අ.ජ. - 4, රේ.අ. -12, නි.රේ.අ. -76, ස.රේ.අ. - 44, රේ.අ. - 118, නි.රේ.අ. -70, ප්‍ර.රේ.ප. - 92, සහ රේ.ප.1 - 32. |
| විභාග දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටින ලද කාර්යක්ෂමතා කඩඉම් විභාග සංඛ්‍යාව | 08. |
| සේවක දිරිදීමනා ගෙවීම | මුළු වර්ෂය සඳහා ගෙවන ලදී. |

**2011**

| | |
|---|---|
| තනතුරු වල උසස් කිරීම සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ සංඛ්‍යාව. | 05 (අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල්, රේගු අධ්‍යක්ෂ සහ සහකාර රේගු අධිකාරි II). |
| බඳවා ගැනීම් සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ සංඛ්‍යාව . | 01 (සහකාර රේගු අධිකාරි -II). |
| උසස්වීම් හා බඳවා ගැනීම් සංඛ්‍යාව. | ස.රේ.අ. I - 84, ස.රේ.අ. II - 09 (5%), ස.රේ.අ. II 38- (15%). |
| විභාග දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටින ලද කාර්යක්ෂමතා කඩඉම් විභාග සංඛ්‍යාව | ඉල්ලන ලද සංඛ්‍යාව 08, පවත්වන ලද සංඛ්‍යාව 06. |
| විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද විභාග ගණන. | 03 (විවෘත තරඟ), සහ 01 (සීමිත තරඟ විභාග). |
| සේවක දිරිදීමනා ගෙවීම | මුළු වර්ෂය සඳහා ගෙවන ලදී. |

**2012**

| **සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ නිලය** | **තනතුරු සඳහා** | **දිනය** |
|---|---|---|
| රේගු පරීක්ෂක I ශ්‍රේණිය | ප්‍රධාන රේගු පරීක්ෂක 50 | 09.08.2012 |
| රේගු අධ්‍යක්ෂ | අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් 04 | 29.09.2012 |
| නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | රේගු අධ්‍යක්ෂ 07 | 16.11.2012 |

**යොදා ගන්නා කෙටි යෙදුම් :** EB - කාර්යක්ෂමතා කඩඉම්; ADGC - අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල්; DC - රේගු අධ්‍යක්ෂ ; DDC - නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ ; SC - රේගු අධිකාරි ; ASC - සහකාර රේගු අධිකාරි ; DSC - නියෝජ්‍ය රේගු අධිකාරි; ASC-I - සහකාර රේගු අධිකාරි I; ASC-II - සහකාර රේගු අධිකාරි II; CIC - ප්‍රධාන රේගු පරීක්ෂක ; IC-I - රේගු පරීක්ෂක I; IC-II - රේගු පරීක්ෂක II; CG - රේගු නියාමක ; CG-III - රේගු නියාමක III.

# මානව සම්පත් සංවර්ධන අංශය

## හැඳින්වීම

රේගු දෙපාර්තමේන්තුවේ උන්නතිය උදෙසා මානව සම්පත්වල ආකල්ප හා කුසලතා වෙනස්කිරිම සඳහා වැදගත් සේවාවක් ඉටු කරන අංශයක් ලෙස මානව සම්පත් සංවර්ධන අංශය හැඳින්විය හැක. .

තමන්ගේ එදිනෙදා වැඩ රාජකාරි වලදී නිවැරදිව සිතීමට ශක්තියක් වූ වසර 30 ක ඉතිහාසයක් මානව සම්පත් සංවර්ධන අංශයට ඇත. දැනට එහි රේගු අධ්‍යක්ෂිකා ලෙස අයි.ජේ. අබේරත්න මහත්මිය මාර්ගෝපදේශකත්වය සපයන අතර නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරයෙකු, රේගු අධිකාරිවරුන් තිදෙනෙකු, නියෝජ්‍ය රේගු අධිකාරිවරුන් දෙදෙනෙකු හා සහකාර රේගු අධිකාරිවරුන් හතර දෙනෙකු සමඟ අනෙකුත් කාර්ය මණ්ඩලය සේවයේ යෙදේ.

## දැක්ම

රේගු දෙපාර්තමේන්තුවේ විශිෂ්ඨතම පුහුණු කිරීමේ ඒකකය බවට පත්වෙමින් මානව සම්පත්වල ඵලදායිතාව වැඩි දියුණු කිරීම.

**මෙහෙවර**

දෙපාර්තමේන්තුවට උපරිම ඵලදායිතාවක් ලැබෙන අයුරින් අප සතුව ඇති මානව සම්පත්වල හැකියාවන් වැඩි දියුණු කිරිම.

ප්‍රධාන කාර්යයන්

කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව ලබාදීම පැවරී ඇති ප්‍රධාන කාර්ය වේ. මෙය දේශීය හා විදේශීය පුහුණුව වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකිය. අන්තර්ජාතික තලයේ රේගු ක්‍රියාකාරකම් පිළිබඳව විදේශ ශිෂ්‍යත්ව මෙමගින් මූලික වශයෙන් ඉලක්ක කර ඇත. දේශීය පුහුණුව, නිපුණතා සංවර්ධනය හා කුසලතා සහ උරුම කරගත් හැකියාවන් හඳුනා ගැනීම මූලික කරගත් අදාළ ක්ෂේත්‍රයේ දැනුම හා දැනුවත්භාවය වැඩි දියුණු කිරිම ඉලක්ක කර ඇත. මෙම අංශය වෙත දෙපාර්තමේන්තුවේ පුහුණු ක්‍රමය සංවර්ධනය කිරීමේ වගකීම පැවරී ඇත. රේගු වාප්පු නියෝජිතයන් පුහුණු කරන අතරතුර අනෙකුත් ආයතනවලට අදාළ සහාය ලබාදීමද සිදු කරයි. මානව සම්පත් සංවර්ධන අංශය සම්බන්ධයෙන් බලන කල, එම අංශය මගින් පහත සඳහන් සේවාවන් සපයන බව තවදුරටත් සඳහන් කළ යුතු වේ.

- රේගු කාර්ය මණ්ඩලය සඳහා පුස්තකාල පහසුකම් සැපයීම
- පුහුණු ප්‍රතිපත්තින් හා ක්‍රියාපරිපාටි සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- රේගු වාප්පු නියෝජිතයන් සඳහා පුහුණුව මානව සම්පත් සංවර්ධන අංශය විසින් සපයන අතර පුහුණුව අවසානයේ විභාගයක්ද පවත්වනු ලබයි.
- දෙපාර්තමේන්තුවේ පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීම. ඒවා ප්‍රමුඛතාව අනුව පෙළ ගැස්වීම, පුහුණු සැලැස්ම සකස් කිරීම හා එය ක්‍රියාත්මක කිරීම
- අවශ්‍යතාව පරිදි යුද හමුදාව, නාවික හමුදාව හා පොලීසිය වැනි බාහිර ආයතන වලට අවශ්‍ය පුහුණුව ලබාදීම.
- පාඨමාලාවන්හි විෂය මාලාවන් සංවර්ධනය කිරීම, දේශීය හා විදේශීය පුහුණුකරුවන් විසින් පවත්වනු ලබන පාඨමාලා මෙහෙයවීම
- අනෙකුත් ආයතන රේගු විෂය පථය පිළිබඳ දේශකවරුන් ඉල්ලා සිටින අවස්ථා වලදී අදාල දේශන පැවැත්වීම සඳහා සම්පත් දායකයින් ලබාදීම
- රේගු කටයුතු හා ඊට සම්බන්ධිත කරුණු පිළිබඳව කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව ලබා දීම
- රේගු කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම හා ඔවුන්ගේ වෘත්තීය සංවර්ධනය
- පුහුණු අවස්ථා පිළිබඳව සන්නිවේදන කටයුතු.
- පුහුණු කටයුතු ඇගයුම් කිරීම

- ඉහත කාර්යයන්ට අමතරව ඕනෑම අවස්ථාවකින් අධ්‍යාපනික කාර්යයක් සඳහා ශාලා පහසුකම් ලබාදීම. මෙයට විවිධ ශ්‍රේණිවලට අයත් රේගු නිලධාරින්ගේ සංවිධාන වල වාර්ෂික මහා සම්මේලන පැවත්වීම හා සුබ සාධන කටයුතු ද අයත් වේ.

## අංශයේ ප්‍රධාන පරමාර්ථ

- දෙපාර්තමේන්තුවේ ගුණාත්මක භව හා ඵලදායිතාව වැඩිදියුණු කිරිම සඳහා ක්‍රියාශීලි ඉදිරිය දකින පිරිසක් ගොඩනැඟීම.
- දේශීය හා විදේශීය ඉගෙනීමේ අවස්ථා ලබාදීමෙන් නිලධාරීන්ගේ නිපුණත්වය හා නිශ්චය බව දියුණු කිරිම.
- දැනුම බෙදාගැනීමෙන් හා පැවරීම තුළින් රේගු දෙපාර්තමේන්තුවේ දියුණුව ඉහළ දැමීම රේගු කාර්ය මණ්ඩලයට උසස් අධ්‍යාපනයන් කරගෙන යාම සඳහා මූල්‍ය ආධාර පහසුකම් සැපයීම.
- බාහිර ආයතන හා පරදූ දරන්නන්ගේ අවශ්‍යතා අනුව පුහුණු කිරීම් ලබාදීම.
- ධනාත්මක ආකල්ප හා හොඳ මහජන සම්බන්ධතා භාවිතයෙන් තුළින් කාර්ය මණ්ඩලයේ ගුණාත්මක භාවය හා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.

මෙම ඉලක්ක ළඟා කර ගැනීම සඳහා කළමනාකරණ නිලධාරින් විසින් පහත දැක්වෙන කාර්ය මණ්ඩලය අනුමත කර ඇත.

| ශ්‍රේණිය | අනුමත කර ඇති සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| **රේගු අධ්‍යක්ෂ** | 01 | 01 |
| **නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ** | 02 | 01 |
| **රේගු අධිකාරි** | 03 | 02 |
| **නියෝජ්‍ය රේගු අධිකාරි** | 08 | 02 |
| **සහකාර රේගු අධිකාරි** | 08 | 06 |
| **කළමනාකරණ සහකාර** | 03 | 04 |
| එකතුව | **25** | **16** |

## **2013** වර්ෂයේ කාර්ය සාධනය

2013 පුහුණු වැඩසටහන් සැලැස්ම සහ රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කල විශේෂ වැඩසටහන්වලට අදාළව අප විසින් දේශීය පුහුණු වැඩසටහන් 41 ක් හා විදේශීය පුහුණු වැඩසටහන් 74 ක් පවත්වා ඇත. මේ අනුව 1655 දෙනෙකු මෙමගින් පුහුණුව ලබා ඇත.

## **2013** වසරේ පුහුණු පාඨමාලා සඳහා සහභාගිත්වය

වගුව **01:** **ශ්‍රේණි අනුව**

| ශ්‍රේණිය | දේශීය | විදේශීය |
|---|---|---|
| රේගු අධ්‍යක්ෂ ජනරාල් | 4 | 4 |
| අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් | 8 | 16 |
| රේගු අධ්‍යක්ෂ | 8 | 24 |
| නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | 50 | 27 |
| රේගු අධිකාරි | 156 | 29 |
| නියෝජ්‍ය රේගු අධිකාරි | 903 | 16 |
| සහකාර රේගු අධිකාරි | | 22 |
| අනෙකුත් | 388 | - |
| එකතුව | **1517** | **138** |

වගුව **02:** පුහුණුවීම් පිළිබඳ විස්තර

## 2013 පුහුණු නිර්ණායක

| | | |
|---|---|---|
| දේශීය පුහුණු වැඩසටහන් | – එකතුව: 41 | |
| විදේශීය පුහුණු වැඩසටහන් | – එකතුව: 74 | |
| දේශීය | | |
| • රේගු අධිකාරී සහ ඉහළ වැඩසටහන් } | - | 12 |
| • සහකාර රේගු අධිකාරී සහ ඉහළ වැඩසහටන් } | - | |
| • අනෙකුත් | - | 10 |
| • සහභාගීවීම් - සැලසුම් කල | - | 2049 |
| • පැමිණි සංඛ්‍යාව | - | 1517 |
| විදේශීය | සැළසුම්කල | පැමිණි සංඛ්‍යාව |
| • සමුළු | 17 | 15 |
| • වැඩමුළු | 7 | 11 |
| • වැඩසටහන් | 6 | 6 |
| • පුහුණු පාඨමාලා | 7 | 7 |
| • රැස්වීම් | 19 | 19 |
| • පශ්චාත් උපාධ වැඩසටහන | 6 | 6 |
| • සම්මන්ත්‍රණ | 7 | 7 |
| • අනෙකුත් | 5 | 3 |

මානව සම්පත් සංවර්ධන අංශය මගින් පැවැත්වූ භාෂා පන්ති
වගුව **03**

| සියළු නිලධාරීන් සඳහා භාෂා පුහුණු | | එකතුව | |
|---|---|---|---|
| | | සැළසුම්කල | පැමිණි සංඛ්‍යාව |
| **දෙමළ භෂාව** | III අදියර | 60 | 40 |
| **දෙමළ භෂාව** | II අදියර | 30 | 20 |
| **අ.පො.ස.(සා.පෙළ) දෙවන භාෂාව/ දෙමළ** | | 30 | 28 |

වගුව **04**

රේගු නියෝජිතයන්ගේ පුහුණු හා විභාග

| විභාග | සහභාගීත්ව | සමත් | ප්‍රතිශතය |
|---|---|---|---|
| 01 | 100 | 41 | 41% |
| 02 | 106 | 56 | 53% |
| 03 | 119 | 70 | 59% |

## රේගු පුස්තකාලය

මානව සම්පත් සංවර්ධනයේ ඉතා වැදගත් අවියක් වන රේගු පුස්තකාලය 2005.01.26 දින පිහිටුවන ලද අතර එය රේගු අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) යටතේ අනුබද්ධිත ඒකකයක් ලෙස ස්ථාපිත කරන ලදී. පුස්තකාලය සඳහා රේගු කාර්ය මණ්ඩයේ බලාපොරොත්තු නොවූ ධනාත්මක ප්‍රතිචාරයක් ලැබුණු අතර දැනට එහි සාමාජික සංඛ්‍යාව 1257 දක්වාත්, පොත් සංඛ්‍යාවද 5885 දක්වා වැඩි වී ඇත. රේගු නිලධාරින්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලෙන් වෙන් කරනු ලබන මුදලින් පුස්තකාලය සඳහා පොත් මිලදී ගනු ලැබේ.

මෙම පුස්තකාල පහසුකම් දෙපාර්තමේන්තුවේ සියළු කාර්ය මණ්ඩලයට හා සාමාජික නොවන අයටද පුස්තකාලය පරිහරණය කල හැකිය. පොත් වලට අමතරව පුවත්පත්, වාර සඟරා, හා විවිධ සඟරා ආදියද පරිහරණය සඳහා ඇති අතර පුස්තකාලය දෙපාර්තමේන්තු නියෝග හා නිලධාරීන් විදේශ පුහුණුව සඳහා සහභාගී වීමෙන් පසුව ඉදිරිපත් කරනු ලබන වාර්තාද අනාගතයේ ප්‍රයෝජනය සඳහා මෙහි තැන්පත් කර ඇත.

මෙහි පුස්තකාලාධිපතිවරයකු නොමැති වුවද, පුස්තකාලයේ කටයුතු බාධාවකින් තොරව සිදු කෙරේ. පුස්තකාලයේ සාමාජිකත්වය වැඩි වෙමින් පවත්නා අතර එම නිසා එයට පහසුකම් ලබා දිය යුතු වේ. ඒවා අතර

(a) අනෙකුත් කාර්ය මණ්ඩලය සමග සුදුසු පුස්තකාලාධිපතිවරයෙකු අනුයුක්ත කිරීම
(b) සුදුසු මෘදුකාංගයක් හඳුන්වා දීම
(c) නවීන පහසුකම් සහිත පරිගණක අන්තර්ජාල පහසුකම් ලබාදීම වැනි දෑ දැක්විය හැකිය.
(d) කාඩ්පත් ක්‍රමය යටතේ පොත් පත් නිකුත් කිරීමේ හා නැවත භාරගැනීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

වගුව **05**
පුස්තකාල සේවාව
**(**සාමාජික සංඛ්‍යාව **1257)**

| විස්තරය | 2012 | 2013 |
|---|---|---|
| නව සාමාජික සංඛ්‍යාව | 223 | 96 |
| මිලදී ගන්නා ලද පොත් ප්‍රමාණය | 479 | - |
| ප්‍රදාන වශයෙන් ලද පොත් ප්‍රමාණය | 39 | 22 |
| පොත් සංඛ්‍යාව | - | 5500 |

රේගු පුස්තකාලයේ සම්පත් සීමිත වුවත් එය දෙපාර්තමේන්තුවේ ඉතා ජනප්‍රිය ස්ථානයක් බවට පවත්ව තිබේ. .

# කාර්ය මණ්ඩල සේවා අංශය

## හැඳින්වීම

ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය යටතේ අලුතින් ආරම්භ කරන ලද මෙම අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ සේවකයන් හට දෙපාර්තමේන්තුමය අරමුණු ඉටුකර ගැනීම සඳහා නිර්මාණාත්මකව හා ප්‍රයෝජනවත් ආකාරයට දායක විය හැකි පරිසරයක් සැකසීම.

**<u>ප්‍රධාන ක්‍රියාකාරකම්</u>**

1. දුක්ගැනවිලි කළමනාකරණය:

   අ. සේවකයන් තුළ තෘප්තිය වර්ධනය කිරීමටත්, කළමනාකරණය කෙරෙහි අසංතෘප්තිය අවම කිරීමටත් හැකිවන පරිදි දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරිම. .

   ආ. පිළිගත් වෘත්තීය සමිති සමඟ මනා සම්බන්ධතාවයක් ගොඩනඟා ගැනීමේ අපේක්ෂාවෙන් නිරන්තර සාකච්ඡා පැවැත්වීම.

   ඇ. අර්බුදකාරී කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීම පිණිස සාකච්ඡා සම්මුති, කමිටු, පිහිටුවීම හා සේවක ගැටළු හඳුනාගෙන එකඟතාවයකට පැමිණීමට සාකච්ඡා පැවැත්වීම.

2. සුභසාධන කළමනාකරණය:

   අ. දැනට සැපයෙන සුභසාධක සේවා හා ඒවායේ ප්‍රමිතිය හඳුනාගෙන ගුණාත්මක සුභ සාධක සේවාවක් සැපයීම පිණිස අවශ්‍ය කටයුතු කිරීම.

3. විනය පිළිබඳ කළමනාකරණය:

   අ. අදාළ නිලධාරීන්ට විරුද්ධව චෝදනා ඉදිරිපත් වන්නේ නම් ඒ පිළිබඳව මූලික විමර්ශන හා විනය පරීක්ෂණ පැවැත්වීම.

   ආ. රේගු දෙපාර්තමේන්තුවේ විනය ක්‍රියාපටිපාටියට සංයුක්ත කොට ආචාර ධර්ම පද්ධතියක් ක්‍රියාත්මක කිරීමව.

   ඇ. සේවකයින් ආචාර ධර්ම පද්ධතිය අනුගමනය කරන්නේද, යන්න නිරීක්ෂණය කිරීම හා ආචාර ධර්ම පද්ධතිය අනුගමනය නොකරන්නේ නම්, විරුද්ධව විනය ක්‍රියාපටිපාටිය හැකිතාක් දුරට අනුගමනය කොට ආචාර ධර්ම පද්ධතිය ඵලදායී බවට පත් කිරිම.

4. ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම :

   අ. රේගුවේ සියළුම මට්ටම්වල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය උපදෙස් මත අවශ්‍ය තාක්ෂණය හා ක්‍රමවේද හරහා ඵලදායිතා ප්‍රවර්ධන තත්ත්ව ළඟා කර ගැනීමට ක්‍රියාත්මක වීම.

### කාර්ය සාධනය

- සුභසාධක කළමනාකරණය

2013 අගෝස්තු මාසයේ විවෘත කරන ලද ආපන ශාලාව මනා ගුණාත්මක සේවයක් ස්ථිර කරනු වස් වෘත්තීය සමිති නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුව සමඟ රැස්වීම් තුනක් පවත්වා හඳුනාගත් කරුණු ගැන ආපනශාලා කළමනාකාරිත්වයට දැනුම්දී අවශ්‍ය පරිදි කටයුතු කිරීමට උපදෙස් දෙන ලදී.

- **විනය පිළිබඳ කළමනාකරණය**
  **ගෙවී ගිය වසරේදී විනය පිළිබඳ පරීක්ෂණ 2ක් පවත්වන ලද අතර ඉන් එකක් අවසාන කරන ලදී. මේ වසරේදී වාර්තා වූ නඩු 07ක් සඳහා ප්‍රාථමික විමර්ශන පැවැත්වීම සඳහා නඩු මෙහෙයුම් නිලධාරීන් පත් කරන ලදී. ප්‍රාථමික විමර්ශන වාර්තා ලැබුණු විගස ඉදිරි කටයුතු කරනු ලැබේ.**

- **ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන**
  ජාතික ඵලදායිතා ප්‍රවර්ධන ලේකම් කාර්යාලයේ සහය මත ක්‍රමානුකූල ප්‍රවේශයකින් ශ්‍රී ලංකා රේගුවෙන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී සේවාවන් ස්ථාපිත කිරීම සඳහා ඵලදායිතා ප්‍රවර්ධන වැඩසහටන් දියත් කරන ලදී. ඒ සඳහා ඵලදායිතා ප්‍රවර්ධන කණ්ඩායම් පිහිටුවා, එයින් ඒ ඒ අංශවලින් තෝරා ගත් සාමාජිකයන්, ක්ෂේත්‍ර චාරිකා පුහුණු වැඩමුලු 3ක් හරහා පුහුණුව ලබාදෙන ලදී. තවද, මානව සම්පත් සංවර්ධන, මානව සම්පත් කළමනාකරණ. ආනයන, සේවා සැපයීම් සහ ගිණුම් යන අංශ නියාමන අංශ වශයෙන් තෝරා ගන්නා ලදී.

# පළාත් පරිෂදය

## හැදින්වීම


ආදායම් හා සේවා කොට්ඨාශ අංශය විසින් ගාල්ල, යාපනය, ත්‍රිකුණාමලය සහ මාගම්පුර යන පිට පළාත් තොටුපලවල්හි සියලුම රේගු අනුබද්ධිත කාර්යයන් සිදු කරයි. එමෙන්ම භාණ්ඩ, මගීන්ගේ භාණ්ඩ සහ තැපැල් පාර්සල් නිශ්කාශනය සහ රජය විසින් ලැබිය යුතු ආදායම් ලැබෙන බව සහතික කරයි. රේගු දෙපාර්තමෙන්තුව විසින් එහි නවතම කාර්යාලය මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ දී 2012 ජුනි මස 05 වන දින විවෘත කරන ලදී. එමගින් ආනයන භාණ්ඩ සහ නැව් මාරු භාණ්ඩ මෝටර් වාහන නිශ්කාශනය සිදු කරයි.

**ප්‍රධාන කාර්යයන්**

1. ආනයන සහ අපනයන ආදායම් එකතු කිරීම
2. රටේ සමාජ/ආර්ථික ආරක්ෂාව තහවුරු කිරිම සඳහා සීමා පාලනය පවත්වා ගැනීම
3. ආනයන සහ අපනයන භාණ්ඩ පරීක්ෂාව හා මුදා හැරීම
4. ප්‍රාදේශීය මට්ටමින් මගී භාණ්ඩ සහ තැපැල් පාර්සල් නිශ්කාශනය සහ පහසුකම් සැලසීම

## එකතු කරන ලද ආදායම්

| පළාත | තීරුබදු සහ අනෙකුත් බදු වර්ග | අනෙකුත් ගාස්තු | එකතුව |
|---|---|---|---|
| ගාල්ල | 19,402,229 | 23633846 | 43036075 |
| හම්බන්තොට | 4,215,204 | 4816455.5 | 9031659 |
| ත්‍රිකුණාමලය | 1,787,508 | 14579559.32 | 16367067 |
| යාපනය | 2,506,558 | 1073922 | 3580480 |
| | **27,911,499** | **44,103,783** | **72,015,282** |



# මගී සේවා (කොට්ඨාශ අංශය)

හැඳින්වීම

මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපළ 2013 මාර්තු 15දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. මෙම ගුවන් තොටුපළ හම්බන්තොට ස්ථාන ගත කිරීමෙහි ප්‍රධාන අරමුණ වන්නේ දකුණු පළාත් සංවර්ධනයේ කොටසක් වශයෙන් ප්‍රෙද්ශයේ ජනතාවගේ ශුභ සිද්ධිය හා ජීවන රටාව නගා සිටුවීමට සහ කටුනායක අන්තර්ජාතික ගුවන් තොටුපළට විකල්පයක් වශයෙනි. වර්තමානයේ සීමිත ගුවන් වාර ප්‍රමාණයක් ක්‍රියාත්මක වුවද, අනාගතයේ දී එම ප්‍රමාණය වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ.
රජයේ කාර්යාංශයක් වශයෙන්, අපගේ වගකීම විය යුත්තේ **(MRIA)** හි ප්‍රතිරූපය උසස් කරලීමයි. ඒ සඳහා ඉක්මනින් හා ආචාරශීලී ආකාරයට මගී භාණ්ඩ නිශ්කාශනය කරන අතරම රේගු රෙගුලාසි හා අනෙකුත් නීති රජයට අයවිය යුතු ආදායම් ලබා ගත හැකි වන අයුරින් ක්‍රියාත්මක කළ යුතුය.

කාර්යය සාධනය

**1)** ගුවන් වාර සහ මගීන්ගේ පැමිණීම/පිටවීම

| විස්තරය | පැමිණීම | පිටවීම |
|---|---|---|
| | | |
| ගුවන් වාර සංඛ්‍යාව | 765 | 765 |
| මගීන් සංඛ්‍යාව | 20541 | 21327 |

**2)** අනාවරණ කිරීම් සංඛ්‍යාව– **01**

**3)** අනාවරණය වූ නීති උල්ලංඝනය වීම් සංඛ්‍යාව **- 07**

**4)** අයකර ගැනීම්

| විස්තරය | ප්‍රමාණය (රු.) |
|---|---|
| දඩමුදල් | 123,42,757.00 |
| රේගු බදු | 39,10,502.00 |
| PAL | 13,65,235.00 |
| VAT | 45,46,105.00 |
| NBT | 8,54,837.00 |
| SRL | 250.00 |

**සේවා නිලධාරීන් වෙන් කිරීම්**

අධ්‍යක්ෂ යටතේ (මගී සේවා කොට්ඨාශ) ලයිස්තු ගත කළ ඇමුණුම 01 හි සිටින නිලධාරීන් යම් කිසි කාලයක් සඳහා ස්ථිර පදනමක් යටතේ මාරු කළ හැකිය.

**කාර්ය සාධනය සඳහා ලබා දෙන පහසුකම්**
නිලධාරීන්ගේ නවාතැන් සඳහා නිවාස දෙකක් සහ ප්‍රවාහන කටයුතු සඳහා වාහන දෙකක් සපයා ඇත. නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ සඳහා අන්තර්ජාල පහසුකම් සපයා ඇත.

**සටහන්**

**ගුවන් තොටුපළ තුළ රේගු නිලධාරීන් සඳහා ඇත්තේ කාමර තුනක් පමණි. එනම්, නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ, රේගු අධිකාරීවරුන් සහ සේවා නිලධාරීන් සඳහාය.**

සහකාර ශාස්තු නිලධාරී සඳහා කාමරයක් නොමැති අතර, ඔවුන් දැනට සිටින්නේ රේගු අධිකාරීවරයාගේ කාමරයෙහිය. සේවා නිලධාරීන් හෝ කිසිදු නිලධාරියෙකුට විවේකාගාර පහසුකම් සපයා නැත. ඉඩ පහසුකම් නොමැතිකම පමණක් වීම මෙම ඉඩ පහසුකම් නොමැති වීමට හේතුව විය හැකිය.

එම නිසා දෙවන අදියර ආරම්භ කළ විට ප්‍රමාණවත් ඉඩ පහසුකම් ලබා දෙන්නේ නම් ඵලදායීතාවය වැඩි වනු නොඅනුමානය.

# රේගු අධ්‍යක්ෂ ජනරාල් යටතේ පවතින අංශ

# පද්ධති හා ක්‍රියාපරිපාටි අනුකූලතා විගණන අංශය

## හැඳින්වීම

පද්ධති හා ක්‍රියාපරිපාටි අනුකූලතා විගණන අංශය කෙළින්ම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ ක්‍රියාත්මක වේ. එයට ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ 1 වන පන්තියේ නිලධාරියකු විසින් නායකත්වය දෙනු ලබයි. මෙම නව අංශය ආරම්භ කිරීමේ අපේක්ෂාවක් වූයේ ක්‍රියාකාරී කළමනාකරණයට දායක වීමයි. එහිදී නීත්‍යානුකූල නොවන ාකර්යයන් සිදු වීම වැළැක්වීමත්, අවංකත්වයේ සිදු වන අඩාපාඩු වැළැක්වීමෙහි ක්‍රමානුකූල වර්ධනයක් මගින් ක්‍රියාකාරී කළමනාකරණයට දායක වීම අපේක්ෂා කරන ලදී. එමෙන්ම ඇති වන අවදානම් තත්ත්වයන්ට අනුරූපීව අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වාගෙන යාම හා වැඩි දියුණු කිරීම ද අපේක්ෂා කරන ලදී. දෙපාර්තමේන්තුව තුළ සියලුම අංශයන් තුළ පවත්නා ප්‍රධාන ක්‍රියාවලීන් හා සහාය ක්‍රියාවලීන්හිදී සම්පත් යොදා ගැනීමේ අරපිරිමැසුම් බව හා සඵලතාව තක්සේරු කිරීම සඳහා විගණන සිදු කිරීම මෙම අංශයේ ප්‍රධාන විෂය පථය වේ.

ප්‍රධාන කාර්යයන්

1. හැකි සෑම අවස්ථාවකදීම විගණනයෙන් සිදු වන සේවය ප්‍රවර්ධනය කරමින්, එමගින් ආයතනයට වටිනාකමක් ඇති බව සනාථ කිරීම සඳහා ඵලදායී ලෙස අභ්‍යන්තර විගණන කාර්යය කළමනාකරණය කිරීම.
2. පහත සඳහන් කරුණු ද ඇතුළුව ආයතනයේ පාලන මෙහෙයුම් හා තොරතුරු පද්ධතියට අදාළව ඒවායේ ප්‍රමාණාත්මක බව හා සඵලතාවය ඇගයීමට ලක් කිරීම ;
   - අ. මූල්‍ය හා මෙහෙයුම් තොරතුරුවල විශ්වාසනීයත්වය
   - ආ. මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය හා සඵලත්වය
   - ඇ. වත්කම් ආරක්ෂා කිරීම.
   - ඈ. නීති, රෙගුලාසි හා ගිවිසුම්වලට අනුගත වන බව
3. ආදායම් කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා වන අවදානම් තක්සේරුවමත පදනම්ව විගණන සැළසුම් සකස් කිරීම් හා ආයතනයේ මෙහෙයුම් වැඩි දියුණු කිරීම.
4. හෙළිවන්නා වූ වැදගත් අවදානම් අවස්ථා සහ පාලන ගැටළු හා අනෙකුත් අවශ්‍ය කරුණු පිළිබඳව වාර්තා කිරීම හෝ ඉහළ කළමනාකරණය විසින් ඒවා ඉල්ලා සිටි විට ලබා දීම.
5. දැනට ක්‍රියාත්මක මෙහෙයුම් හා වැඩසටහන් හෝ ඒවායින් ලද ප්‍රතිඵල කෙතරම් දුරට ඉලක්ක හා අරමුණු හා කෙතරම් දුරට අනුකූලදැයි බැලීම සඳහා මෙහෙයුම් හා වැඩසටහන් සමාලෝචනය කිරීම.
6. පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීමෙහිලා පාලන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා එය තක්සේරු කොට සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කිරීම
7. ආයතනය තුළ සුදුසු චර්යාධර්ම හා වටිනාකම් ප්‍රවර්ධනය කිරීම.
8. ඵලදායී ආයතනික කාර්ය සාධනය කළමනාකරණය හා වගකීම සහතික කිරීම

## කාර්ය සාධනය

පද්ධති හා ක්‍රියාපටිපාටි අනුකූලතා විගණන අංශය 2013 වර්ෂයේ දී විගණන 72 ක් සිදු කර ඇති අතර, ඉන් විගණන 68 ක් සම්පූර්ණ කර ඇත.

# මූල්‍ය අංශය

හැඳින්වීම

රේගු දෙපාර්තමේන්තුව දිවයිනේ බදු ආදායම් එකතු කිරීමේ ප්‍රධානතම දෙපාර්තමේන්තුවයි. පාර්ලිමේන්තුවේ සම්මත වන වාර්ෂික ඇස්තමේන්තුවෙන් වාර්ෂිකව බදු ආදායම් එකතු විය යුතු ඉලක්කයන් රේගු දෙපාර්තමේන්තුවට ලබා දී ඇත.

මෙම අරමුණ සාක්ශාත් කර ගැනීමට රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහාය දීමක් වශයෙන් පහත සඳහන් කාර්යයන් ඉටු කර ලීමෙන් මූල්‍ය අංශය වැදගත් මෙහෙවරක් ඉටු කරයි.

**ප්‍රධාන කාර්යයන්**

1. වාර්ෂික අයවැයට අදාළව වියදම් හා බදු ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම
2. බදු ආදායම් හා වියදම් එකතු කිරීම, සටහන් කිරීම හා වාර්තා කිරීම
3. වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදනයන්ට අනුව වියදම කළමනාකරණය කිරීම
4. අවශ්‍ය වූ විටෙක භාණ්ඩාගාරයට, විගණකාධිපති හා අනෙකුත් බලධාරීන්ට වියදම් හා මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම
5. තැන්පතු ගිණුම රඳවා ගත් හා රාජසන්තක කළ භාණ්ඩ ගිණුම සහ පොදු නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පරිපාලනය .
6. වාර්ෂික විසර්ජන ගිණුම, ආදායම් ගිණුම, රඳවා ගත් හා රාජසන්තක කළ භාණ්ඩ ගිණුම, පොදු නිලධාරීන්ගේ අත්තිකාරම ගිණුම පිළියෙල කිරීම ඉදිරිපත් කිරීම.

ඉහත සඳහන් කල කාර්යයන් සිදු කරන්නේ මූල්‍ය අධ්‍යක්ෂ යටතේ ඇති මූල්‍ය අංශයෙනි. ඒ සඳහා පහත දැක්වෙන අංශ ස්ථාපිත කර ඇත්තේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් 04 දෙනෙකු යටතේ සහ කළමනාකරණ සහකාරවරුන් 100 දෙනෙකු හා සරප්වරයෙක් යටතේය.

- ආදායම් අංශය.
- ගාස්තු අංශය.
- වැටුප් හා විශ්‍රාම වැටුප් අංශය.
- අතිකාල ගෙවීම් අංශය.
- තැන්පතු ගිණුම සහ අරමුදල් ගිණුම කළමනාකරණ අංශය.

දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලිය මූල්‍ය අධ්‍යක්ෂතුමා විසින් සුපරීක්ෂණය, සමායෝජනය හා පරිපාලනය සිදු කරන අතරම ඔහු සේවක සහතික නිකුත් කිරීම සහ බැංකු සහතික නිකුත් කිරීම හා සොයා බැලීම අදායම් බදු ගණනය කිරීම, අයකර ගැනීම, මූල්‍ය අංශයේ සේවකයන් සඳහා බලපාන සාමාන්‍ය පරිපාලන ගැටළු සඳහා මානව සම්පත් අංශයට සහාය දීම සඳහා වගකිව යුතු වේ.

වගුව **1:** බැංකු සහතික සහ ආදායම් බදු ගෙවීම් විස්තරය

| | **2012** | | **2013** | |
|---|---|---|---|---|
| **විස්තරය** | **සමාගම් සංඛ්‍යාව** | **මුදල (රු. මිළි)** | **සමාගම් සංඛ්‍යාව** | **මුදල (රු. මිළි)** |
| **නිකුත් කරන ලද බැංකු සහතික** | 86 | 289 | 88 | 396.45 |
| | 2012.04.01 සිට 2013.03.31 දක්වා (බදු වර්ෂය) | | | |
| **විස්තරය** | **සේවක සංඛ්‍යාව 2012.04.01** | **මුදල (රු. මිළි) 2013.03.31** | **සේවක සංඛ්‍යාව 2013.04.01** | **මුදල 2014.03.31** |
| **ගෙවීම් බදු** | 2866 | 23,110 | 2534 | 40,218 |

## ආදායම් අංශය

ආදායම් අංශය විසින් එකතු කිරීම, මධ්‍යස්ථාන 41ක් යටතේ උප එකතු කිරීම් බැංකු ගිණුම් 11කින් සම්බන්ධව ප්‍රධාන ආදායම් ගිණුම නඩත්තු කිරීමේ වගකීම ලංකා බැංකුව, තැප්‍රොබේන් ශාඛාව මගින් සිදු කරනු ලබයි. තවද දිනපතා එකතුවන ආදායම භාණ්ඩාගාරයේ උපලේකම් වරයාගේ ගිණුමට බැර කරයි. මෙමගින් අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවල හා අනෙකුත් රාජ්‍ය සංවිධාන සඳහා අරමුදල් නිකුත් කෙරේ.

වගුව **2:** ශ්‍රී ලංකා රේගුවේ ආදායම් ඉලක්කය හා එකතු කිරීම - 2012/2013

රු. මිලියන

| ආදායම් ශීර්ෂය | විස්තරය | 2012 | | 2013 | |
|---|---|---|---|---|---|
| | | ඉලක්කය | එකතු කරන ලද | ඉලක්කය | එකතු කරන ලද |
| 1001.01.00 | ආනයන බදු | 76,830 | 73,489 | 82,591 | 74,766 |
| 1001.02.00 | අපනයන බදු | 20 | 21 | 20 | 22 |
| 1001.04.00 | වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු (PAL) | 75,211 | 70,111 | 61,004 | 61,516 |
| 1001.05.01 | සෙස් බදු - අපනයන | 29,287 | 29,604 | 37,362 | 33,011 |
| 1001.06.00 | මෝටර් වාහන සහන බද්ද | - | - | - | - |
| 1001.07.00 | ප්‍රාදේශීය යටිතල සංවර්ධන බද්ද | - | 7 | - | 1 |
| 1001.05.02 | සෙස් බදු - අපනයන | 3,120 | 3,136 | 3,120 | 3,087 |
| 1001.08.00 | විශේෂ වෙළඳ බද්ද | 36,608 | 33,666 | 50,106 | 46,705 |
| | **මුළු රේගු බදු ආදායම** | **221,076** | **210,034** | **234,203** | **219,108** |
| 1002.05.01 | නිෂ්පාදන බදු - සිගරට් | 54,924 | 53,529 | 58,222 | 58,534 |
| 1002.05.02 | නිෂ්පාදන බදු - මත්පැන් | - | 39 | - | 0 |
| 1002.05.03 | නිෂ්පාදන බදු - පෙට්‍රෝලියම් | **23,000** | **28,466** | **35,849** | **27,131** |
| | *නිෂ්පාදන බදු - පෙට්‍රෝලියම් (ආනයන)* | *20,000* | *27,837* | *32,753* | *27,131* |
| | *නිෂ්පාදන බදු - පෙට්‍රෝලියම් (දේශීය)* | *3,000* | *629* | *3,096* | - |
| 1002.05.04 | නිෂ්පාදන බදු - මෝටර් රථවාහන | 57,510 | 46,496 | 71,906 | 55,517 |
| 1002.05.99 | නිෂ්පාදන බදු - අනෙකුත් | **5,132** | **3,336** | **5,347** | **2,528** |
| | *නිෂ්පාදන බදු - අනෙකුත් (ආනයන)* | *3,632* | *2,533* | *1,477* | *1,248* |
| | *නිෂ්පාදන බදු - අනෙකුත් (දේශීය)* | *1,500* | *803* | *3,870* | *1,279* |
| | **මුළු නිෂ්පාදන බදු ආදායම** | **140,566** | **131,866** | **171,325** | **143,710** |
| 1002.01.04 | එකතු කළ අගය මත බද්ද (ආනයන) | 109,487 | 99,469 | 123,888 | 96,591 |
| 1003.10.00 | **සමාජ වගකීම් බද්ද** | - | 1 | - | - |
| | ***සමාජ වගකීම් බද්ද (SRL) - ආනයන*** | | *1* | | 0 |
| | ***සමාජ වගකීම් බද්ද (SRL) - දේශීය*** | - | - | - | 0 |
| 1002.12.03 | ජාතිය ගොඩනැගීමේ බද්ද | 18,823 | 15,667 | 19,721 | 22,443 |
| | **මුළු අනෙකුත් බදු ආදායම** | 128,310 | 115,138 | 143,609 | 119,035 |
| | මුළු බදු ආදායම | 489,952 | 457,037 | 549,136 | 481,852 |
| 2003.02.17 | ඇහලුම් විකිණීම | 100 | 105 | 95 | 92 |
| 2003.02.99 | විවධ | | | | |
| 2003.99.00 | | 15,700 | 5,042 | 859 | 2,142 |
| 2003.03.00 | | | | | |
| | **මුළු බදු නොවන ආදායම** | **15,800** | **5,147** | **954** | **2,234** |
| | මුළු ආදායම **(**බදු සහ බදුනොවන) | **505,752** | **462,184** | **550,090** | **484,086** |
| | ශුද්ධ තැන්පත් | | 1,774 | | 1,231 |
| **තැන්පත් සමඟ මුළු ආදායම** | | **505,752** | **463,958** | **550,090** | **485,317** |

සටහන : භාණ්ඩාගාර ගිණුම සමග සසඳන ලද දත්ත

## ගෙවීම් අංශය

වාර්ෂික වියදම් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන යටතේ සියළු ගෙවීම් සිදු කිරීම, පොදු සේවකයින්ගේ අත්තිකාරම් ගිණුම යටතේ ඇති ගෙවීම් සහ අරමුදල් ගිණුම යටතේ ඇති ගෙවීම් සිදු කිරීම ගෙවීම් අංශය මගින් සිදු කරයි.

වගුව **3: 2012** හා **2013** වර්ෂවල වියදම් සැසඳීම

| විස්තරය | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව (රු.මිලි) | ඉලක්කය (රු.මිලි) | ඇස්තමේන්තුව (රු.මිලි) | ඉලක්කය (රු.මිලි) |
| පුනරාවර්තන | 1,393 | 1,392 | 1,497 | 1,495 |
| ප්‍රාග්ධනය | 903 | 903 | 776 | 776 |
| | **2012** | | **2013** | |
| අත්තිකාරම් **B** ගිණුම | සේවක සංඛ්‍යාව | මුදල (රු.මිලි) | සේවක සංඛ්‍යාව | මුදල (රු.මිලි) |
| උත්සව අත්තිකාරම් | 360 | 1.8 | 341 | 1.7 |
| ආපදා ණය | 474 | 37.76 | 402 | 27 |
| විශේෂ හා පාපැදි ණය | 35 | 0.10 | 15 | 0.3 |

## වැටුප් සහ විශ්‍රාම වැටුප් ගෙවීම් අංශය

**වැටුප් ගෙවීම හා විශ්‍රාම වැටුප් ගෙවීම වැටුප් හා විශ්‍රාම වැටුප් අංශය මගින් සිදු කරයි.**

වගුව **4: 2012** හා **2013** වර්ෂවල වැටුප් හා විශ්‍රාම වැටුප් ගෙවීම සැසඳීම

| විස්තරය | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | සේවක සංඛ්‍යාව | මුදල (රු.මිලි) | සේවක සංඛ්‍යාව | මුදල (රු.මිලි)) |
| මුළු වැටුප් හා ගෙවීම් | 2,092 | 757.2 | 2058 | 784.30 |
| මුළු විශ්‍රාම වැටුප් | 224 | 35.54 | 95 | 28.0 |

## අතිකාල ගෙවීම් අංශය

සාමාන්‍ය රාජකාරි වේලාවෙන් පසුව දෙපාර්තමේන්තු සේවා ඉල්ලා සිටින සේවාදායකයන්ගෙන් අතිකාල ගෙවීම් එකතු කර ගැනීම සහ රේගු අතිකාල අරමුණ යටතේ දෙපාර්තමේන්තු සේවකයන් සඳහා අතිකාල ගෙවීම් සිදු කිරීම අතිකාල ගෙවීමේ අංශයෙන් සිදු කරයි.

**තවද මෙම අංශය මගින් පහත සඳහන් අරමුදල් ගිණුම් වලට අදාළව වාර්ෂික ඇස්තමේන්තු හා අවසන් ගිණුම් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සිදු කරයි**

1. **රේගු අතිකාල අරමුදල් ගිණුම**
2. **භාණ්ඩ පිරික්සුම් ගාස්තු අරමුදල් ගිණුම**

වගුව **5: 2012** හා **2013** රේගු අතිකාල දීමනා අරමුදල් ගාස්තු අරමුදල සැසඳීම

| විස්තරය | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | ලැබීම් (රු. මිලියන) | ගෙවීම් (රු.මිලි) | ලැබීම් (රු. මිලියන) | ගෙවීම් (රු.මිලි) |
| මුළු අතිකාල ගෙවීම | 583 | 431 | 578 | 591 |
| භාණ්ඩ පිරික්සුම් ගාස්තු අරමුදල | 201 | 162 | 229 | 184 |

## තැන්පතු ගිණුම් සහ අරමුදල් ගිණුම් කළමනාකරණ අංශය

ලැබීම් වාර්තා කිරීම, ගෙවීම් වවුචර් සහතික කිරීම, ගෙවීම් වාර්තා කිරීම පහත සඳහන් අරමුදල් ගිණුම් වලට රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති වලට අදාළව වාර්ෂික ඇස්තමේන්තුව පිළියෙල කිරීම සහ වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම, මෙම අංශය මගින් සිදු කෙරේ.

1. තැන්පතු ගිණුම (මණ්ඩල ගෙවීම, බැංකු සහතික සහ වෙනත්)
2. රඳවාගත් හා රාජසන්තක කළ භාණ්ඩ සහ අත්තිකාරම් ගිණුම .

වගුව **6: 2011** හා **2012** වසරවල තැන්පතු ගිණුම් හා අරමුදල් ගිණුමවල කාර්ය සාධනය සැසඳීම.

| විස්තරය | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | ලැබීම් ප්‍රමාණය (රු. මිලියන) | ගෙවීම් ප්‍රමාණය (රු.මිලි) | ලැබීම් ප්‍රමාණය (රු. මිලියන) | ගෙවීම් ප්‍රමාණය (රු.මිලි) |
| රඳවාගත් හා රාජසන්තක කළ භාණ්ඩ අත්තිකාරම් ගිණුම් | 2.5 | 3.4 | 2.89 | 8.18 |

### වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම

පහත සඳහන් වාර්ෂික ගිණුම් විගණකාධිපති ජනරාල්වරයාට හා භාණ්ඩාගාරයට 2014.03.31 දිනට පෙර ඉදිරිපත් කිරීම මූල්‍ය අංශය මගින් සිදු කරයි.

- වාර්ෂික විසර්ජන ගිණුම
- වාර්ෂික ආදායම් ගිණුම
- රඳවාගත් හා රාජසන්තක කළ භාණ්ඩ සහ අත්තිකාරම් ගිණුම් සහ මූල්‍ය අංශයට අදාළ අතිරේක වගකීම් පරිච්ඡේදයේ සඳහන් වන අනිකුත් අරමුදල් ගිණුම් .

## මූල්‍ය අංශයට පැවරී ඇති අතිරේක වගකීම්

රේගු ආඥාපනත යටතේ වගකීම හා අරමුදල් ගිණුම් ස්ථාපනය පැවරී ඇත්තේ මූල්‍ය අංශයට වන අතර ඒවා පහත පරිදි වේ.

1. පහත සඳහන් අරමුදල් ගිණුම් කළමනාකරණය කිරීම .

    - රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල
    - රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සහ අනුපූරණ අරමුදල

2. ලැබීම් වාර්තා කිරීම, ගෙවීම් වවුචර් සහතික කිරීම, ගෙවීම වාර්තා කිරීම, ඉහත සඳහන් අරමුදල් ගිණුම් වල වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීම.

**වගුව 7: 2012 හා 2013 වර්ෂවල අත්තිකාරම් අරමුදල් ගිණුම්වල කාර්යසාධනය සැසඳීම.**

| විස්තරය | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | ලැබීම් ප්‍රමාණය (රු. මිලියන) | ගෙවීම් ප්‍රමාණය (රු. මිලියන ) | ලැබීම් ප්‍රමාණය (රු. මිලියන) | ගෙවීම් ප්‍රමාණය (රු. මිලියන ) |
| රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල | 973.2 | 925.6 | 1,505.2 | 1,362.8 |
| රේගු නිලධාරීන්ගේ කළමනාකරණ අනුපූරණ ගිණුම | 362 | 97 | 583.7 | 114.8 |

# විශේෂ කාර්ය හා සුපරීක්ෂණ අංශය

## හැඳින්වීම

මෙම අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට පාලනයට සහාය වීම සහ දෙපාර්තමේන්තුවේ සෑම කටයුත්තකදීම සුපරීක්ෂාකාරීවීමයි. මෙම අංශය විවිධ බලාත්මක කාර්යයන් සේවකයන්ගෙන් ලබාගත් දැනුම සහ මහජනයාගෙන් ලබාගත් තොරතුරු මත සිදු කරයි.


සුපරීක්ෂාකාරී බව පවත්වා ගැනීම පාර්සල් තැපැල් භාණ්ඩ නිශ්කාශනයේ දී වැදගත් වේ.

**ප්‍රධාන කාර්යයන්**

1. දෙපාර්තමේන්තුව තුළ අඛණ්ඩත්වය පවත්වා ගැනීම හා අක්‍රමිකතා දුරු කරලීම
2. පැමිණිලි හා චෝදනාවල දී ඉක්මණින් ප්‍රතිචාර දැක්වීම
3. සම්පත් පාවිච්චියට ගැනීම තුළින් අර්බුද අවස්ථාවල දී රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහාය වීම.
4. ආනයන/අපනයන භාණ්ඩ මගදී අල්ලා ගැනීම හා නැවත සමීක්ෂණය හයා ක්‍රියාවට නැංවූ ක්‍රියාපටිපාටියේ හරි වැරදි බව.
5. ගුවන් තොටුපලේ UPB ගුදම්වල මගීන් හා මගී භාණ්ඩ පරීක්ෂා කිරිම.
6. පාර්සල් තැපැලේ කූරියර් සේවා හා භාණ්ඩ මුදාහැරීමේ විශේෂ ක්‍රියා පටිපාටිවලදී සුපරීක්ෂා බව පවත්වා ගැනීම.

**2009, 2010, 2011, 2012** සහ **2013** වර්ෂවල මුළු වැටලීම් සිද්ධි සංඛ්‍යාව

| | 2009 (රු.) | 2010 (රු.) | 2011 (රු.) | 2012 (රු.) | 2013 (රු.) |
|---|---|---|---|---|---|
| දණ්ඩන, අතිරේක බදු සහ අනිකුත් බදු | 354,417,921 | 392,152,071 | 671,474,362 | 407,821,431 | 535,522,655 |
| අලෙවි ආදායම | 70,179,646 | 39,451,881 | 58,642,363 | 91,004,686 | 116,906,090 |
| මුළු අයකර ගැනීම් | 424,597,567 | 431,603,952 | 730,116,725 | 498,826,117 | 652,428,745 |




| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| වාණිජ ආනයන (මුහුදු ප්‍රවාහන හා ගුවන් ප්‍රවාහන) - FCL & LCL | 827 | 1,114 | 1,196 | 1,235 | 1,847 |
| මගීන් කැටුව නොඑන ගමන් බඩු (UPB) | 622 | 978 | 991 | 1,058 | 1,020 |
| මගීන් රැගෙන එන භාණ්ඩ (බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල ) | 1,000 | 24 | 70 | 40 | 0 |
| මගීන් රැගෙන එන භාණ්ඩ (බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල ) | 2,449 | 2,116 | 2,257 | 2,333 | 2,867 |

# සුරාබදු අංශය (විශේෂ නියෝග)

## හැඳින්වීම

1994 අංක 08 දරණ හා 1990 අංක 40 දරණ පනත් යටතේ සංශෝධනයන්ට ලක් වූ 1989 අංක 13 දරණ සුරාබදු පනත (විශේෂ නියෝග) ශ්‍රී ලංකා රජයේ සුරාබදු පිළිවෙත් ක්‍රියාවට නැංවෙන ප්‍රධාන නෛතික මූලාශ්‍රයයි.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන සුරාබදු (විශේෂ නියෝග) අංශය මුදල් අමාත්‍යාංශය යටතේ පවතී. වඩාත් යහපත් ජාතියක් සඳහා වගකීමක් සහිතව සුරාබදු නියෝග පනත් සහ නීති ක්‍රියාත්මක කරන රජයේ නියෝජිත ආයතනයක් වශයෙන් සුරාබදු අංශය වැදගත් ජාතික මෙහෙවරක් සිදු කරයි.

**ප්‍රධාන කාර්යයන්**

1. නිවැරදි සුපරීක්ෂණයෙන් ආදායම් එකතු කිරීම, සිගරට් පාලනය හා අනෙකුත් නිෂ්පාදන ආයතන පාලනය කිරීම.
2. සුරාබදු පනත (විශේෂ නියෝග) යටතේ නීතිය බලාත්මක කිරීම හා එමගින් ආනයනික හා දේශීය මත් නිෂ්පාදනය කිරීම අදාළ සුරාබදු එකතු කිරීම.
3. පනවන ලද සුරාබදුවලට අදාළ ක්‍රියාදාමයන්හි නිරත වීම.

## මෙහෙවර හා අරමුණු

සුරාබදු අංශයේ විශේෂ නියෝග මෙහෙවර වන්නේ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදිත හා ආනයනික ද්‍රව්‍යයන්ට අදාළ සුරාබදු ආදායම් කාර්යක්ෂම ලෙස එකතු කිරීම හා එමඟින් ජාතික සංවර්ධන කාර්යයට දායක වීමයි

සුරාබදු අංශයේ (විශේෂ බලපත්‍ර) අරමුණු පහත දැක්වෙන අයුරින් පුළුල් ලෙස හඳුනා ගත හැක:-

A. 1989 අංක 13 දරණ සුරාබදු පනත (විශේෂ බලපත්‍ර) ක්‍රියාත්මක කිරීම.
පෙට්‍රෝලියම්, L.P. ගෑස්, සිගරට්, සිසිල් බීම, රේස් ප්‍රකාශන, වාහන ආනයන, රටතුළ එකලස් කරන ලද වාහන, තීන්ත, පොලිතීන්, පොලිතීන් හා අනෙකුත් මත්වන සුළු ද්‍රව්‍ය යටතේ වන ද්‍රව්‍යයන්ගෙන් ආදායම් එකතු කිරීම හා සුරක්ෂිත කිරීම.

## පද්ධතීන් හා ක්‍රියාපටිපාටි

මෙම අංශයේ ආරම්භයත් සමඟින් පනත යටතේ ඇති රෙගුලාසි හා ආඥා ශ්‍රේණියකින් සමන්විත ගැසට් නිවේදන කාලයෙන් කාලයට නිකුත් කරන ලදී. ඉහත සඳහන් රෙගුලාසි හා ආඥා වලට අදාළව සුරාබදු ව්‍යුහය ක්‍රියාත්මක කරන ලදී.

## පසුගිය වසර දෙක තුළ වූ ප්‍රධාන වෙනස්කම්

1. H.S.Code 32.08, 32.09,හා 32.10 යන ශීර්ෂ වලට අදාළ තීන්ත හා වාර්නිෂ් 2010 ජූනි 01 දින සිට තීරුබදු වලින් නිදහස් කරන ලදී.
2. H.S.Code 39.23 යන ශීර්ෂ අංකය දරණ පොලිතීන් බෑග් 2010 නොවැම්බර් 23 වන දින සිට තීරුබදු වලින් නිදහස් කරන ලදී.
3. 2010 නොවැම්බර් 23 දින සිට H.S.Code 39.01 ශීර්ෂය දරණ ප්‍රාථමික තත්ත්වයෙන් පවතින එතලීන් සහ පොලිතීන්වලට සුරාබදු පැනවීමක් සිදු කරන ලදී

2009 වසරට අදාළ මත්වන ද්‍රව්‍ය හා එකතු කළ ආදායම් (දේශීය)

| | රු. මිලියන |
|---|---|
| සිගරට් | 37,670.16 |
| **පෙට්‍රෝලියම්** | 7,854.18 |
| මෝටර් වාහන (දේශීයව සකසන ලද) | 0.11 |
| සිසිල් බීම | 750.31 |
| රේස් ප්‍රකාශන | 9.14 |
| විදුලි අයිතම (දේශීය) අනෙකුත් | 171.16 |

| | |
|---|---|
| විදුලි අයිතම ගෙවීම (රේගු සටහන්කර) | - |
| මත්පැන් බදු | - |
| සමාජ ආරක්ෂණ බද්ද (දේශීය) | 710.70 |
| තීන්ත හා පොලිතීන් | 277.49 |
| උසාවි නඩු | 27.29 |
| L.P. ගෑස් | 526.34 |
| **එකතුව** | **47,996.88** |

2010 වසරට අදාළ මත්වන ද්‍රව්‍ය හා එකතු කළ ආදායම් (දේශීය)

| | රු. මිලියන |
|---|---|
| සිගරැට් | 42,132.32 |
| **පෙට්‍රෝලියම්** | 5,649.66 |
| මෝටර් වාහන (දේශීයව සකසන ලද) | 1.57 |
| සිසිල් බීම | 949.56 |
| රේස් ප්‍රකාශන | 9.31 |
| විදුලි අයිතම (දේශීය) අනෙකුත් | 284.68 |
| විදුලි අයිතම ගෙවීම (රේගු සටහන්කර) | - |
| මත්පැන් බදු | - |
| සමාජ ආරක්ෂණ බද්ද (දේශීය) | 564.33 |
| L.P. ගෑස් | 1.65 |
| **එකතුව** | **49,608.29** |

2011 වසරට අදාළ මත්වන ද්‍රව්‍ය හා එකතු කළ ආදායම් (දේශීය)

| | රු. මිලියන |
|---|---|
| සිගරැට් | 49,925.30 |
| **පෙට්‍රෝලියම්** | 7,163.20 |
| මෝටර් වාහන (දේශීයව සකසන ලද) | 21.60 |
| සිසිල් බීම | 1345.90 |
| රේස් ප්‍රකාශන | 9.40 |
| විදුලි අයිතම (දේශීය) අනෙකුත් | 166.00 |
| විදුලි අයිතම ගෙවීම (රේගු සටහන්කර) | |
| මත්පැන් බදු | |
| සමාජ ආරක්ෂණ බද්ද (දේශීය) | |
| තීන්ත හා පොලිතීන් | |
| උසාවි නඩු | |
| L.P. ගෑස් | |
| **එකතුව** | **58,631.40** |
| | |

2012 වසරට අදාළ මත්වන ද්‍රව්‍ය හා එකතු කළ ආදායම් (දේශීය)

| | රු. මිලියන |
|---|---|
| සිගරට් | 54,241.38 |
| **පෙට්‍රෝලියම්** | 6,900.63 |
| මෝටර් වාහන (දේශීයව සකසන ලද) | 56.9 |
| සිසිල් බීම | 1,668.77 |
| රේස් ප්‍රකාශන | 9.49 |
| විදුලි අයිතම (දේශීය) අනෙකුත් | 133.54 |
| **එකතුව** | **63,010.74** |

## 2013 වර්ෂය තුළදී සිදු වූ වියදම්

2013 වසරට අදාළ මත්වන ද්‍රව්‍ය හා එකතු කළ ආදායම් (දේශීය)

| | රු. මිලියන |
|---|---|
| සිගරට් | 57,523.00 |
| **පෙට්‍රෝලියම්** | 4,850.59 |
| මෝටර් වාහන (දේශීයව සකසන ලද) | 6.94 |
| සිසිල් බීම | 2,020.00 |
| රේස් ප්‍රකාශන | 10.04 |
| විදුලි අයිතම (දේශීය) අනෙකුත් | 191.71 |
| **එකතුව** | **64, 603.74** |

*පවතින සුරාබදු මුදල (රු) 1,707,474,205.73 1,707,47

වෙන් වෙන් වියදම් පටිපාටියක් නොමැති අතර 2010 සිට සියළු මූල්‍ය ක්‍රියාවන් දෙපාර්තමේන්තු කැමැත්ත පරිදි සිදු කරන ලදී.

නෛතික ක්‍රියාකාරකම්

සුරාබදු පනත යටතේ සුරාබදු ගෙවීම අවධමනය කරන ආයතන වලට එරෙහිව දඩ මුදල් ලබාගැනීම සඳහා පියවර ගෙන ඇත. විස්තර පහතින් දක්වා ඇත.

| | |
|---|---|
| පෙනී සිට ඇති උසාවි සංඛ්‍යාව | 20 |
| ඉදිරියට ගෙන ගොස් ඇති නඩු සංඛ්‍යාව | 279 |
| වසර තුළදී සිදු කරන ලද නඩු පැවරීම් සංඛ්‍යාව | 1 |
| වසර තුළදී අවසානයට පත්වන නඩු සංඛ්‍යාව | 1 |
| වසර තුළදී එකතු කරගන්නා මුළු මුදල් ප්‍රමාණය රු.13,650,00 | (13.65මිලියන) |